# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

(2017 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

8 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .........................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| 8 ශ්‍රේණිය සිංහල  භාෂාව හා සාහිත්‍යය වාර නියමය | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix -xxxii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-83 |

# අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි. නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද සුභාවිතයන් මගින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් පෙපොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,

**විෂය විශේෂඥ උපදෙස් :** මහාචාර්ය රත්න විජේතුංග (සේවාර්ජිත)
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

මහාචාර්ය තිස්ස ජයවර්ධන (සේවාර්ජිත),
කොළඹ විශ්වවිද්‍යාලය.

**අධීක්ෂණය :** එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම,
අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,

**ලේඛක මණ්ඩලය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

පී. ඒ. ඩී. රුවනි සිසිජා, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**සංස්කාරක මණ්ඩලය :** එස්. ඕ. ප්‍රනාන්දු, අධ්‍යක්ෂ, (විශ්‍රාමික)
ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම, නියෝජ්‍ය අධ්‍යක්ෂ, (විශ්‍රාමික)
අධ්‍යාපන අමාත්‍යාංශය,

ඩබ්ලිව්. කරුණාරත්න, ගුරු මධ්‍යස්ථාන කළමනාකරු,
ගිරාගම

පුෂ්පා කළුආරච්චි, ගුරු උපදේශිකා,
කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර.

ඩබ්ලිව්. එම්. එන්. බණ්ඩාර, ගුරු සේවය I
ගම්පහ දොම්පේ මහා විද්‍යාලය.

**භාෂා සංස්කරණය :** ජාතික අධ්‍යාපන ආයතනය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අනුකූල ව පාඩම් සැලසුම් සකස් කර ගැනීමට කටයුතු කිරීම ඵලදායී වේ යැයි අපේක්ෂා කෙරේ.

දැනට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වනුයේ නිපුණතා පාදක විෂය මාලාවකි. මෙහි ඇතුළත් සියලු පාඩම් සැලසුම් ඉදිරිපත් කර ඇත්තේ ඊට අනුරූප වන පරිදි ය. නිපුණතාව, නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතයට අදාළ කාලච්ඡේද සංඛ්‍යාව හා ඉගෙනුම් පල ද ඒ අනුව ඇතුළත් කර තිබේ. පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ද භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් ද ඇගයීම හා තක්සේරුකරණය සඳහා වන උපදෙස් ද ඉදිරිපත් කර ඇත්තේ නිපුණතා සංවර්ධනයට ඉවහල් වන පරිද්දෙනි. ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය ඒ ඒ වාරවලට අනුව බෙදා දක්වන ලද සටහනක් ද මේ සමග ඉදිරිපත් කර ඇත්තේ ගුරු භවතාගේ පහසුව පිණිස ය.

මාර්ගෝපදේශයෙහි උපදෙස් අනුව එදිනෙදා ඉගැන්වීම් කාර්යයය සඳහා උචිත පාඩම් සැලසුම් ගුරුභවතාගේ අභිමතය පරිදි සකස් කර ගත යුතු ය. මෙහි දී ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය වන පරිදි හා නිපුණතා සාක්ෂාත් වන පරිදි නිර්මාණශීලී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථ සම්පන්න බවට පත් කිරීම ඔබගේ යුතුකම වන්නේ ය. ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුවරයාට පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති පොතපත ඉවහල් කර ගෙන ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් තව දුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වනු ඇත. මේ සඳහා ඔබට විවිධ ගුරු භූමිකා හෝ විවිධ ක්‍රමවේද හෝ භාවිත කළ හැකි ය. අර්ථසම්පන්න ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ නිර්මාණය කිරීම ඔබගේ කාර්යයයි.

ගුරු මාර්ගෝපදේශයෙහි එක ම නිපුණතා මට්ටමටම පාඩම් කිහිපයකට සම්බන්ධ වන අවස්ථා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී ඔබ ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් එම නිපුණතා මට්ටම ශිෂ්‍යයන්ට අත්පත් කර දීමට යොමු විය යුතු ය. මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පාසල් පාදක ඇගයීම කෙරෙහි ඔබගේ අවධානය යොමු විය යුතු ය. වාර නියමය දැක්වෙන වගුවෙන් එම ක්‍රියාකාරකම්වලට අදාළ වන පාඩම්වල සම්බන්ධය දක්වා ඇත. පාසල් පාදක ඇගයීම ක්‍රියාත්මක කිරීම සඳහා 2013 වර්ෂයේ දී ප්‍රකාශනය කරන ලද 'පාසල පදනම් කරගත් ඇගයීම් සඳහා නිදර්ශක ඇගයීම් උපකරණ සංග්‍රහය' (6 - 9 ශ්‍රේණි) යොදා ගත හැකි ය.

ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීමේ දී මෙහි සඳහන් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ නිර්දේශ කර ඇති දේශන, වාද විවාද, සාකච්ඡා ආදිය ද අවස්ථානුකූල ව යොදා ගත හැකි ය. ඉගෙනුම් ක්‍රියාවලිය තාක්ෂණය හා බද්ධ කර ගැනීම කාලෝචිත වනු ඇත. එනිසා හැකි සෑම අවස්ථාවක දී ම එවැනි තාක්ෂණික ඉගෙනුම් ආධාරක හෝ මෙවලම් හෝ භාවිත කිරීම මගින් ඔබගේ ඉගැන්වීම් කාර්යයෙහි ගුණාත්මක බව වර්ධනය කරගත හැකි ය. සෑම පාඩම් සැලසුමක් අවසානයේ දී ම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරිපත් කර ඇත. එම නිර්ණායකවලට අනුව සුදුසු ඇගයීම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ඉගෙනුම් කාර්යය සඵල වනවා මෙන් ම ශිෂ්‍ය සාධන මට්ටම ද ඉහළ යනු ඇත. භාෂා විෂයයේ වැදගත් ක්ෂේත්‍ර වන ශ්‍රවණ හා කථන කුසලතා මැනෙන පරිදි වාචික පරීක්ෂණ සැලසුම කොට ක්‍රියාත්මක කිරීම ද භාෂා අධ්‍යයනය වඩාත් ඵලදායි වීමට හේතු වනු ඇත.

මෙම මාර්ගෝපදේශයෙහි අන්තර්ගත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ට උචිත පරිදි නිර්මාණශීලී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට අවකාශ සලසා ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමෙන් ඔබගේ ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යනු අපගේ ප්‍රාර්ථනයයි.

ව්‍යාපෘති නායක

## වාර නියමය

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|---|---|
| | 01 | 01 | 11.2 | ජනකතාව |
| | | 02 | 5.2 | සාම්ප්‍රදායික යෙදුම් |
| | 02 | 03 | 10.1 | රබීන්ද්‍රනාත් තාගෝර් |
| | | 04 | 3.1 | අල්පප්‍රාණ, මහාප්‍රාණ |
| 1 | 03 | 05 | 9.1 , | අලුත් අවුරුදු උත්සවය |
| | | 06 | 3.3 | අක්ෂර වින්‍යාසය, |
| | 04 | 07 | 3.2 | ශබ්දකෝෂ භාවිතය |
| | 05 | 08 | 1.1 | රාත්‍රිය පද්‍ය පන්තිය |
| | | 09 | 12.1 | සරල පද්‍ය නිර්මාණය |
| | | 10 | 1.2, 5.3 | කතා බහට අවධානය |
| | 06 | 11 | | විවිධ ආයතනික නිලධාරීන් සමග/පූජ්‍ය පක්ෂය සමග කතාබහ |
| | 07 | 12 | 6.2 | විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා |
| | 08 | 13 | 7.2 | දැන්වීම්, ආකෘති පත්‍ර |
| | 09 | 14 | 2.3 | අවුරුදු සිහිනය (කෙටිකතාව) |
| | 10 | 15 | 12.2 | ප්‍රබන්ධ රචනය (සැබෑ ළෙන්ගතුකම) |
| | | 16 | 6.1 | නාම පද |
| | 11 | 17 | 9.3 | දේශාභිමානී ගීය, විශේෂණ පද |
| 2 | | 18 | 5.1 | විශේෂණ පද බහ්වර්ථ පද, තනි පද, විරුද්ධාර්ථ පද |
| | 12 | 19, 20 | 2.2 5.1 | සද්ධර්මරත්නාවලිය, මනමේ නාට්‍යය |
| | | | 2.1. | ශ්ලෝක, හිතෝපදේශය/බහ්වර්ථ පද |
| | 13 | 21 | 6.5 | වාක්‍ය රීති 1 (ලිංග භේදය, වචන භේදය) |
| | 14 | 22 | 9.4 | කතරගම පුද බිම |
| | 15 | 23 | 8.2 | පුවත්පත් ලිපි |
| | 16 | 24 | 1.3 | තේරවිලි කවි |
| | | | | සමානාර්ථ පද |
| | 17 | 25 | 11.1 | පරාස්ස නාට්‍යය |
| | | 26 | 12.3 | නාට්‍ය පිටපත් රචනය |
| | 18 | 21 | 6.5 | වාක්‍ය රීති 11 (පුරුෂ භේදය, උක්ත අනුක්ත භේදය) |
| | 19 | 27, 28 | 1.4 , 4.1 | ප්‍රවෘත්ති, විරාම ලකුණු |
| | 20 | 29 | 9.5 | |
| | 30 | | 8.1 | මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි |
| 3 | | 31 | 4.2 | රචනා ලිවීම, පද බෙදීම |
| | 21 | 32 | 9.2, 5.1 | ලෝවැඩ සඟරාව, විරුද්ධාර්ථ පද, |
| | 22 | 33 | 5.1, 8.1 | සයුරු පතුල ගවේෂණය, තනි පද, |
| | | | 10.2 | රචනා ලිවීම |
| | 23 | 34 | 1.5 | විද්වත් දේශන |
| | | 35 | 1.6 | මාතෘකානුකූල කතා |
| | | 36 | 7.1 | රාජකාරි ලිපි |

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 8 ශ්‍රේණිය

(2017 සිට ක්‍රියාත්මක කෙරේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

**විෂය නිර්දේශ කමිටුව**

මහාචාර්ය රත්න විජේතුංග
මහාචාර්ය තිස්ස ජයවර්ධන

ඩී. ඩබ්. දිසානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොළ ඥාණවිමල හිමි, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා කල්දේරා, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එස්. ඕ. ප්‍රනාන්දු, අධ්‍යක්ෂ (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. එස්. අබේවික්‍රම, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,
මීරිගම

ගයා වැයිහේන, ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පාදුක්ක

සුනිල් බියන්විල, ගුරුසේවය, ගිරි/වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල.

# පටුන

පිටු අංක


| | |
|---|---|
| හැඳින්වීම | i |
| ජාතික පොදු අරමුණු | ii - iii |
| මූලික නිපුණතා | iv |
| විෂය අරමුණු | v |
| විෂය අරමුණු සහ පොදු නිපුණතා අතර සම්බන්ධය | vi |
| විෂය නිර්දේශය | vii - viii |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවිධානය | ix |
| තක්සේරුකරණය | x |

**හැඳින්වීම**

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්යභාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස, සිංහල විෂයයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තුළ වැඩෙමින් විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂයය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.



නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කර ගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

මීට ප්‍රථම ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයෙහි ශ්‍රවණය සහ කථනය සඳහා නිපුණතා දෙකක් ගොඩ නගා තිබුණ ද මෙම විෂය නිර්දේශයෙහි එම නිපුණතා දෙක එක් නිපුණතාවක් වශයෙන් ගොඩ නගා ඇත. 9 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා බහුවිධ මාධ්‍ය භාවිතය (Multi model texts) ඇසුරෙන් පරිගණක තාක්ෂණය ආදි විවිධ ක්‍රම උපයෝගි කර ගෙන අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දී තිබේ. භාෂාව භාවිත කරමින් ප්‍රායෝගික ව්‍යවහාරයට යොමු කර ඇති අතර ඒ සඳහා උගත් දේ නැවත නැවත මතක් කර ගනිමින් භාෂාව භාවිතයට යොමු කිරීම සඳහා විෂය නිර්දේශය තුළ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත.

**ජාතික පොදු අරමුණු**

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහ හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

**විෂය අරමුණු**

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.

3. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

4. විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.



6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කරගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

07. සාහිත්‍යයේ පදනම වන භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

# ජාතික පොදු නිපුණතා හා විෂය අරමුණු අතර සම්බන්ධතාව

| | විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 1. | චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම. | ✓ | | | | | ✓ | ✓ | |
| 2. | නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම. | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | |
| 3. | සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම. | | | ✓ | ✓ | ✓ | ✓ | | |
| 4. | විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම. | | | | ✓ | ✓ | | ✓ | ✓ |
| 5. | සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම. | | | | | ✓ | ✓ | ✓ | ✓ |
| 6. | සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 7. | සාහිත්‍යයේ පදනම වන භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම. | | | | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | • රාත්‍රිය - ඇස්. මහින්ද හිමි | • කවි පෙළට සවන් දී රිද්මානුකූල ව ගායනා කරයි.<br>• පද්‍ය පන්තියේ මුඛ්‍යාර්ථය ප්‍රකාශ කරයි.<br>• පද්‍ය නිර්මාණයෙහි භාවිතාර්ථ පැහැදිලි කරයි.<br>• පද්‍ය නිර්මාණයට සවන් දී කාව්‍යෝක්ති පැහැදිලි කරයි. | 04 |
| | 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි. | • විවිධ ආයතන නිලධාරින් සමග කෙරෙන කතා බහ<br>- තැපැල් කාර්යාල<br>- බැංකු | • අවධානයෙන් යුතු ව සවන්දීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ආචාරශීලී ව සංයමයෙන් ප්‍රතිචාර දක්වයි.<br>• අවස්ථානුකූල ව සන්නිවේදන කාර්යයේ යෙදෙයි. | 04 |
| | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • තේරවිලි කවි<br>- කටුවානෙන් කෙටුවා වැනි මලේ සැටි<br>- අත්තක් උඩ බුම්මා ගෙන<br>• ටීකා සීපද<br>- බැද්දේ ගියා වැලක් හොයා ගන්ට කියා | • තේරවිලි කවි හා ටීකා සීපද වෙන් වෙන් ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• තේරවිලි කවිවලට සවන් දී පිළිතුරු ප්‍රකාශ කරයි.<br>• තමන් දන්නා තේරවිලි කවි හා පිළිතුරු කවි ප්‍රකාශ කරයි.<br>• තේරවිලි කවි හා ටීකා සීපදවලට සවන් දී රස විඳියි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | ● ගුවන් විදුලි වාර්තා වැඩ සටහන්<br>- ප්‍රවෘත්ති | ● ප්‍රවෘත්ති ප්‍රකාශයක ස්වරූපය හඳුනා ගෙන විස්තර කරයි.<br>● ප්‍රවෘත්ති ප්‍රකාශනයකට සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.<br>● මතකයේ තබා ගත් කරුණු අවස්ථාවට උචිත පරිදි භාවිත කරයි.<br>● ආදර්ශ ප්‍රවෘත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කරයි. | 04 |
| | 1.5 දේශන සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි. | ● විද්වත් දේශන<br>- සෞඛ්‍යය හා සම්බන්ධ දේශනයක් | ● දේශනයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>● දේශනයෙහි අන්තර්ගත කරුණු පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.<br>● විද්වත් දේශනවලට විචාරශීලී ව සවන් දී අදහස් ප්‍රකාශ කරයි. | 04 |
| | 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | ● මාතෘකානුකූල කතා | ● මාතෘකාවට අනුකූල ව කතා කරයි.<br>● උචිත පරිදි හඬ පාලනය කරමින් කතා කරයි.<br>● කථිකත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් කතා කරයි. | 04 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | • ශබ්දෝච්චාරණය වර්ධනය සඳහා කියවීම<br>- ශ්ලෝක,<br>- හිතෝපදේශය<br>- සංස්කෘත පද බහුල ගද්‍ය ලේඛන | • පැහැදිලි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• විරාම ලකුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.<br>• අර්ථාවබෝධය ඇති ව ශබ්ද නගා කියවයි.<br>• අන්‍යයන් කෙරෙහි අවධානයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 04 |
| | 2.2 විවිධ ශෛලිවලින් රචිත පොත පත කියවයි. | • සද්ධර්මරත්නාවලියේ කථා වස්තුවක් දීඝායු කුමාරයාණන්ගේ වත (ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය)<br>• මනමේ නාට්‍යයේ කොටසක් | • උද්ධෘතවල ශෛලිය හඳුනා ගෙන කියවයි.<br>• ශෛලිවල විවිධත්වය රස වින්දනයට හේතු වන බව ප්‍රකාශ කරයි.<br>• විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවයි. | 05 |
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ- කර ගත් කරුණු ඉදිරිපත් කරයි. | • කෙටිකතා<br>- අවුරුදු සිහිනය<br>-ගුණදාස අමරසේකර | • නිර්දිෂ්ට කෙටිකතාව කියවා අන්තර්ගතය පිළිබඳ අදහස් දක්වයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවේ මූලික ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවේ තේමාව පැහැදිලි කරයි.<br>• කෙටිකතාව කියවා අදහස් ප්‍රකාශ කරයි. | 05 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • ස්වර ව්‍යඤ්ජන අනුව අක්ෂර වෙන් කිරීම.<br>- ස්වර (හ්‍රස්ව ස්වර සහ දීර්ඝ ස්වර)<br>- ව්‍යඤ්ජන | • ස්වර, ව්‍යඤ්ජන වෙන් කොට දක්වයි. ස්වර, හ්‍රස්ව සහ දීර්ඝ ලෙස වර්ග කර දක්වයි.<br>• අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි.<br>• ලේඛනයේ දී අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | 04 |
| | 3.2 ප්‍රායෝගික භාෂා කාර්ය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි. | • අකාරාදි පිළිවෙළ<br>• ශබ්ද කෝෂ භාවිතය<br>- ශබ්ද කෝෂ භාවිතය පිළිබඳ හැඳින්වීම. | • අකාරාදි පිළිවෙළ යනු කුමක් දැයි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අකාරාදි පිළිවෙළට නාමාවලි සැකසීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• අකාරාදි පිළිවෙළට නාමාවලි සකස් කරයි.<br>• ශබ්ද කෝෂ භාවිත කරයි. | 04 |
| | 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුක්ත ව ලියයි. | • න, ණ, ල, ළ. ශ, ෂ, ස භාවිතය<br>- සඤ්ඤක අක්ෂර වචනවල යෙදීම.<br>- අල්පප්‍රාණ මහාප්‍රාණ භාවිතය<br>- ලේඛන නිවැරදි කිරීම. | • ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර ලේඛනයේ දී නිවැරදි ව යොදයි.<br>• සඤ්ඤක අක්ෂර ලේඛනයේ දී උචිත පරිදි යොදයි.<br>• න, ණ, ල, ළ. ශ, ෂ, ස යන අක්ෂර ලේඛනයේ දී නිවැරදි ව යොදයි.<br>• අක්ෂර වින්‍යාසය සම්මත ආකාරයට යොදා ගනිමින් ලේඛන සකස් කරයි. | 05 |

සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | ● විරාම ලකුණු භාවිතය<br>● තිත් පෙළ<br>- තිත් තුන<br>- තිත් හතර<br>- සරල වරහන්<br>- සඟල වරහන් හෙවත් අහුවරහන්<br>- කාක පාදය | ● විරාම ලකුණු නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>● විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>● විරාම ලකුණු උචිත පරිදි යොදමින් ලේඛනයේ යෙදෙයි. | 04 |
| | 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි. | ● සංඛ්‍යා අකුරින් ලිවීමේ දී ස්ථානීය අගය දක්වන පද එකිනෙක වෙන් කොට ලිවීම. (එක් කෝටි පනස් ලක්ෂ හතළිස් දහස් දහ තුනයි.)<br>- ඉලක්කමෙන් සංඛ්‍යා දැක්වීමේ දී ට, ක්, ක, කින්, සහ කට යනාදි පද ඉලක්කම හා සමීපයෙන් ලිවීම. | ● පද බෙදා ලිවිය යුතු බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● සංඛ්‍යා, අක්ෂර මගින් ලියා දැක්වීමේ දී ස්ථානීය අගය දැක්වෙන පද වෙන් කොට ලියයි.<br>● සංඛ්‍යාවක් ඉලක්කමෙන් දක්වන විට ඊට සම්බන්ධ වන අක්ෂරය ඉලක්කම හා එකතු කර ලියයි. | 04 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 භාෂාත්මක කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | • සමානාර්ථ පද<br>• විරුද්ධාර්ථ පද<br>• තනි පද<br>• විශේෂණ පද<br>• බහ්වර්ථ (බහු අර්ථ) පද | • විවිධ පද වර්ග හඳුනා ගෙන ව්‍යවහාර කරයි.<br>• භාෂා ඥානය පෝෂණය කිරීම සඳහා වාක්කෝෂීය දැනුම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.<br>• පද වර්ග යෝග්‍ය පරිදි ලේඛනයේ දී භාවිත කරයි. | 04 |
| | 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | • ප්‍රස්තාව පිරුළු (කතාවක් මගින් අන්තර්ගතය පැහැදිලි කිරීම)<br>- රූඩී<br>- යුගල පද | • සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ව්‍යවහාර කරයි.<br>• ප්‍රස්තාව පිරුළු යොදා ගනිමින් භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.<br>• රූඩී හා යුගල පද යොදා ගනිමින් ප්‍රාණවත් ලෙස භාෂාව හසුරුවයි. | 04 |
| | 5.3 භාෂා ව්‍යවහාරයේ සාමාජික විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • ගරුත්වය අනුව භාෂා ව්‍යවහාරය වෙනස්වීම.<br>- පූජ්‍ය පක්ෂය<br>- ප්‍රභූන්<br>- වැඩිහිටියන් | • භාෂා ව්‍යවහාරය තුළ සාමාජික විවිධතා ඇති බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ගරුත්වය, පූජ්‍යත්වය සමග බැඳුණු, භාෂා ව්‍යවහාර පැහැදිලි කරයි.<br>• භාෂා භාවිතය කෙරෙහි ගරුත්වයේ හා පූජ්‍යත්වයේ බලපෑම ප්‍රායෝගික ව යොදා ගනියි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1 නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | ● නාම පද වර්ග කිරීම<br>● නාම නාම, සර්ව නාම, සමාස නාම, තද්ධිත නාම, කෘදන්ත නාම<br>- ජාති නාම<br>- ද්‍රව්‍ය නාම<br>- ගුණ නාම<br>- ක්‍රියා නාම<br>- සංඥා නාම | ● නාම පදවල ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නාම පද වර්ගවල විවිධතා පැහැදිලි කරයි.<br>● ලේඛනයේ දී විවිධ නාම පද යොදා ගැනීමේ අගය පැහැදිලි කරයි.<br>● අවස්ථෝචිත ව විවිධ නාම පද වර්ග භාවිත කරයි. | 06 |
| | 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | ● විධි ක්‍රියා<br>● ආශීර්වාද ක්‍රියා | ● විවිධ ක්‍රියා පද වර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ලේඛනයේ දී විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා නිවැරදි ව යොදයි.<br>● භාෂා ව්‍යවහාරයේ දී විධික්‍රියා හා ආශීර්වාද ක්‍රියා යොදා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • උක්ත අනුක්ත භේදය<br>• ලිංග, වචන හා පුරුෂ භේදය | • ලිංග භේදය, වචන භේදය හා පුරුෂ භේදය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.<br>• උක්ත නාම පදයේ ප්‍රාණවාචී, හා අප්‍රාණවාචී බව කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියා පදය යොදයි.<br>• උක්ත අනුක්ත භේදය හඳුනා ගනිමින් වාක්‍ය ලියයි. | 05 |
| 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • රාජකාරි ලිපි | • රාජකාරි ලිපියක මූලිකාංග නම් කරයි.<br>• රාජකාරි ලිපි හා පෞද්ගලික ලිපි අතර වෙනස පැහැදිලි කරයි.<br>• යෝග්‍ය ආකෘති හඳුනා ගෙන රාජකාරි ලිපි ලියයි. | 04 |
| | 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • ආකෘති පත්‍ර<br>- ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම.<br>• පෝස්ටර් හා දැන්වීම් | • ප්‍රායෝගික අවශ්‍යතා සඳහා භාවිත කරන ලේඛන වර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• ආකෘති පත්‍රයක ඇතුළත් විය යුතු මූලික තොරතුරු විස්තර කරයි.<br>• විවිධ අවශ්‍යතා සඳහා ආකෘති පත්‍ර සකස් කරයි.<br>• ආකෘති පත්‍ර නිසි ලෙස සම්පූර්ණ කරයි. | 04 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • රචනා ලිවීම | • රචනා ලිවීම සඳහා මාතෘකා තෝරා ගනියි.<br>• රචනා ලිවීමට උචිත කරුණු සංවිධානය කරයි.<br>• මාතෘකාවට අදාළ දළ සැලැස්මක් සකස් කරයි.<br>• රචනා ලිවීමේ දී හරවත් තොරතුරු උපයෝගි කර ගනියි.<br>• රචනයේ ආරම්භය, මධ්‍යය හා අවසානය ගැන සැලකිලිමත් ව ලියයි.<br>• රචනා ලිවීමේ දී භාෂාව නිවැරදි ව භාවිත කරයි.<br>• ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් විවිධ මාතෘකා ඔස්සේ රචනා ලියයි. | 04 |
| | 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි නිර්මාණාත්මක ව අදහස් ඉදිරිපත් කරමින් ලියයි. | • බිත්ති පුවත්පත්<br>• සඟරා ලිපි, | • පාසල් සඟරාවක හා බිත්ති පුවත්පතක මූලික ලක්ෂණ වෙන් වෙන් ව විස්තර කරයි.<br>• මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කරයි.<br>• ආකර්ෂණීය ලෙස කරුණු ඉදිරිපත් කරයි.<br>• බිත්ති පුවත්පත් හා සඟරා සඳහා ලිපි ලියයි. | 04 |
| 9.0සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. | 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. | • අලුත් අවුරුදු උත්සවය | • සංස්කෘතික උරුමය හා සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සංස්කෘතික උරුමය හා සාරධර්ම ආරක්ෂා කර ගත යුතු බව ප්‍රකාශ කරයි.<br>• අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් හා ජන සංස්කෘතිකාංග අගය කරයි.<br>• සංස්කෘතික උත්සව ගැන ලියවුණු ලේඛන කියවයි. | 04 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | • ලෝවැඩ සඟරාව<br>- තෝරා ගත් පද්‍ය 10ක්<br>25, 33, 37, 38, 40,<br>63, 65, 66, 74, 96 | • උපදේශ සාහිත්‍යය යන්න පැහැදිලි කරයි.<br>• ලෝවැඩ සඟරාව හා උපදේශ කාව්‍ය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.<br>• ලෝවැඩ සඟරාවේ ඉදිරිපත් වන සාරධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සාරධර්මවලට අනුව ජීවිතය සකස් කර ගනියි. | 04 |
| | 9.3 දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | • දේශාභිමානී ගී/පද්‍ය<br>- වැසි වසිනා අහස අපි<br>- මහගම සේකර | • දේශාභිමානී ගීතය හැඟීම් දනවන පරිදි රිද්මානුකූල ව ගායනා කරයි.<br>• ගීතයේ යෙදී ඇති විශේෂ යෙදුම් උපුටා දක්වයි.<br>• ගීතය රස විඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානී ගීතයෙන් ධ්වනිත වන අදහස් අගය කරයි.<br>• දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ එක්රැස් කරයි. | 04 |
| | 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. | • කතරගම පුද බිම හා සිරිත් ආශ්‍රිත ලිපියක් | • ජන වර්ගවලට අයත් සිරිත් විරිත් හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ පුද සිරිත් අගය කරමින් කතා කරයි.<br>• විවිධ පුද පූජා පිළිබඳ සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි.<br>• විවිධ ජන වර්ගවලට අයත් සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි. | 04 |

සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.5විවිධ නායකයන්ගේ චරිත කථා පරිශීලනය කරයි. | • මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි චරිතය | • මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ගුණානන්ද හිමිගේ චරිත ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>• උන්වහන්සේගේ උදාර අදහස් හා ජාතික මෙහෙවර අගය කරමින් කතා කරයි. | 04 |
| 10.0 සාහිත්‍යයික දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි. | 10.1සාහිත්‍යයික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • රබීන්ද්‍රනාත් තාගෝර්ගේ නිර්මාණ ඇසුරෙන් සැකසුණු ලිපියක්. | • රබීන්ද්‍රනාත් තාගෝර්තුමා පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.<br>• රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ නිර්මාණාත්මක කුසලතා අගය කරයි.<br>• තාගෝර්තුමාගේ සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන ජීවන දෘෂ්ටිය ඉදිරිපත් කරයි. | 04 |
| | 10.2විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබාගත් දැනුම භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | • මුහුදු පතුළ ගවේෂණය පිළිබඳ ව ලියවුණු නිර්මාණාත්මක ලේඛනයක් | • මුහුදු පතුල ගැන ලියැවුණු ලේඛන කියවා එහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කරයි.<br>• ලිපිය සඳහා යොදා ගත් භාෂා ලක්ෂණ අගය කරයි.<br>• මුහුදු පතුල පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.<br>• තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත කියවයි. | 04 |



11.0

# සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි | • පරාස්ස නාට්‍යය<br>- 5 වෙනි අංකය<br>- රෝහණ දන්දෙණිය. | • නිර්දිෂ්ට නාට්‍යයට පාදක වූ කතා පුවත හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ පෙළ කියවා රස විඳියි.<br>• නාට්‍යයේ ඇතුළත් ප්‍රාදේශීය ව්‍යවහාර හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යය කොටසින් ඇතුළත් චරිත වෙන් වෙන් ව හඳුනා ගෙන ඒවායේ ලක්ෂණ ඉදිරිපත් කරයි. | 04 |
| | 11.2සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | • ජනකතා<br>- එතන හාමි<br>ජනකතා 1 අතිරේක කියවීම් පොත<br>(ප්‍රථම මුද්‍රණය 2000)<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය | • ජනකතාවල ස්වභාවය විස්තර කරයි.<br>• ජනකතාවලින් ආදර්ශ සපයන බව ප්‍රකාශ කරයි.<br>• ජනකතා මගින් මතු වන නිර්මාණාත්මක ගුණය අත්දකිමින් කතන්දර ලියයි.<br>• ජනකතා කියවා රස විඳියි. | 04 |



• නිර්

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 12.0අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1පද්‍ය රචනා නිර්මාණය කරයි. | • සරල පද්‍ය නිර්මාණය කිරීම. | • පද්‍ය නිර්මාණ සඳහා සරල අත්දැකීම් යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරයි.<br>• අත්දැකීම් පාදක කර ගනිමින් රසවත් පද්‍ය නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.<br>• කාව්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.<br>• විවිධ මාතෘකා ඔස්සේ පද්‍ය නිර්මාණය කරයි. | 04 |
| | 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය<br>- යම් අත්දැකීමක් ඔස්සේ ප්‍රබන්ධයක් නිර්මාණය කිරීම. | • නිර්මාණකරණයට පාදක වන අත්දැකීම් ඉදිරිපත් කරයි.<br>• ප්‍රබන්ධකරණයට නිර්මාණාත්මක චින්තනය ඉවහල් වන බව ප්‍රකාශ කරයි.<br>• විවිධ රචනා උපක්‍රම ඔස්සේ රසවත් නිර්මාණ ඉදිරිපත් කරයි.<br>• අත්දැකීම් පදනම් කොට ගෙන ප්‍රබන්ධ නිර්මාණය කරයි. | 04 |
| | 12.3නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | • සරල නාට්‍ය පිටපතක් රචනා කිරීම. | • නාට්‍ය සඳහා උචිත අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නාට්‍යෝචිත අවස්ථා උචිත පරිදි පෙළ ගස්වයි.<br>• සරල නාට්‍ය පිටපත් රචනා කරයි. | 04 |

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පෙළ පොතට හා පන්ති කාමරයට පමණක් සීමා නොවිය යුතු ය. විවිධ සන්නිවේදන මාධ්‍ය පුළුල් ලෙස ව්‍යාප්ත වෙමින් පවත්නා මේ යුගයේ භාෂාව නිර්මාණාත්මක ව භාවිත කිරීම කෙරෙහි ශිෂ්‍ය පරපුර යොමු කළ යුතු ව ඇත. මේ සඳහා සාහිත්‍යයෙන් ලද හැකි පිටුබලය පුළුල් ය. එබැවින් භාෂාව හා සාහිත්‍යය සම්බන්ධ ව විෂය සමගාමී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමුවීම අවශ්‍ය ය. මේ වෙනුවෙන් පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධානය වීම ඵලදායක වනු ඇත.

මෙහි දී පාසල් සංස්කෘතියට අදාළ ව පවත්නා සම්පත්වලින් ප්‍රයෝජන ගත හැකි අයුරින් පහත සඳහන් ආකාරයේ වැඩසටහන් සංවිධානය කළ හැකි වේ.

1. සාහිත්‍ය සංගම්
2. ක්‍රීඩා හා රංගන
3. චාරිකා
4. පැවරුම්
5. ප්‍රදර්ශන
6. බිත්ති පුවත් පත් හා සඟරා
7. නිර්මාණ කව
8. පුස්තකාල පරිහරණය
9. ප්‍රහේලිකා දෘශ්‍ය මාධ්‍ය සඳහා විවිධ නිර්මාණ
10. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සඳහා විවිධ නිර්මාණ
11. සිංහල භාෂා දින
12. අන්තර්ජාලය

## තක්සේරුකරණය

1. ශිෂ්‍යයන්ගේ ඉගෙනීම් සාඵල්‍යයේ විවිධ ප්‍රාප්ති මට්ටම් ඇත. ඒවා හැඳින ගැනීමටත් ඔවුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමටත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අඛණ්ඩ තක්සේරුව අවශ්‍ය වේ. මෙම තක්සේරුව පාඩම් ඒකක අවසානයේ දී කෙරෙන සම්භවන ඇගයීම (FORMATIVE) හා නිශ්චිත කාලයක් (අවසන දී) සිදු කෙරෙන සම්පිණ්ඩිත ඇගයීම (SUMMATIVE) වශයෙන් දෙයාකාරයකින් සිදු කළ හැකි ය.

2. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී චතුර්විධ භාෂා කුසලතා, (ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම) රස වින්දන හැකියාව හා නිර්මාණකරණය ගැන ද අවධානය යොමු කළ යුතු වේ. චතුර්විධ භාෂා කුසලතාවලට මෙන් ම රස වින්දනාත්මක ක්‍රියාකාරකම්වලට ද සමාන අවස්ථා සැලසිය යුතු ය. ශිෂ්‍යයන්ගේ සාධනය පරීක්ෂා කොට අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම අපේක්ෂිත ය. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ (SBA) සඵල කර ගැනීම සඳහා 2003 වර්ෂයේ දී මුද්‍රණය කර බෙදා හරින ලද පාසල පදනම් කරගත් ඇගයීම් සඳහා නිදර්ශක ඇගයීම් උපකරණ සංග්‍රහය යොදාගත හැකි ය.

.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 1. ජනකතාව

**නිපුණතාව** : 11.0 **රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.**

**නිපුණතා මට්ටම** : 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- ජනකතාවල ස්වභාවය විස්තර කරයි.
- ජනකතාවලින් ආදර්ශ සපයන බව ප්‍රකාශ කරයි.
- ජනකතා මගින් මතු වන නිර්මාණාත්මක ගුණය අත්දකිමින් කතන්දර ලියයි.
- ජනකතා කියවා රස විඳියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ජනකතා සාහිත්‍යය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න. ඒ සඳහා ඇමුණුමෙහි එන තොරතුරු යොදා ගන්න.
- ශිෂ්‍යයන් දන්නා ජනකතා පිළිබඳ විමසීමක් කරන්න.
- එම ජනකතා කිහිපයක් ඇසුරෙන් ජනකතාවක ස්වරූපය හඳුනා ගැනීමට සලස්වන්න.
- ඇමුණුමෙහි සඳහන් කරුණු ද ආශ්‍රය කර ගනිමින් නියමිත ජනකතාව රස විඳීම සඳහා යොමු කරන්න.
  - භාෂා ලක්ෂණ
  - චරිත ලක්ෂණ
  - ජීවිතාදර්ශ
- ජනකතාවේ තෝරා ගත් කොටසක් භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ජනකතා 1 - ජාතික අධ්‍යාපන ආයතනය
- නඟුල් මුන්නා සහ වෙනත් කතා - ඒ. පී. ගුණරත්න
- ලංකාවේ ගැමි කතා - චන්ද්‍ර ශ්‍රී රණසිංහ
- මග දිගට ජනකතා 1, 2 - ඩී. පී. වික්‍රමසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය**

- ජනකතා හඳුනා ගෙන ඒවායේ ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ජනකතාවලින් ප්‍රකට වන චරිතාදර්ශ ඉදිරිපත් කරයි.
- ජනකතාවලින් හෙළි වන සාහිත්‍ය රසය ඉස්මතු කර දක්වයි.
- අවස්ථෝචිත ව විවිධ ජනකතා ඉදිරිපත් කරයි.

**ඇමුණුම :**

**ජනකතා :**

- ජනකතා මුඛ පරම්පරාගත ව ආ සාහිත්‍යාංගයකි.
- මේ නිසා ම කතුවරයකු හෝ කාලයක් සඳහන් කළ නො හැකි ය.
- බොහෝ ජනකතාවල අන්තර්ගත වී ඇත්තේ ගැමි සමාජයට බෙහෙවින් සමීප අත්දැකීම් ය.
- ගැමි ඇදහිලි සහ විශ්වාස ද ජනකතාවලින් පිළිබිඹු වේ.
- ගැමි සමාජයේ බෙහෙවින් ප්‍රචලිත ගමරාල, ගමහාමිනේ, වැනි චරිත ද විවිධ සත්ත්ව චරිත ද හමු වේ.
- මෙම චරිත මගින් මානව සමාජයේ විවිධ ලක්ෂණ ඉස්මතු කෙරෙන අතර හාස්‍ය රසය මෙන් ම උපහාසය ද දැනවෙයි.
- මෙම සාහිත්‍යාංගය වාචික ව පැවත ආ බැවින් කතා ඉදිරිපත් කිරීමේ දී එම සම්ප්‍රදාය ම අනුගමනය කෙරෙයි.
- බොහෝ ජනකතාවලින් සමාජයට වැදගත් ආදර්ශ සැපයේ.

## 2. සාම්ප්‍රදායික යෙදුම්

**නිපුණතාව** : 5.0 **භාෂාත්මක කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම** : 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ව්‍යවහාර කරයි.
- ප්‍රස්තාව පිරුළු යොදා ගනිමින් භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.
- රූඪී හා යුගල පද යොදා ගනිමින් ප්‍රාණවත් ලෙස භාෂාව හසුරුවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ප්‍රස්තාව පිරුළු, රූඪී සහ යුගල පද වෙන් වෙන් ව පැහැදිලි කරන්න. ඒ සඳහා ඇමුණුම භාවිත කරන්න.
- ප්‍රස්තාව පිරුළු, රූඪී සහ යුගල පද කිහිපයක් ඇසුරෙන් ඒවා හඳුනා ගැනීමට සලස්වන්න.
- ඇතැම් ප්‍රස්තාව පිරුළු සම්බන්ධ ව රසවත් කතා ඇති බව උදාහරණ මගින් පෙන්වා දෙන්න.
- එබඳු කතාවක් පන්තියට ඉදිරිපත් කරන්න. අවශ්‍ය නම් ඒ සඳහා ශිෂ්‍යයකුගේ සහාය ලබා ගන්න. (පරංගියා කෝට්ටේ ගිය හැටි/කළුවා මාරපන් ගිය හැටි)
- ඒ අනුව නියමිත ප්‍රස්තාව පිරුළ සම්බන්ධ කතාව රස වින්දනයට යොමු කරන්න.
- ප්‍රස්තාව පිරුළෙන් ප්‍රකාශ කෙරෙන අදහස්/අරුත් ඉදිරිපත් කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය - ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ
- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබඳු
- පිරුළු මිණි - ටී. ඇස්. ධර්මබන්දු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රස්තාව පිරුළු, රූඪී හා යුගල පද යන්න නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රස්තාව පිරුළු, රූඪී සහ යුගල පද මගින් ඇති කෙරෙන ප්‍රකාශන ශක්තිය අගය කරයි.
- යම් අදහසක් රසවත් ව හා ව්‍යක්ත ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ප්‍රස්තාව පිරුළුවලට ඇති බව පැහැදිලි කරයි.
- ලේඛනයේ දී හා භාෂණයේ දී ප්‍රස්තාව පිරුළු, රූඪී සහ යුගල පද උචිත පරිදි භාවිත කරයි.

ඇමුණුම

ප්‍රස්තාව පිරුළු

- 'පිරුළු' යන්න උපදේශාත්මක කියමන, තැනට ගැළපෙන කියමන, ආදර්ශවත් කියමන ආප්තෝපදේශය ආදි වශයෙන් ද අර්ථ කථනය කෙරේ.
- අවස්ථාවට උචිත හා ගැළපෙන ලෙස යොදා ගත හැකි කියමන් ප්‍රස්තාව පිරුළු ලෙස භාවිතයට පැමිණ ඇත.
- භාෂා ව්‍යවහාරයේ පිරුළු යන්නෙන් බහුල ව අර්ථවත් වන්නේ ප්‍රස්තාව පිරුළු ය.
- සිංහල ප්‍රස්තාව පිරුළු ගැමි සමාජය පදනම් කර ගෙන බිහි වී ඇත.
- ප්‍රස්තාව පිරුළු මගින් යම් අදහසක් ව්‍යක්ත ව හා අවධාරණයෙන් ප්‍රකාශ කිරීමට හැකි වන අතර එය භාෂාවේ නිර්මාණාත්මක බව මෙන් ම අලංකාර බව ද ඉස්මතු කරයි.

එවැනි ප්‍රස්තාව පිරුළු කිහිපයක්

- පරංගියා කෝට්ටේ ගියා වගේ
- බළලුන් ලවා කොස් ඇට බාවන්නා වගේ
- ගඟට ඉනි කැපුවා වගේ
- ඉත්තෑවාගේ ගෙට කබල්ලෑවා රිංගුවා වගේ
- වක්කඩේ හකුරු හැංගුවා වගේ
- ගමරාලගෙ වංගෙඩිය වගේ

රූඪී

- රූඪී යනු අමුතුවෙන් ආරෝපණය කරන ලද අර්ථ සහිත කියමන්/ප්‍රකාශන විශේෂයකි.

  උදාහරණ :

  – ඉහේ මලක් පිපුණා
  – ලෑල්ලට පාගනවා
  – තරු පෙණුනා
  – බඩට ගහනවා

යුගල පද

- සමාන ශ්‍රැති සහිත පද දෙකක් වින්‍යාස ගත කිරීමෙන් සාදා ගන්නා සාම්ප්‍රදායික පද විශේෂයකි.

  උදාහරණ :

  – නඩු හබ
  – හරක බාන
  – මුදල් හදල්
  – යාන වාහන
  – ලට්ට ලොට්ට
  – උඩ බිම
  – රොස් පරොස්

## 3. රබීන්ද්‍රනාත් තාගෝර්

**නිපුණතාව** : 10.0 **සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : **10.1** සාහිත්‍යයික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමා පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ නිර්මාණාත්මක කුසලතා අගය කරයි.
- තාගෝර්තුමාගේ සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන ජීවන දෘෂ්ටිය ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කරමින් එතුමා පිළිබඳ ව දැන ගැනීමට සලස්වන්න.
- එතුමාගේ ජීවන තොරතුරු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න.
  - ඇමුණුම 1 යොදාගන්න
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් රචිත පද්‍ය පන්තියක් ඉදිරිපත් කරමින් එම කවියාගේ නිර්මාණ කුසලතා සාකච්ඡා කරන්න.
  ඇමුණුම 2හි ඇති පද්‍ය පන්තියක් යොදා ගන්න.
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ නිර්මාණ පිළිබඳ ව ලියැවුණු ලේඛනයක් අධ්‍යයනය කිරීමට යොමු කරන්න. ඒ සඳහා පෙළපොතේ පාඩම යොදා ගන්න.
- කාව්‍ය නිර්මාණවලින් කියවෙන අදහස් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මෙම ලේඛන හා නිර්මාණවල භාෂා ව්‍යවහාර හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සුදුසු අභ්‍යාස මගින් භාෂා ව්‍යවහාර අර්ථවත් ව භාවිත කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- රබීන්ද්‍රනාත් තාගෝර් කවියාගේ ජීවන තොරතුරු සහ නිර්මාණ පිළිබඳ ව කුඩා පොතක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ කාව්‍ය නිර්මාණ
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව ලියන ලද ලිපි
  - හඬ (ගුවන් විදුලි සඟරාව) - 2011 අප්‍රේල් - ජූනි කලාපය
- ගීතාංජලී - රබීන්ද්‍රනාත් තාගෝර් (පරිවර්තනය - කුසුම් දිසානායක)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- තාගෝර්තුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- තාගෝර්තුමාගේ සාහිත්‍ය සේවය අගය කරයි.
- තාගෝර්තුමා පිළිබඳ ව විවිධ මාධ්‍ය ඇසුරෙන් තොරතුරු රැස් කරයි.

**යෝජිත පැවරුම් :**

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ජීවන තොරතුරු රැස් කර පන්තියට ඉදිරිපත් කිරීම.
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ නිර්මාණ ඇතුළත් කුඩා පොතක් (පුස්තිකාවක්) සකස් කිරීම.
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ සාහිත්‍ය සේවය අගය කරමින් බිත්ති පුවත්පතක් සඳහා ලිපියක් සකස් කිරීම (වචන 200ක් පමණ)

ඇමුණුම 1

## රබීන්ද්‍රනාත් තාගෝර්

| | |
|---|---|
| උපන් දිනය | : 1861 මැයි 07 |
| ජාතිය | : බෙංගාලි |
| පියා | : දේවේන්ද්‍රනාත් තාගෝර් |
| පවුල් පසුබිම | : ඉන්දියාවේ ඇති වූ ආගමික, සාමාජික හා දේශපාලනික ව්‍යාපාරවල පුරෝගාමී ව කටයුතු කළ තාගෝර් පරපුරෙන් පැවත එයි. |
| අධ්‍යාපනය | : පාඨශාලා අධ්‍යාපනයට යොමු නො වූ මෙතුමා නිවසේ දී ම සංස්කෘත හා ඉංග්‍රීසි භාෂාව හදාළේ ය. වැඩිදුර අධ්‍යාපනය සඳහා වයස අවුරුදු 17 දී එංගලන්තය බලා පිටත් විය. |
| සාහිත්‍ය නිර්මාණ | : එංගලන්තයට යෑමට පෙර 'කබි භානි' (කවියාගේ කතාව) නමැති කෘතිය ද 'භග්න හෘද' නම් නාට්‍ය පෙළ ද රචනා කොට තිබිණි. එංගලන්තයේ අධ්‍යාපනය ලැබීමෙන් අනතුරු ව තම රටට පැමිණි තාගෝර්තුමා විසින් 1882 දී 'සන්ධ්‍යා සංගීත්' කෘතිය ද 1883 දී 'ලිත් සංගීත්' නමැති කෘතිය ද පළ කරන ලදි. 'සොබා දහමේ 'පළිගැනීම'නමැති නාට්‍යය විචාරක අවධානය දිනා ගත් නිර්මාණයකි. ''ස්මරන් කාව්‍යය'' බිරිඳගේ මරණයෙන් පසු ලියන ලද්දකි. 'කථ්ඕ කාහිනී' 'නෛවේදසා' , කන්තෝරුව, 'අඳුරු කුටියේ' රජතුමා' යන කෘති ද, රබීන්ද්‍රනාත් තාගෝර් විසින් රචිත ය. ඔහුගේ 'ගීතාංජලී' කාව්‍යය පාඨක හා විචාරක අවධානයට යොමු වූ නිර්මාණයකි. රබීන්ද්‍රනාත් තාගෝර්තුමාට නොබෙල් ත්‍යාගය හිමි වූයේ මෙම 'ගීතාංජලී' කාව්‍යය වෙනුවෙනි. |
| අභාවය | : 1941. අගෝස්තු 07 |

ඇමුණුම 2

මං සදන්නන් ගල් කඩන තැන
බිම් කොටන්නන් සරන වැඩ බිම
දූලි තැවරුණු සළු දරා ගෙන
අව්වෙ වැස්සේ සිටිති දෙවියෝ

විමුක්තිය ගැන සිතනු කුමකට
කොයිබදෝ එය තිබෙන්නේ?
ඔබේ පිරිසිදු ඇඳුම හැර දා
පොළොව මත පා තබන්නේ

සොම්නසින් ලොව මවන මහ බර
අප පියාණන් දරන්නේ
තමා නිමැවුම් වෙත බැඳී ඔහු
සදා අප හා වෙසෙන්නේ

සුවඳ දුම් මල් ඉවත ලන්නේ
බවුන් වඩනේ කුමට දෝ
අනගි සළු පිළි ඉරී ගිය වුව
දූලි වැකුණ ද කිමෙක් දෝ

ගතේ වෙහෙසෙන් නළල් තලයේ
නැගෙන ඩා බිඳු  සමග එනු මැන
හමුව දෙවියන් කෙතෙහි වැඩ බිම
සදා එතුමන් හා සිටිනු මැන!

ගීතාංජලී - රබීන්ද්‍රනාත් තාගෝර්
පරිවර්තනය - කුසුම් දිසානයක

නෙළනු මැන මේ කුඩා පුෂ්පය
පමා නොවනුය නෙළා ගනු මැන

පමා වුවහොත් වියළි යනු ඇත
බිම රජස් මත වැටී යනු ඇත.

ඔබේ ගෙලවල මල් දමෙහි එය
නො ලැබුවත් කිසියම් තැනක්
ඔබේ අත් පහසින් පුදා එය
නෙළා ගනු මැන පමා නොම වී

මට හොරා දින ගෙවී යනු ඇත
ඔබ පුදන කල ඉකුත් වනු ඇත
බියෙකි මා සිත නෙළනු මැන මල

පැහැය ලා වුව සුවඳ මඳ වුව
සේවයෙහි ඔබේ යොදා ගනු මැන
කල් තියා එය නෙළා ගනු මැන

ගීතාංජලී - රබීන්ද්‍රනාත් තාගෝර්
පරිවර්තනය - කුසුම් දිසානායක

## 04. අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර

**නිපුණතාව** : 3.0 **සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම** : 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- ස්වර, ව්‍යඤ්ජන වෙන් කොට දක්වයි.
- හ්‍රස්ව සහ දීර්ඝ ලෙස ස්වර වර්ග කර දක්වයි.
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි.
- ලේඛනයේ දී අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිංහල අක්ෂර මාලාව පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය විමසා බලන්න.
- සිංහල භාෂාවේ ස්වර හා ව්‍යඤ්ජන පිළිබඳ දැනුම පරීක්ෂා කරන්න.
- ස්වර, හ්‍රස්ව හා දීර්ඝ ස්වර වශයෙන් බෙදෙන ආකාරය පහදා දෙන්න. ඒ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජනාක්ෂර 42ක් ඇති බව පෙන්වා දෙන්න.
- ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ හා මහාප්‍රාණ ප්‍රභේදය පැහැදිලි කරන්න.
- අල්පප්‍රාණ අක්ෂර 10ක් ද මහාප්‍රාණ අක්ෂර 10ක් ද ඇති බව නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. මේ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- කතා ව්‍යවහාරයේ දී මහාප්‍රාණ භේදය වැදගත් නො වන නමුත් ලේඛනයේ දී අල්පප්‍රාණ හා මහාප්‍රාණ භේදය වැදගත් වන බව පෙන්වා දෙන්න.
- අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය අර්ථ භේදයට හේතු වන බව පෙන්වා දෙන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල හෝඩිය - (සිංහල රීතිය 1) - ජේ. බී. දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සිංහල අක්ෂර මාලාව මතකයෙන් ප්‍රකාශ කරයි.
- ස්වර සහ ව්‍යඤ්ජන අක්ෂර වෙන් කර දක්වයි.
- ස්වර, හ්‍රස්ව හා දීර්ඝ වශයෙන් වෙන් කොට දක්වයි.
- අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය හඳුනා ගෙන නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.

**ඇමුණුම 1**
**අක්ෂර මාලාව**
ස්වර 18කි.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

**හ්‍රස්ව ස්වර**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ඇ | ඉ | උ | ඍ | ඏ | එ | ඔ |

**දීර්ඝ ස්වර**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආ | ඈ | ඊ | ඌ | ඎ | ඐ | ඒ | ඕ | ඓ | ඖ |

**ව්‍යඤ්ජන අක්ෂර - 42**

(අ)ං (අ)ඃ

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | | |
| ළ | ෆ | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ච | ට | ත | ප | අල්පප්‍රාණ අක්ෂර 10 |
| ග | ජ | ඩ | ද | බ | |
| ඛ | ඡ | ඨ | ථ | ඵ | මහාප්‍රාණ අක්ෂර 10 |
| ඝ | ඣ | ඪ | ධ | භ | |

**ඇමුණුම 2**

**අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය අර්ථ භේදයට හේතු වන අවස්ථා**

| | |
|---|---|
| දන (ජනයා) | ධන (ධනය) |
| දනු (දැන, ගනු) | ධනු (දුන්න) |
| බට (නලය) | භට (භේවා) |
| ප්‍රදාන (ප්‍රදානය) | ප්‍රධාන (මූලික) |

**අල්ප්‍රපාණ - මහාප්‍රාණ සාවද්‍ය භාවිතය**

| **නිරවද්‍ය යෙදීම** | **සාවද්‍ය යෙදීම** |
|---|---|
| සමස්ත | සමස්ථ |
| වාර්තා | වාර්ථා |
| මර්දන | මර්ධන |
| පරිවර්තන | පරිවර්ථන |
| විශිෂ්ට | විශිෂ්ඨ |
| දෘෂ්ටි | දෘෂ්ඨි |
| පුස්තකාලය | පුස්ථකාලය |

**අල්පප්‍රාණ/මහාප්‍රාණ විකල්ප භාවිත**

කථා - කතා (ප්‍රබන්ධ කථා, බණ කතා )

අවධිය - අවදිය

අභිමාන - අබිමාන

සුභ - සුබ

## 5. අලුත් අවුරුදු උත්සවය

**නිපුණතාව** : 9.0 **සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම** : 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- සංස්කෘතික උරුමය හා සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සංස්කෘතික උරුමය හා සාරධර්ම ආරක්ෂා කර ගත යුතු බව ප්‍රකාශ කරයි.
- අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් හා ජන සංස්කෘතිකාංග අගය කරයි.
- සංස්කෘතික උත්සව ගැන ලියැවුණු ලේඛන කියවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විවිධ ජාතීන් විසින් පවත්වනු ලබන සංස්කෘතික උත්සව ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතික උත්සව දැක්වෙන චිත්‍ර කිහිපයක් ප්‍රදර්ශනය කරන්න.
- එම චිත්‍ර මගින් හෙළි වන විවිධ චාරිත්‍ර ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතික උත්සවය වන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. (චාරිත්‍ර වාරිත්‍ර, ආහාර පාන, ජන ක්‍රීඩා)
- මේ සමයේ දී මානව සබඳතා ඉස්මතු වී පෙනෙන ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ ව ලියැවුණු විවිධ ලිපි ලේඛනවල දැක්වෙන කරුණු ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න. පෙළපොතේ අදාළ පාඩම ද මේ සඳහා යොදා ගන්න.
- විවිධ පළාත්වල පවතින අවුරුදු චාරිත්‍ර පිළිබඳ තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- 'සිංහල අලුත් අවුරුද්ද' මාතෘකාව යටතේ බිත්ති පුවත් පතකට ලිපියක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ රටවල සංස්කෘතික උත්සව නිරූපණය කෙරෙන චිත්‍රයක් හෝ කිහිපයක්
- විවිධ උත්සවවල චාරිත්‍ර - වාරිත්‍ර ඉටු කෙරෙන අවස්ථා දැක්වෙන ඡායාරූප, පින්තූර හෝ වීඩියෝ දර්ශනයක්

**යෝජිත පැවරුම් :**

- සිංහල අලුත් අවුරුද්ද හා සිංහල සංස්කෘතිය යන මාතෘකා යටතේ කතාවක් ඉදිරිපත් කිරීම.
- සිංහල අලුත් අවුරුදු උත්සවය පිළිබඳ පුවත්පතකට ලිපියක් ලිවීම.
- සිංහල අලුත් අවුරුද්දේ කැපී පෙනෙන සංස්කෘතික ලක්ෂණ පිළිබඳ ව බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ ව තම අදහස් ප්‍රකාශ කරයි.
- සිංහල අලුත් අවුරුදු  චාරිත්‍ර ඉටු කිරීමේ අගය පැහැදිලි කරයි.
- විවිධ සංස්කෘතිකාංග පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන කියවයි.
- විවිධ සංස්කෘතිකාංග පිළිබඳ නිර්මාණකරණයේ යෙදෙයි.

# 6. අක්ෂර වින්‍යාසය

**නිපුණතාව** : 3.0 **සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම** : 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුක්ත ව ලියයි.

**කාලච්ඡේද** : 5යි.

**ඉගෙනුම් පල :**

- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර ලේඛනයේ දී නිවැරදි ව යොදයි.
- සඤ්ඤක අක්ෂර ලේඛනයේ දී උචිත පරිදි යොදයි.
- **න, ණ, ල, ළ, ශ, ෂ, ස** යන අක්ෂර ලේඛනයේ දී නිවැරදි ව යොදයි.
- අක්ෂර වින්‍යාසය සම්මත ආකාරයට යොදා ගනිමින් ලේඛන සකස් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා සුදුසු අභ්‍යාසවල යොදවන්න.
- එම අභ්‍යාසයට අනුව අක්ෂර වින්‍යාසය පිළිබඳ ශිෂ්‍යයන්ගේ ගැටලු හඳුනා ගන්න.
- නිරවද්‍ය ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන්න.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ ගැටලු නිරාකරණය සඳහා පහත දැක්වෙන රීති පෙන්වා දෙන්න.
  - මූර්ධජ 'ණ' යන්න වචනයක මුලට යෙදෙන්නේ "ණය" යන වචනයේ පමණි.
  - 'ර' යන්නට අනතුරු ව බොහෝ විට 'ණ' යෙදේ.
  - **රණ, දෙරණ, පරණ,**
- කෘදන්ත පදවල 'ර' කාරයෙන් පර ව වුව ද යෙදෙන කෘදන්ත 'න' ප්‍රත්‍යය දන්තජ 'න' වේ.
  **කරන, වරන, උරන, දරන**
- රකාරාංශයට අනතුරු ව ''ණ'' යෙදේ.
  **සම්මන්ත්‍රණ, ශ්‍රේණිය, ප්‍රාණ, මිශ්‍රණ**
- මූර්ධජ 'ෂ' යන්නට අනතුරු ව 'ණ' යෙදේ.
  **උෂ්ණ, පරීක්ෂණ, තීක්ෂ්ණ, විශේෂණ**
- තාලුජ 'ශ' කාරයට පසු ව යෙදෙන න නියත වශයෙන් ම දන්තජ 'න' වේ.
  **ප්‍රශ්න, ප්‍රදර්ශන, විමර්ශන**

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල අක්ෂර වින්‍යාස ආකාරාදිය - සඳගෝමි කෝපරහේවා

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිරවද්‍ය ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය පිළිබඳ සම්මත රීති අනුගමනය කරයි.

## 07. ශබ්දකෝෂ භාවිතය

**නිපුණතාව :** 3.0 **සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම :** 3.2 ප්‍රායෝගික භාෂා කාර්ය මැනවින් ඉටු කර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි.

**කාලච්ඡේද :** 4යි.

**ඉගෙනුම් පල :**

- අකාරාදි පිළිවෙළ යනු කුමක් දැ යි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අකාරාදි පිළිවෙළට නාමාවලි සැකසීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- අකාරාදි පිළිවෙළට නාමාවලි සකස් කරයි.
- ශබ්දකෝෂ භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිංහල අක්ෂරමාලාව පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය විමසා බැලීම සඳහා අහඹු ලෙස ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට අක්ෂර මාලාව මතකයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අකාරාදි පිළිවෙළට විවිධ ලේඛන සකස් කර ඇති අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
  - විවිධ නාමාවලි සකස් කිරීම.
  - ශබ්ද කෝෂවල දී වචන පෙළ ගස්වා ඇති ආකාරය
  - ග්‍රන්ථයක අවසන් භාගයේ ඇති සූචිය සකස් කිරීම
  - ග්‍රන්ථ නාමාවලි සකස් කිරීම.
- අකාරාදි පිළිවෙළ භාවිත කිරීමේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
  ක්‍රමානුකූල බව, පරිහරණය පහසුව, අවශ්‍ය කරුණු පහසුවෙන් හඳුනා ගැනීම.
- ශබ්දකෝෂ පරිහරණයට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - වැලිවිටියේ සෝරත නාහිමි
- මහා සිංහල ශබ්දකෝෂය - හරිශ්චන්ද්‍ර විජේතුංග

**යෝජිත පැවරුම්**

- ශබ්දකෝෂ ඇසුරෙන් දෙන ලද වචන කීපයක අර්ථ පැහැදිලි කර ගැනීමට යොමු කරන්න.
- අකාරාදි පිළිවෙළ අනුව ලියැවුණු ග්‍රන්ථයකින් වචනයක අක්ෂර වින්‍යාසය නිවැරදි ව හඳුනා ගැනීමට යොමු කරන්න.
- ග්‍රන්ථ නාමාවලියකින් අවශ්‍ය පොතක් සොයා ගැනීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අකාරාදි පිළිවෙළ මතකයෙන් ඉදිරිපත් කරයි.
- අකාරාදි පිළිවෙළ භාවිතය මගින් ශබ්දකෝෂ පහසුවෙන් පරිහරණය කරයි.
- ශබ්දකෝෂ භාවිත කරමින් වචනවල අර්ථය ප්‍රකාශ කරයි.
- දෙනු ලබන වචනමාලාවක් අකාරාදි පිළිවෙළට සකස් කරයි.

## 08. රාත්‍රිය - ඇස්. මහින්ද හිමි

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 1.0 | **සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.** |
| **නිපුණතා මට්ටම** | : | 1.1 | සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. |
| **කාලච්ඡේද** | : | 4යි. | |

**ඉගෙනුම් පල :**

- කවි පෙළට සවන් දී රිද්මානුකූල ව ගායනා කරයි.
- පද්‍ය පන්තියේ මුඛ්‍යාර්ථය ප්‍රකාශ කරයි.
- පද්‍ය නිර්මාණයෙහි භාවිකාර්ථ පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණයට සවන් දී කාව්‍යෝක්ති පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සුදුසු ක්‍රමවේදයක් මගින් 'රාත්‍රිය' නමැති පද්‍ය පන්තිය ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- අනතුරු ව පද්‍ය පන්තිය රචනා කළ ඇස්. මහින්ද හිමියන් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- උන්වහන්සේගේ වෙනත් පද්‍ය පන්ති පිළිබඳ ව සාකච්ඡා කරන්න.
  - සමනලයා, නැළවිල්ල
- පද්‍ය පන්තිය නැවත සවන් දීමට සලස්වන්න.
- පද්‍ය පන්තියෙහි ඇතුළත් භාවිකාර්ථ හා කාව්‍යෝක්ති පිළිබඳ ව (උපමා, රූපක ආදිය) ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පද්‍ය පන්තියට සවන් දී අනතුරු ව කණ්ඩායම් වශයෙන් හා තනි තනි ව ගායනා කිරීමට යොමු කරන්න.

**මූලික වදන්/සංකල්ප**

- භාවිකාර්ථ - හැඟීම් දනවන අර්ථ
- කාව්‍යෝක්ති - කාව්‍යමය යෙදුම්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කවි පෙළෙහි නිර්මාණකරුවා පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- පද්‍ය පන්තියට සවන් දී ගායනා කරයි.
- පද්‍ය පන්තියට සවන් දී අර්ථය පැහැදිලි කරයි.
- පද්‍ය පන්තියේ භාවිකාර්ථ සහ කාව්‍යෝක්ති පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි.

## 09. පද්‍ය රචනා නිර්මාණ

**නිපුණතාව** : **12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- පද්‍ය නිර්මාණ සඳහා සරල අත්දැකීම් යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරයි.
- අත්දැකීම් පාදක කර ගනිමින් රසවත් පද්‍ය නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- කාව්‍ය නිර්මාණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.
- විවිධ මාතෘකා ඔස්සේ පද්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ඇස්. මහින්ද හිමිගේ 'රාත්‍රිය' පද්‍ය පන්තිය ඇසුරෙන් කවියා ලැබූ අත්දැකීම් හඳුනා ගැනීමට යොමු කරන්න.
- මෙවැනි පද්‍ය පන්තියක් රචනා කිරීම සඳහා ඉවහල් කර ගෙන ඇති ස්වාභාවික පරිසරයට අයත් විවිධ අංග පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එම අවස්ථාව නිරූපණය කිරීමේ දී කවියාගේ අවධානය යොමු වී ඇති විවිධ අංග කාව්‍ය උපක්‍රම සාකච්ඡා කරන්න.
  - සරල ආකෘතිය
  - සරල බස
  - උපමා
  - සංකල්ප රූප යොදා ගැනීම.
  - උචිත බව/ ඖචිත්‍ය ගුණය

  තමන් ලැබූ අත්දැකීමක් පාදක කර ගනිමින් කාව්‍ය උපක්‍රම යොදා ගෙන පද්‍ය නිර්මාණය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පද්‍ය නිර්මාණ සඳහා උචිත අත්දැකීම් ඉදිරිපත් කරයි.
- යෝග්‍ය ආකෘති හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- පද්‍ය නිර්මාණ සඳහා සුදුසු කාව්‍ය උපක්‍රම භාවිත කරයි.
- පද්‍ය නිර්මාණකරණයේ යෙදෙයි.

## 10. ආචාරශීලී කතාබහ

**නිපුණතාව** : 1.0 **සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- අවධානයෙන් යුතු ව සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ආචාරශීලී ව සංයමයෙන් ප්‍රතිචාර දක්වයි.
- අවස්ථානුකුල ව සන්නිවේදන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විවිධ අවස්ථා හා සිදුවීම්, වෙළෙඳ කටයුතු ආශ්‍රයෙන් සැකසුණු දෙබස්, හඬ පටයක් හෝ උචිත ක්‍රමයක් හෝ යොදා ගෙන ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- බැංකු, තැපැල් කාර්යාල, වෙළෙඳ ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදිය නිදසුන් ලෙස යොදා ගන්න.
- එහි දී විවිධ තනතුරු දරන අය සිටින බවත් ඔවුන් විවිධ කාර්යයන් ඉටු කරන බවත් පැහැදිලි කරන්න.
- ඔවුන් සමග කතා බස් කිරීමේ දී ආචාරශීලී වීම වැදගත් බව පෙන්වා දෙන්න.
- අදහස් පළ කිරීමේ දී පැහැදිලිවත් සංක්ෂිප්තවත් ඉදිරිපත් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- එවැනි අවස්ථා හඬ පටයක් හෝ භූමිකා රංගනයක් ඇසුරු කර ගෙන ආදර්ශනය කර පෙන්වන්න.
- මෙම පාඩම සවන් දීමේ හැකියාව ඇගයීමට ප්‍රමාණවත් ලෙස යෝග්‍ය පරිදි සකස් කොට ඉදිරිපත් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ සංවාද අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ආචාරශීලී ව හා සංයමයෙන් ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ආචාරශීලී බව ප්‍රකාශ කෙරෙන යෙදුම් සංවාදවල දී භාවිත කරයි.
- ආචාරශීලී භාවයෙන් හා සංයමයෙන් යුතු ව කතාබස් කරයි.

## 11. විවිධ පුද්ගලයන් සමග කතා බහ

**නිපුණතාව** : 5.0 **භාෂාත්මක කාර්යයේ දී වාක්කෝෂය භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම** : 5.3 භාෂා ව්‍යවහාරයේ සාමාජික විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- භාෂා ව්‍යවහාරයේ සාමාජික විවිධතා ඇති බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ගරුත්වය, පූජ්‍යත්වය සමග බැඳුණු භාෂා ව්‍යවහාර පැහැදිලි කරයි.
- භාෂා භාවිතය කෙරෙහි ගරුත්වයේ හා පූජ්‍යත්වයේ බලපෑම ප්‍රායෝගික ව යොදා ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පුද්ගල තරාතිරම අනුව භාෂාවේ විවිධතා දැකිය හැකි අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ගිහි පැවිදි වශයෙන් සලකන විට කතා බස් කිරීමේ දී පැහැදිලි වෙනසක් දක්නට ලැබෙන බවත් සමාජ සම්බන්ධතා අනුව විවිධ පුද්ගලයන් සමග කතා බහ කිරීමේ දී භාෂාවෙහි විවිධතා දක්නට ලැබෙන බව හඳුනා ගැනීමට ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- ශිෂ්‍යයන්ට පැහැදිලි කර ගැනීම සඳහා ගැලීම් සටහනක් මගින් සමාජ සම්බන්ධතා දක්වන්න.
  ඇමුණුම 1 යොදා ගන්න.
- පැවිදි සමාජය සමග කතාබහේ දී සුවිශේෂ වාග් ව්‍යවහාරයක් භාවිත කළ යුතු බව පෙන්වා දෙන්න.
  ඒ සඳහා ඇමුණුම 2 භාවිත කරන්න.
- කතා බහේ දී භාෂාවේ පැහැදිලි වෙනසක් පෙන්වන අවස්ථා කිහිපයක් ශිෂ්‍යයන් යොදා ගෙන ආදර්ශනය කරන්න.
- පුද්ගල විවිධත්වය කෙරෙහි අවධානය යොමු කරමින් කතා බස් කිරීමේ දී භාෂාවේ වෙනස තහවුරු කර ගැනීම සඳහා සුදුසු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවන්න. ඒ සඳහා පහත සඳහන් අවස්ථා හෝ එවැනි වෙනත් අවස්ථා හෝ යොදා ගන්න.
  1. ගිහි - පැවිදි - ආගමික කටයුත්තක්
  2. ගුරු - ශිෂ්‍ය - ශිෂ්‍ය නායක දිනය
  3. මවුපිය - දූදරු - නිවසේ දෛනික කටයුත්තක්
  4. ප්‍රභූ - සාමාන්‍ය - විවෘත කිරීමේ උත්සවයක්

**ඇගයීම හා තක්සේරුකරණය**

- කතා බහේ දී පුද්ගල විවිධත්වය සැලකිල්ලට ගත යුතු බව පවසයි.
- පුද්ගල විවිධත්වය ගැන සැලකිලිමත් වෙමින් කතා කරයි.
- ආචාරශීලී ව කතා කිරීම අගය කරයි.
- සමාජ සම්බන්ධතා ගොඩ නගා ගනියි.

**ඇමුණුම 1**

- සමාජය
  - ගිහි සමාජය
    - මවුපිය දූදරු (ඥාති)
    - වැඩිහිටි බාල
    - ප්‍රභූන් විවිධ තරාතිරම් (තනතුරු)
  - පැවිදි සමාජය

**ඇමුණුම 2 :**

**පැවිදි සමාජය**

| **බෞද්ධ** | **කතෝලික** |
|---|---|
| ස්වාමීන් වහන්සේ | කාදිනල්තුමා |
| ඔබ වහන්සේ | අගරදගුරුතුමා |
| තෙරණින් වහන්සේ | |
| මැණියෝ/මැණියන්වහන්සේ | |
| වඩිනවා | රදගුරුතුමා |
| වළඳනවා | පියාණනි |
| සැතපෙනවා | සහෝදරතුමා |
| අවසරයි | සහෝදරතුමිය/කන්‍යාසොයුරිය |

**ක්‍රිස්තියානි**

දේවගැතිතුමා

**හින්දු**

කුරුක්කල්තුමා

**මුස්ලිම්**

මවුලවිතුමා

**පූජ්‍යත්වය හා ගරුත්වය**

ගෞරවාර්හ
අති පූජ්‍ය
අතිගරු
ගරු

| | |
|---|---|
| **ඥාති සම්බන්ධතා** | අම්මා<br>තාත්තා<br>මාමා<br>නැන්දා<br>අයියා<br>අක්කා<br>දුව<br>පුතා<br>ආදි වශයෙන් |
| **ප්‍රභූ** | මහතා<br>මහත්මයා/මහත්තයා /<br>නෝන මහත්තයා/නෝන මහත්මිය<br>මැතිතුමා/මැතිතුමිය<br>ඔබතුමා /ඔබතුමිය/තමුන්නාන්සේ<br>එතුමා/මෙතුමා |

| | | |
|---|---|---|
| **තනතුරු අනුව :** | සභාපතිතුමා/තුමිය | ඉංජිනේරුතුමා /තුමිය |
| | ලේකම්තුමා/තුමිය | ගුරුතුමා/තුමිය |
| | අධ්‍යක්ෂතුමා/තුමිය | ග්‍රාම නිලධාරි මහතා/මහත්මිය |
| | ගණකාධිකාරිතුමා/තුමිය | සෞඛ්‍ය පරීක්ෂකතුමා/තුමිය |
| | වෛද්‍යතුමා/තුමිය | පොලිස් ස්ථානාධිපතිතුමා/තුමිය |
| | | ආදි වශයෙනි. |

# 12. ක්‍රියා පද

**නිපුණතාව** : **6.0** **සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : **6.2** ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ක්‍රියා පද වර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා නිවැරදි ව යොදයි.
- භාෂා ව්‍යවහාරයේ දී විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා යොදා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ක්‍රියා පදය ද වාක්‍යයක ප්‍රධාන අංගයක් බව පෙන්වා දෙන්න.
- විධි ක්‍රියාව කිසියම් විධානයක් හෝ ඉල්ලීමක් කිරීමේ දී යෙදෙන බව පෙන්වා දෙන්න.
- විධි ක්‍රියාව ආඥාවක ස්වරූපයෙන් ද ඉල්ලීමක ස්වරූපයෙන් ද ක්‍රියාත්මක වන බව පැහැදිලි කරන්න.
- ලේඛනයේ දී විධි ක්‍රියාවේ මෙම ස්වරූප දෙක ම අවස්ථානුකූල ව යෙදෙන බව තහවුරු කරන්න.
- ආශීර්වාද ක්‍රියාව ප්‍රාර්ථනා ක්‍රියා යනුවෙන් ද හැඳින්වෙන බව පෙන්වා දෙන්න.
- ආශීර්වාද ක්‍රියාව යහපත් ආශීර්වාදයක් සඳහා මෙන් ම අනර්ථයක් ප්‍රාර්ථනා කිරීම සඳහා ද යෙදෙන බව පැහැදිලි කරන්න.
- ආශීර්වාද ක්‍රියාව, ප්‍රාර්ථනය ලබන්නා ආමන්ත්‍රණය නො කර වුව ද යෙදිය හැකි බව පෙන්වා දෙන්න.
  ඇය සුවපත් වේවා! යි ඔහු පැතුවේ ය.
  සුවපත් වේවා! යි ඔහු පැතුවේ ය.

**විධික්‍රියා**

| **විධිමත්**<br>අණ කිරීම | **ඉල්ලීම**<br>(ආයාචනය) |
| --- | --- |
| එනු/එව/එව් | එන්න |
| යනු/යව/යව් | යන්න |
| ලියනු/ලියව/ලියව් | ලියන්න |
| කරනු/කරව/කරව් | කරන්න |
| බලනු/බලව/බලව් | බලන්න |
| පිසනු/පිසව/පිසව් | පිසින්න |

ආශීර්වාද ක්‍රියා (ප්‍රාර්ථනා ක්‍රියා)

| | |
|---|---|
| (මම) සුවපත් වෙම්වා! | (අපි) සුවපත් වෙමුවා! |
| (ඔබ) සුවපත් වෙහිවා! (වේවා) | (ඔබලා/ඔබ) සුවපත් වෙහුවා! (වෙත්වා) |
| (ඔහු) සුවපත් වේවා! | (ඔවුහු) සුවපත් වෙත්වා! |

**ගුණාත්මක යෙදවුම් :**

**අතිරේක පරිශීලනය ග්‍රන්ථ**

- සිංහල භාෂා ව්‍යාකාරණය - ඩබ්. එස්. කරුණාතිලක
- ක්‍රියා පද - ජේ. බී. දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විධි ක්‍රියාව ලේඛනයේ දී නිවැරදි ව භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා පිළිබඳ නිවැරදි දැනුම ප්‍රදර්ශනය කරයි.
- භාෂා කාර්යයේ දී විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා නිවැරදි ව භාවිත කරයි.

# 13. ආකෘති පත්‍ර

**නිපුණතාව : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම : 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.**

**කාලච්ඡේද : 4යි.**

**ඉගෙනුම් පල :**

- ප්‍රායෝගික අවශ්‍යතා සඳහා භාවිත කරන ලේඛන වර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.
- ආකෘති පත්‍රයක ඇතුළත් විය යුතු මූලික තොරතුරු විස්තර කරයි.
- විවිධ අවශ්‍යතා සඳහා ආකෘති පත්‍ර සකස් කරයි.
- ආකෘති පත්‍ර නිසි ලෙස සම්පූර්ණ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- එදිනෙදා ජීවිතයේ දී අපට සම්පූර්ණ කිරීමට සිදු වන ආකෘති පත්‍ර පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඇමුණුම 1 යොදා ගන්න.
- විවිධ ආකෘති පත්‍ර සපයා ඒවායේ ස්වරූපය හඳුනා ගැනීමට සලස්වන්න.
- කලින් සපයා ගෙන ඇති ආකෘති පත්‍ර ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- ඒවායෙහි ව්‍යුහ හඳුනා ගැනීමට යොමු කරන්න.
- එම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වැදගත් තොරතුරු මොනවා ද යන්න හඳුනා ගැනීමට සලස්වන්න. තමාට අදාළ ව ඇමුණුම 2හි ඇතුළත් තොරතුරු එක්රැස් කර ගැනීමට යොමු කරන්න.
- ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් විය යුතු පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
- ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු
  - නිවැරදි ව ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට යොමු කරන්න.
  - නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම.
  - නිවැරදි හා පිරිසිදු ව සම්පූර්ණ කිරීම.
  - මකන දියර වර්ග භාවිත නො කිරීම.
  - වැරදුණහොත් තනි ඉරකින් කපා කෙටි අත්සනක් යෙදීම.
  - එක් අත්සනක් පමණක් භාවිත කිරීමට හුරු කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ආකෘති පත්‍ර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් තම අවශ්‍යතා ඉටුකර ගැනීමට ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

## ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම

විවිධ ආයතනවලින් නොයෙක් කාර්යයන් ඉටුකර ගැනීමේ දී විවිධාකාරයේ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට සිදු වේ. ආකෘති පත්‍ර මගින් ලබා ගන්නා තොරතුරු මත එම ආයතන අපගේ කටයුතු ඉටු කර දීමට යොමු වේ. එම කාර්යය පහසුවෙන් ඉටු කර දීම සඳහා නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සම්බන්ධ ව කටයුතු කරන නිලධාරීන්ට නිවැරදි තොරතුරු සැපයීමට සිදු වන බව පෙන්වා දෙන්න. ආකෘති පත්‍ර, ඉල්ලුම් පත්‍ර හා වෙනත් ලිපි ලේඛන සකස් කිරීමේ දී අපගේ ජීව දත්ත තොරතුරු මෙන් ම අනෙකුත් වැදගත් තොරතුරු නිසි පරිදි ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. ශිෂ්‍යයන්ට අදාළ ව පහත සඳහන් තොරතුරු ගොනු කර ගැනීමට උපදෙස් ලබා දෙන්න. ඇතැම් ආකෘති පත්‍රවල අවසානයේ ඇතුළත් කරන තොරතුරු සියල්ල නිවැරදි බවත් සත්‍ය බවත් සඳහන් කළ යුතු බව පෙන්වා දෙන්න. ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී මේ බව ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න.

## ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

01 මුලකුරු සමග නම : ........................................................................................................................

02. තැපැල් ලිපිනය : ................................................ විද්‍යුත් ලිපිනය : ....................................

03. උපන් දිනය : ...............................................

04 ......................... දිනට වයසඃ ...............................................

05. ජාතික හැඳුනුම්පත් අංකයඃ ....................... පුරවැසි භාවයඃ ......................... ජාතිය : .........................

06. දුරකථන අංකය ස්ථාවර : ......................................... ජංගම : .........................................

07. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. ස්ථිර පදිංචි පළාත : ........................................................................................................................

09. දිස්ත්‍රික්කය : ..............................................................

10. ඡන්ද බල ප්‍රදේශය : ..............................................................

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ..............................................................

12. අධ්‍යාපනය ලද පාසල/පාසල් : ..............................................................

13. අධ්‍යාපන සුදුසුකම් :

| විභාගයේ නම හා වර්ෂය | විෂය | ලබාගත් සාමර්ථ්‍යය |
|---|---|---|
| | | |

ඉහත දක්වන ලද තොරතුරු නිවැරදි බවටත් සත්‍ය බවටත් ප්‍රකාශ කරමි.

...................................
අත්සන

**ඇමුණුම 2 - ආකෘති පත්‍රයක ඇතුළත් විය යුතු මූලික තොරතුරු**

1. මුල’කුරු සමග නම :
2. උපන් දිනය :
3. ස්ත්‍රී/පුරුෂ භාවය :
4. විවාහක/අවිවාහක බව :
5. පුරවැසි භාවය :
6. වෘත්තිය :
7. රාජකාරි ලිපිනය :
8. පෞද්ගලික ලිපිනය :
9. විද්‍යුත් ලිපිනය :
10. දූරකථන අංකය
11. හැඳුනුම්පත් අංකය :
12. පළාත :
13. දිස්ත්‍රික්කයඃ
14. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :
15. මැතිවරණ කොට්ඨාසය :
16. පොලිස් බල ප්‍රදේශය :
17. පළාත් සභා බල ප්‍රදේශය :
18. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :
19. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :
20. ග්‍රාම නිලධාරි අංකය :
21. ඉගෙනුම ලැබූ පාසල :
22. අධ්‍යාපන සුදුසුකම් :
23. වෙනත් සුදුසුකම් :

## 14. කෙටිකතාව

**නිපුණතාව** : 2.0 **ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 5යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෙටිකතාව කියවා අන්තර්ගතය පිළිබඳ අදහස් දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ මූලික ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ තේමාව පැහැදිලි කරයි.
- කෙටිකතාව කියවා අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් කෙටිකතාව යන සාහිත්‍යාංගය සරල ව හඳුන්වා දෙන්න.
- කෙටිකතාව නම් සාහිත්‍යාංගයෙහි සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරන්න.
- සීමිත චරිත සංඛ්‍යාවක් ඇති බව පැහැදිලි කරන්න.
- එක් චරිතයක් හෝ සිද්ධියක් පමණක් මූලික වන බව පෙන්වා දෙන්න.
- කෙටිකතාවේ ජීවන දෘෂ්ටිය සරල ව පහදා දෙන්න.
- අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම පරීක්ෂා කරන්න.
- කෙටිකතාවේ නිර්මාණාත්මක අගය ඉස්මතු කරන්න.
  - චරිත නිරූපණය
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - සංකේත, භාෂාව, භාවිතය
- කෙටිකතාව පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ ස්වාධීන අදහස් ප්‍රකාශනයට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- රතු රෝස මල - කෙටිකතා සංග්‍රහය - ගුණදාස අමරසේකර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිර්දිෂ්ට කෙටිකතාව නිශ්ශබ්ද ව කියවා අදහස් ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ චරිත ලක්ෂණ ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇති ආකාරය අගය කරමින් කතා කරයි.
- කෙටිකතා කියවීමට යොමු වෙයි.

## 15. ප්‍රබන්ධ රචනය

**නිපුණතාව** : **12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- නිර්මාණකරණයට පාදක වන අත්දැකීම් ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධකරණයට නිර්මාණාත්මක චින්තනය ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- විවිධ රචනා උපක්‍රම ඔස්සේ රසවත් නිර්මාණ ඉදිරිපත් කරයි.
- අත්දැකීම් පදනම් කොට ගෙන ප්‍රබන්ධ නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිර්මාණ කිහිපයක් ඇසුරෙන් එම නිර්මාණවලට පදනම් වූ අත්දැකීම් ක්ෂේත්‍රය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- නියමිත කෙටිකතාව ඇසුරෙන් ඊට පාදක අත්දැකීම් හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒවා මගින් කෙටිකතාවක් නිර්මාණය වී ඇති අයුරු සාකච්ඡා කරන්න.
- එහි දී යොදා ගෙන ඇති රචනෝපක්‍රම පිළිබඳ ව සකච්ඡා කරන්න.
- කෙටිකතා නිර්මාණයේ දී අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ චරිත ලක්ෂණයක් හෝ යොදා ගෙන ඇති බව පෙන්වා දෙන්න.
- කතාවේ ප්‍රධාන චරිතවලට අමතර ව ඇති අතුරු චරිත, කතා විකාශයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.
- ඊට අදාළ වන චරිත අවශ්‍ය බවත් එම චරිත, කතාවේ තේමාවට අනුව නිරූපණය කළ යුතු බවත් පෙන්වා දෙන්න.
- භාෂාව සංකේත ආදිය භාවිත කළ යුතු අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- විවිධ අවස්ථා, චරිත හා පරිසර වර්ණනා ආදිය ඉදිරිපත් කිරීමේ දී උචිත පරිදි භාෂාව භාවිත කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.
- තමා ලත් අත්දැකීම් ඔස්සේ කතාවක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රබන්ධ නිර්මාණකරණයට අත්දැකීම් පාදක වන බව ප්‍රකාශ කරයි.
- නිර්මාණාත්මක රචනය උදෙසා සංකල්ප ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධකරණය සඳහා උචිත අවස්ථා, සිද්ධි හා චරිත යොදා ගැනීමේ අවශ්‍යතා ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධ නිර්මාණය කරයි.

## 16. නාම පද

**නිපුණතාව** : **6.0** **සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : **6.1** නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 6යි.

**ඉගෙනුම් පල :**

- නාම පදවල ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාම පද වර්ගවල විවිධතා පැහැදිලි කරයි.
- ලේඛනයේ දී විවිධ නාම පද යොදා ගැනීමේ අගය පැහැදිලි කරයි.
- අවස්ථෝචිත ව විවිධ නාම පද භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නාම පද යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
- නාම පද වර්ග (ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා සංඥා නාම) නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- නාම පද වර්ග හඳුනා ගැනීම සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- ඇමුණුම 2හි දී ඇති නාම පද සුදුසු පරිදි යොදා වගුව සම්පූර්ණ කිරීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාම පදවල ප්‍රභේද නම් කරයි.
- ඒ අනුව නාම පද වර්ග කොට දක්වයි.
- විවිධ ප්‍රභේදවලට අයත් නාම පද වෙන් කොට දක්වයි.
- නාම පද සඳහා උදාහරණ දක්වයි.

ඇමුණුම 1

**නාම පද ප්‍රභේද :**

නාම නාම
සර්ව නාම
සමාස නාම
තද්ධිත නාම
කෘදන්ත නාම

**නාම නාම :**

ජාති නාම
ද්‍රව්‍ය නාම
ගුණ නාම
ක්‍රියා නාම
සංඥා නාම යනුවෙන් වර්ග වේ.

**ජාති නාම :** කිසියම් ජාතියක් වර්ගයක් නියෝජනය කිරීම සඳහා යෙදෙන නාම ජාති නාම වේ.
**නිදසුන් :** දෙව්, මිනිස්, ඇත්, ගව, ගිරා, දොඩම්, පොල් ආදිය ජාති නාමයට අයත් වේ.

**ද්‍රව්‍ය නාම :** කිසියම් ද්‍රව්‍යයක් නියෝජනය කිරීම සඳහා යෙදෙන නාම ද්‍රව්‍ය නාම යනුවෙන් හැඳින්වේ.
**නිදසුන් :** වැලි, ගල්, යකඩ, ලී, පොහොර, ජලය

**ගුණ නාම :** වෙනත් නාමයක ගුණයක් දැක්වීම සඳහා යොදා ගන්නා පද ගුණ නාම යනුවෙන් හැඳින්වේ.
**නිදසුන් :** උස, දිග, මහත, සීතල, උෂ්ණ, පටු

**ක්‍රියා නාම :** ක්‍රියා අර්ථය දනවන නාම ක්‍රියා නාම යනුවෙන් හැඳින්වේ.
**නිදසුන් :** බලන, දුවන, කැවිලි, ලියවිලි, කියුම්, කෙරුම්

**සංඥා නාම :** කිසියම් පුද්ගලයකු හෝ ස්ථානයක් හෝ හැඳින්වීමට යොදා ඇති නාම සංඥා නාම යනුවෙන් හැඳින්වේ.
**නිදසුන් :** කමල්, පියල්, ලාලනී, ප්‍රියංකා, කොළඹ, අම්පාර

ඇමුණුම 02

පහත දී ඇති පද නිවැරදි ව වගුගත කරන්න.
**පොත, සත්තු, මාලය, රතු, මහරගම, නැටුම්, කුරුල්ලා, සීනි, දුවන්නා, පෙට්ටිය, සිංහයා, වලහා, කතරගම, සිතියම, පරාක්‍රමබාහු, දකින, ජනේලය, අසන, නිර්මලා, පළල, වැලි**

| ජාති නාම | ද්‍රව්‍ය නාම | ගුණ නාම | ක්‍රියා නාම | සංඥා නාම |
|---|---|---|---|---|
| | | | | |

# 17. දේශාභිමානී ගී

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : **9.0** | **සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.** |
| **නිපුණතා මට්ටම** | : **9.3** | දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. |
| **කාලච්ඡේද** | : 4යි. | |

**ඉගෙනුම් පල :**

- දේශාභිමානී  ගීතය හැඟීම් දනවන පරිදි රිද්මානුකූල ව ගායනා කරයි.
- ගීතයේ යෙදී ඇති විශේෂ යෙදුම් උපුටා දක්වයි.
- ගීතය රස විඳ අදහස් ප්‍රකාශ කරයි.
- දේශාභිමානී ගීතයෙන් ධ්වනිත අදහස් අගය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- දේශාභිමානය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- දේශාභිමානය දැනවීම සඳහා සාහිත්‍යය යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.  ඇමුණුම 1හි ගීත යොදා ගන්න.
  ඇමුණුම 2 යොදා ගන්න.
- එම ගීතයට සවන් දීමට අවස්ථාව සලසන්න.
- එම ගීතය පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ අදහස් විමසන්න.
- ගීතය නැවත සවන්දීමට සලස්වා ගීතයෙන් ධ්වනිත වන අදහස් ඉස්මතු කරමින් රසාස්වාදය කරන්න.
  ඇමුණුම 3 ඒ සඳහා පාදක කර ගන්න.
- එවැනි වෙනත් ගීත රසාස්වාදය කිරීමට යොමු කරන්න.
- ජාතිකාභිමානය දනවන ගීත කවි එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේශාභිමානය දනවන ගීත පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- ගීතවල දේශාභිමානය දනවන යෙදුම් ඉදිරිපත් කරයි.
- දේශාභිමානී ගීත රසාස්වාදය කරයි.
- දේශාභිමානී ගීත එක්රැස් කරයි.

ඇමුණුම 1

(අ)

වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
මිණි දිලෙනා පොළොව අපි
සිරි ලංකා රට ම අපි

අපේ පැතුම් අහසට විහි දී යයි
කම්හල්වල දුම් වළලු දිගේ
අපේ ම දහදිය මුහුදු ගලා යයි
ගං හෝ ඇළ දොළ කඳුරු වගේ

දෙරණ පලා රතු කැට මතුවන්නට
ඔබ අත දෙන තුරු බලා හිඳී
බලවු යොමා නෙත රටේ ම මාවත
අපේ අතින් ගොඩ නැගෙන හැටි

ගොවියෝ - අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

ගත වැකි දුහුවිලි මිණි බරණයි
දහදිය මඩ විලෙවුන් සුවඳයි
රට වෙනුවෙන් ගත සිත වෙහෙසෙයි
සිත සතුටේ උල්පත එතැනයි

ගොවියෝ - අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

ගී පද රචනය : මහගම සේකර

(ආ) රුවන් නිදන හෙළ බිමයි
නුවන් හදන හෙළ බිමයි
නිවන් පුදන හෙළ බිමයි
ලොව හෙළි කළ හෙළ බිමයි //

මගේ රුවන හෙළ බිමයි
මගේ නුවන හෙළ බිමයි
මගේ නිවන හෙළ බිමයි //

මිහිරෙන් පිරි හෙළ බිමයි
රුහිරෙන් සැදි හෙළ බිමයි
ඉසුරින් සරි හෙළ බිමයි
ලොව බල පෑ හෙළ බිමයි //

මගේ මිහිර හෙළ බිමයි
මගේ රුහිර හෙළ බිමයි
මගේ ඉසුර හෙළ බිමයි //

විරුවන් ලත් හෙළ බිමයි
පඬිඳුන් පත් හෙළ බිමයි
යුදුවන් මත් හෙළ බිමයි
ලොව හෙබැවූ හෙළ බිමයි //

මගේ තිදැස හෙළ බිමයි
මගේ සිරස හෙළ බිමයි
මගේ නිවස හෙළ බිමයි //

**ගී පද - කො. වෙ. පඤ්ඤාපාල**

ඇමුණුම 2

සක්විති කිත් රැස යුත් සිරි ළංකා
වික්මැති පුත් පෙළ ලත් සිරි ළංකා
සෙත් සිරි ළංකා //
සසිරි අසිරි සිරිනී සිරි ළංකා

මහ සම්මත මනු ලෝ මුල් නිරි ඳුන්
රජ පරපුර දඹදිවට ද හෙළි දුන්
තෙදණින්, කිරණින් පැරැයූ දිනි ඳුන්
අමල කොමළ ලලනී සිරි ළංකා
මිහිරි රුසිරි කුමරී සිරි ළංකා
සසිරි අසිරි සිරිනී සිරි ළංකා

රන් ගොයමින් පැහැ ගෙනැ බබලන්නී
ගංගා ඇළ දොළ සේල අඳින්නී
සදහම් මිණි කැන් බෙදමින් යන්නී
අමල කොමළ ලලනී සිරි ළංකා
මිහිරි රුසිරි කුමරී සිරි ළංකා
සසිරි අසිරි සිරිනී සිරි ළංකා

**අරිසෙන් අහුබුදු**

ඇමුණුම 2

## මහගම සේකර

1929 අප්‍රේල් 7 වැනි දා කොළඹ දිස්ත්‍රික්කයෙහි සියනෑ කෝරලයේ රදාවානේ දී උපත ලැබ 1976 ජනවාරි 14 වැනි දා හෘදයාබාධයකින් කලුරිය කළේ ය. රදාවානේ රජයේ පාසලේත්, කිරිදිවැල රජයේ මිශ්‍ර පාඨශාලාවේත් ඉගෙනුම් ලැබී ය. 1945 දී රජයේ ලලිත කලායතනයට බැඳුණි. අනතුරු ව නිට්ටඹුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් ගුරු පුහුණුව ලැබී ය. වෘත්තීය ජීවිතය ආරම්භ කළේ චිත්‍රකර්ම ගුරුවරයෙකු වශයෙනි. පසු ව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයෙකු වශයෙන් ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩ සටහන් සම්පාදකවරයෙකු වශයෙන් රජයේ ලලිත කලායතනයෙහි විදුහල්පති වශයෙන් ද අධ්‍යාපන අමාත්‍යාංශයෙහි සෞන්දර්ය ඒකකයෙහි ප්‍රධානියා වශයෙන් ද සේවය කළේ ය. වෘත්තීය කටයුතුවල නියැළෙන අතර ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් බී. ඒ. උපාධිය ලබා ගත්තේ ය. විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි පී. එච්. ඩී. උපාධිය සඳහා ශාස්ත්‍රීය නිබන්ධනයක් සම්පාදනය කළේ ය. ග්‍රන්ථකරණයට එළඹියේ 1956 දී 'ධවල සේනාංකය' නමැති පරිවර්තනය කෘතිය පළ කරමිනි. එතැන් පටන් පළ කළ කෘති මාලාව අතර ව්‍යංගනා (කේ. ජයතිලක සමග) සාක්වාළිහිණි, බෝඩිම, නොමියෙමි, ප්‍රබුද්ධ යන කවි පොත් ද තුංමංහන්දිය, මනෝ මන්දිර යන නවකතා පොත් ද පුංචි අයට කයි කතන්දර, සරු පොළොවක් අපට ඇතේ යන ළමා පොත් ද මහගම සේකරගේ ගීත නමැති ගීත සංග්‍රහය ද වෙයි. 1970 දී සිය නවකතාව පාදක කර ගෙන තුංමංහන්දිය චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ ය. චිත්‍රපට අධ්‍යක්ෂණය සඳහා ද ගීත රචනය සඳහා ද සම්මාන හිමි කර ගත්තේ ය.

නූතන කාව්‍ය සංහිතා - සුනිල් ආරියරත්න පිටු අංක 161 - 162

ඇමුණුම 3

රසාස්වාදය සඳහා මග පෙන්වීම

අරමුණු හා අත්දැකීම්

- වැඩ කරන ජනතාවගේ ශ්‍රමාභිමානය දක්වීම
- ගීතය සඳහා පාදක අත්දැකීම
  - මවුබිම ගොඩ නැගීම සඳහා ශ්‍රමය වගුරන ජනතාවගේ උදාර හැඟුම් මෙම පද්‍ය පන්තිය සඳහා අත්දැකීම් බවට පත් ව ඇත.

කාව්‍ය උපක්‍රම

- **රූපකාර්ථවත් භාෂාව**

  - වැසි වසිනා අහස අපි
    මුතු බඳිනා මුහුද අපි
    මිණි දිලෙනා පොළොව අපි
    සිරි ලංකා රට ම අපි

කාව්‍යමය යෙදුම්

- මුතු බඳිනා අහස
- මිණි දිලෙනා
- රණ බරණයි
- මිණි කැට මතු වන්නට

සරල භාෂාව

- අපේ මාවත
- වැසි වසිනා අහස
- කම්හල්වල දුම් වළලු
- අපේ ම දහඩිය
- ගං හෝ ඇළ දොළ
- සිත සතුටේ

## 18. පද

විශේෂණ පද
බහ්වර්ථ පද
තනි පද
විරුද්ධාර්ථ පද

**නිපුණතාව** : 5.0 **භාෂාත්මක කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- විවිධ පද වර්ග හඳුනා ගෙන ව්‍යවහාර කරයි.
- භාෂා ඥානය පෝෂණය කිරීම සඳහා වාක්කෝෂීය දැනුම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- පද වර්ග යෝග්‍ය පරිදි ලේඛනයේ දී භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සමානාර්ථ, විරුද්ධාර්ථ ආදි පද පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම පරීක්ෂා කරන්න.
- නියමිත පාඩම් ඇසුරු කර ගෙන සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද, තනි පද (වචන සමූහයකට එක් පදයක් යෙදීම) විශේෂණ පද හා බහ්වර්ථ පද හඳුනා ගැනීමටත් භාවිතයටත් යොමු කරන්න.
  ඒ සඳහා පෙළපොත ද ඇමුණුම 1හි ඇතුළත් පද ගොනු ද යොදා ගන්න.
- පාඩමට අනුව උචිත පද ගොනු තෝරා ගෙන ඒ ඇසුරෙන් පද පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීමට සුදුසු අභ්‍යාසවල යොදවන්න.
- ලේඛනයේ දී එම පද අර්ථවත් ව භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- ප්‍රායෝගික ලේඛන හා රචනා ලිවීමේ දී උචිත පද අර්ථවත් ව යෙදීමට හුරු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල විරුද්ධාර්ථ පද කෝෂය - ඩබ්. එස්. කරුණාතිලක
- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු
- අර්ථ විචාරය හා ශබ්ද කෝෂය - ජේ. බී. දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ පද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද අර්ථවත් ව භාවිත කිරීමේ අගය පැහැදිලි කරයි.
- පුළුල් වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.
- භාෂාවේ යෙදෙන විවිධ පද පිළිබඳ දැනුම භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**ඇමුණුම 1 සමානාර්ථ පද**

ඊය - ඊ ගස, ඊතලය, ශරය

උදුල - දිලිසෙන, දීප්තිමත්, බබළන

උවන - මුහුණ, වත, වුවන

කත - කාන්තාව, මහිලාව, වනිතාව, ස්ත්‍රිය

කනක - රත්රන්, රන්, ස්වර්ණ

චතුර - දක්ෂ, බුහුටි, සමත්, සමර්ථ, හපන්

චන්ද්‍ර - නිශාකර, නිසයුරු, සිසි, සිසිරකර, සොමි, සඳ,

නන්ද - මනා, මනෝඥ, යහපත්, සුන්දර, හොඳ, සතුට

නන්දන - පිනවන, ප්‍රබෝධවත්, ප්‍රියජනක, සතුට දනවන

නය - ක්‍රමය, න්‍යාය, විධිය, නීතිය

නුබ - අඹර, අවකාශය, ආකාශය, පවන් මග, සුරමග,

නුවන - අක්ෂිය, ඇස, නයන, නෙත, නේත්‍රය

පද්මය - කමල, නෙළුම, පියුම, සියපත

පවත - ආරංචිය, තොරතුරු, පුවත, ප්‍රවෘත්තිය

පවර - උතුම්, උත්තම, ප්‍රවර, ශ්‍රේෂ්ඨ

පහණ - ගල, පාෂාණය, ශෛල

බිඟු - මධුලෝල, මීමැසි, භෘංග

රැස - ගොඩ, මුළු, රාශිය, රොත්ත, සමූහය

**බහ්වර්ථ පද**

මද - මදය, අඩු, අනංගයා, මත්බව

වර - උතුම්, වාරය, කාලය, පොරොන්දුව, වරප්‍රසාදය

අඹ - අඹ, (පලතුරු), ජලය, වලාකුළ, ස්ත්‍රිය, ලුහු බැඳීම

අදර - ආදරය, තොල්, ආධාරය

ගත - සිරුර, ග්‍රන්ථය, ගෙවී ගිය

දන - ජනයා, දානය, ධනය, පිච්චීම

දද - කොඩි, කුරුල්ලා, කුෂ්ඨය, බමුණා, මෝඩයා

මල - කුසුම, පුෂ්පය, උගුල, තොණ්ඩුව, පාශය

මරු - සුළඟ, මාරුතය, පවන, මාරයා, මරණය

ලද - විලඳ, ලැබුණු, ලැජ්ජාව, තරුණ, ළපටි

වස - අවුරුද්ද, වසර, වාසය, වර්ෂා කාලය, වංසය, විෂ, ඇඳුම්

සක් - චක්‍රය, ඇස, හක්ගෙඩිය, ශක්‍රයා,

වත - මුහුණ, තොරතුරු, ප්‍රතිපත්තිය, වස්ත්‍ර, වස්තුව, සිරිත

**විරුද්ධාර්ථ පද**

| | | |
|---|---|---|
| උත්තම | - | අධම |
| අනුලෝම | - | ප්‍රතිලෝම |
| ප්‍රශංසාව | - | (නින්දා) අවමානය |
| ප්‍රවීණ | - | ආධුනික |
| උත්තීර්ණ | - | අවතීර්ණ |
| මිහිරි | - | අමිහිරි |
| ජ්‍යෝෂ්ඨ | - | කනිෂ්ඨ |
| උපකාරය | - | අපකාරය |
| කුටිල | - | අකුටිල |
| කුලීන | - | කුලහීන |
| ප්‍රාචීන | - | ප්‍රතිචීන |
| මෛත්‍රිය | - | ක්‍රෝධය |
| උඩුකුරු | - | යටිකුරු |
| කලංක | - | අකලංක |
| උච්ච | - | අනුච්ච/අවච/නීච |
| කැළැල් | - | නිකළැල් |

**තනි පද**

| | | |
|---|---|---|
| තුන් පැත්තකින් මුහුදින් වට වූ | - | අර්ධද්වීපය |
| වැරදි දෘෂ්ටි දරන්නෝ | - | මිථ්‍යාදෘෂ්ටිකයෝ |
| කළ ගුණ දන්නා | - | කෘතවේදී |
| ධනයට අධිපතියා | - | ධනේශ්වර, ධනපති |
| ශ්‍රද්ධාව ඇති | - | ශ්‍රද්ධාවන්ත |
| තම මතයට අනුව ක්‍රියා කරන | - | අත්තනෝමතික |
| පෙර තිබූ තත්වයට සකස් කිරීම | - | ප්‍රතිසංස්කරණය |
| උඩඟුබව නොමැති | - | නිහතමානි |
| රාත්‍රියෙහි හැසිරෙන | - | නිශාචර |
| ගෞරවය ලැබීමට සුදුසු | - | ගෞරවාර්හ |
| කිසි ම ප්‍රයෝජනයකට නොමැති | - | නිෂ්ප්‍රයෝජන |
| කිසි ම අර්ථයකට නැති | - | නිරර්ථක |
| ගලින් කරන ලද | - | ශෛලමය |
| තමාගේ ලාභ ප්‍රයෝජනය සඳහා පමණක් ක්‍රියා කරන | - | ආත්මාර්ථකාමී |
| අනුන්ගේ යහපත සඳහා ක්‍රියා කරන | - | පරාර්ථකාමී |
| එක ම කාලයට අයත් | - | සමකාලීන |
| නැවත ප්‍රයෝජනය පිණිස සකස් කිරීම | - | ප්‍රතිචක්‍රීකරණය |

**විශේෂණ පද**

උස - උස ගස, උස මිනිහා, උස ගොඩනැගිල්ල, උස ළමයි

මිටි - මිටි පඳුරු, මිටි ගොයම්, මිටි මිනිස්සු

විශාල - විශාල වැව්, විශාල කඳු, විශාල සත්තු, විශාල මන්දිර

හොඳ - හොඳ ළමයි, හොඳ මිනිස්සු, හොඳ පාරවල්, හොඳ නගර

දක්ෂ - දක්ෂ ක්‍රීඩකයෝ, දක්ෂ වෛද්‍යවරු, දක්ෂ ශිෂ්‍යයෝ, දක්ෂ ගුරුවරු

## 19. සද්ධර්ම රත්නාවලිය/මනමේ නාට්‍යය

**නිපුණතාව** : **2.0** **ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : **2.2** විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවයි.

**කාලච්ඡේද** : **5යි.**

**ඉගෙනුම් පල :**

- උද්ධෘතවල ශෛලිය හඳුනා ගෙන කියවයි.
- ශෛලිවල විවිධත්වය රස වින්දනයට හේතු වන බව ප්‍රකාශ කරයි.
- විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- තෝරා ගත් ග්‍රන්ථ කිහිපයක් නම් කර එම නිර්මාණවල රචනා ශෛලිය අධ්‍යයනය කිරීමට යොමු කරන්න.
- එම ග්‍රන්ථ කියවීමේ දී කිසියම් ශෛලියකට අනුගත ව කියවීමට හැකි බව පෙන්වා දෙන්න.
- දීඝායු කුමාරයාගේ කතාවෙන් කොටසක් කියවීමට සලස්වන්න.(පෙළ පොත ඇසුරෙන්)
- මනමේ නාට්‍යයේ කොටසක් කියවීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට ඒවායේ ශෛලි හඳුනා ගැනීමට උදවු කරන්න.
  ඇමුණුම 1 සහ 2 යොදා ගන්න.
- ඒ අනුව භාෂා ශෛලියේ විවිධත්වය හඳුනා ගැනීමට සලස්වන්න.
- විවිධ ශෛලියෙන් රචිත වෙනත් සාහිත්‍ය නිර්මාණ හඳුන්වා දෙන්න.
- උචිත ශෛලියකට අනුව කියවීමට අවස්ථාව සලස්වා දෙන්න.
- විවිධ ශෛලිවලට අනුව කියවීමේ තරගයක් පන්ති කාමරය තුළ සංවිධානය කර විවිධ ශෛලියෙන් කියවීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- මනමේ නාට්‍ය - එදිරිවීර සරච්චන්ද්‍ර
- මනමේ නාට්‍ය සේවනය - සුචරිත ගම්ලත්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ශෛලියෙන් රචිත පොතපත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවීමෙන් ලබන රසය පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- විවිධ ශෛලිවලින් රචිත පොතපත කියවයි.
- විවිධ ශෛලියෙන් යුතු පොතපත කියවමින් විවේකය ප්‍රයෝජනවත් අයුරින් ගත කරයි.

.

**ඇමුණුම 1**

තව ද ජීවිතය විදුලියක් මෙන් චිරස්ථිතික නොවන නියාව ද හවුරුදු අසංඛ්‍යයක් සිටියත් දියබුබුළක් මෙන් බිඳෙනසුලු නියාව ද තණග පිනිබින්දුවක් මෙන් ආයුඃක්ෂයෙහි සිඳෙන නියාව ද දියෙහි ඇඳි ඉරක් මෙන් මැකෙන නියාව ද දක්වන්නමෝ පූතිගත්තතිස්ස තෙරුන්වහන්සේගේ වස්තුව දක්වමු.

**කෙසේ ද යත් -**

සැවැත් නුවර වැසි එක් කුලදරුවාණ කෙනෙක් බුදුන් වදාරන බණ අසා සස්නෙහි ළ දී මහණ ව උපසම්පදාව ලදින් තිස්ස තෙරුන්වහන්සේ යැයි ප්‍රසිද්ධ වූ සේක. කල්යාමකින් ඔබගේ ඇඟ මරණින් මුත් පිළියමින් අසාධ්‍ය ඉතා බලවත් රෝගයෙක් ඇති විය. කෙසේ ඇති වී ද යත් - හබ සා විතර සීන් කස් ඇති ව ලා පසු ව මුං සා ව පසු ව මැඇට සා ව පසු ව ඇඹුලසාව පසු ව බෙල් සා ව ලා පැසී ගොසින් පැළී සිල් වන්ට වන. සියල් සිරුර වේයන් කෑ පරඬල්පතක් මෙන් සිදුරු විසිදුරු විය. එවක් පටන් පූතිගත්තතිස්ස තෙරුන්වහන්සේ යැයි ප්‍රසිද්ධ වූ සේක. පසු ව දවස් ගණනෙකින් ඇටත් බිඳිණ. බැලීමටත් අක්ෂම වූ සේක. හඳනා පොරෝනා සිවුරු පූයා හා ලෙයෙන් වැකී පුස්කා ගිය පැණිකැවුම් සේ විය. ශිෂ්‍ය වහන්දෑත් බැලිය නොහී අත්හළ සේක. උන්වහන්සේ ද කිසි පිහිටක් නැති ව මඤ්චපරායන ව හොත් සේක.

පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව - සද්ධර්ම රත්නාවලිය

**ඇමුණුම 2**

රාජගුරු - වචනය

පින්වත් කුමාරයාණෙනි, සකල ශිල්පයෙහි අග තැන් පත් වූ ඔබහට විශේෂයෙන් ධනු ශිල්පයෙහි හා කඩු හරඹයෙහි හසළ බුද්ධියක් ඇති හෙයින් ''ධනුද්ධර''යන නාමය මෙ දින ප්‍රදානය කරමි. සකල සම්පත්තියෙන් වැජඹේවා, ධනුද්ධර කුමරුනි

ශිෂ්‍ය සමූහය - සින්දුව

ධනුද්ධර වේ දිවාකර සේ වික්‍රමාන්විත රාජයා
වික්‍රමාන්විත රාජයා වික්‍රමාන්විත රාජයා

රාජගුරු - වචනය

පින්වත් ධනුද්ධර කුමාරයාණෙනි, සියලු යස ඉසුරින් පිරී ඉතිරෙන්නා වූ, මුළු ජම්බුද්වීපයට ම චූඩා මාණික්‍යයක් බඳු වූ බරණැස් පුරයට යෙහෙන් පැමිණ දස රාජ ධර්මයෙන් රාජ්‍යය කරනු මැනවි.

කුමරා - වචනය

මට යන්ට අවසර දෙනු මැනවි, රාජගුරු තුමාණෙනි,

**රාජගුරු - වචනය**

මොහොතක් නවතිනු මැනවි, කුමරුනි. ඔබ ඉතා දක්ෂ වූ ශිෂ්‍යයා පමණක් නොව, මා සිතට ඉතා ප්‍රිය වූ ශිෂ්‍යයා ද වේ. ඔබ කෙරෙහි මා සිත ඉතා පැහැදුණේ ය. එහෙයින් හුදෙක් ධනුද්ධර යන නාම ප්‍රදානය කිරීමෙන් සෑහීමට පත් නො වෙමි.

ශිෂ්‍යයන් අතුරෙන් කෙනෙක් ගොස්, මාගේ දූ කුමරියට මෙහාට වහා එන මෙන් අණ කරනු මැනවි.

**ශිෂ්‍යයෝ වචනය**

එසේ ය, යහපති රාජගුරු තුමාණෙනි,
**පොත් ගුරු - ඉන්නිසය**

පොරණ දඹදිව අතීතයෙ සිට පැවත එ නා
තක්සලා පාසැලෙහි ගුරුකුල සිරිත මෙ නා
දිසාපාමොක් ඇදුරු තම දුව කැඳවමි නා
සරණ කර දෙනු රිසිය අග සිසුට සතොසි නා

(කුමරිය පැමිණේ)

**කුමරි - වචනය**

මා කැන්දුවේ කිම ද නොදනිමි, පියතුමාණෙනි.

- මනමේ නාට්‍යය - එදිරිවීර සරච්චන්ද්‍ර -

## 20. හිතෝපදේශය

**නිපුණතාව** : **2.0** **ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : **2.1** නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** : **4යි.**

**ඉගෙනුම් පල :**

- පැහැදිලි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- විරාම ලකුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.
- අර්ථාවබෝධය ඇති ව ශබ්ද නගා කියවයි.
- අන්‍යයන් කෙරෙහි අවධානයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළපොතේ සුදුසු ඡේදයක් තෝරා ගෙන ශිෂ්‍යයකු ලවා ශබ්ද නගා කියවීමට සලස්වන්න.
- අනතුරු ව ශබ්ද නගා කියවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
  ඒ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- හිතෝපදේශය ඇසුරෙන් ශබ්ද නගා කියවීම හුරු කරන්න.
- ඇමුණුම 2හි ශ්ලෝකය සුදුසු ආකාරයකට ප්‍රදර්ශනය කරන්න.
- ශිෂ්‍යයන්ට එම ශ්ලෝකය හා ගද්‍ය පාඨය තම අභ්‍යාස පොතෙහි ලියා ගන්නට සලස්වන්න.
- එම ශ්ලෝකය හා ගද්‍ය පාඨය ශබ්ද නගා කියවීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශබ්ද නගා කියවීමට සුදුසු ලේඛන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විරාම ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව කියවයි.
- ශබ්ද නගා කියවීමේ හැකියාව ආදර්ශනය කරයි.
- අන් අයගේ ප්‍රයෝජනය සඳහා ශබ්ද නගා කියවයි.

**ගුණාත්මක යෙදවුම් :**

- හිතෝපදේශ (පරිවර්තනය) - හේමපාල මුනිදාස
  විජයබා කොල්ලය - ඩබ්ලිව්. ඒ. සිල්වා
  රෝහිණී - මාර්ටින් වික්‍රමසිංහ

**ඇමුණුම 1**

**ශබ්ද නගා කියවීම**

ශබ්ද නගා කියවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු

- නිවැරදි ව අවබෝධයෙන් යුතු ව කියවීම.
- හඬ නගා උච්චාරණය කිරීම.
- මහාප්‍රාණ අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කිරීම.
- රකාරාංශය සහිත අක්ෂර නිවැරදි ව උච්චාරණය කිරීම.
- රේඵය සහිත වචන නිවැරදි ව උච්චාරණය කිරීම
- සංයුක්ත අක්ෂර නිවැරදි ව උච්චාරණය කිරීම.
- හඬ නගා නො බිය ව කියවීමට යොමු කිරීම.
  හඬ නගා කියවීම ප්‍රගුණ කිරීමෙන් නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ඇති වන බව පෙන්වා දෙන්න.
  නිවැරදි ව උච්චාරණය කිරීම නිසා අන්‍යයන්ගේ අවධානය යොමු කර ගැනීමට හැකි බව පැහැදිලි කර දෙන්න.

**ඇමුණුම 2**

ශෛලේ ශෛලේ න මාණික්‍යම් - මෞක්ත්තිකං න ගජේ ගජේ
සාධවෝ නහි සර්වත්‍ර - චන්දනං න වනේ වනේ
- හිතෝපදේශය

ගලක් ගලක් පාසා මැණික් නැත්තේ ය. ඇතෙක් ඇතෙක්
පාසා ගජමුතු නැත්තේ ය. සත් පුරුෂයා හැම තැනකදී ම
නොමැත්තේ ය. වනයක් වනයක් පාසා සඳුන් ගස් නැත්තේ ය.

නෛක බ්‍රහ්ම සුරාසුරෝරග දේව දානවාදි දිව්‍යසමූහයන්ගේ ශරීරප්‍රභායෙන් හා, අපරිමිත රාජාර්ධිසම්පන්න රාජාධිරාජ ප්‍රශස්ත උත්තම රාජයන්ගේ කිරුළුකුළුමිණිරසින් හා, රන්රිදී මිණි තරු පෙළින් විසිතුරු වූ විතානපංක්තීන් හා නානා ස්ථානයෙහි එල්වන ලද චම්පක - පාරිජාත - මන්දාර - කේතකාදි කුසුම දාමයෙන් හා, ගන්ධ මාලා ධූප දීපාදි නානා ප්‍රකාර පූජාවස්තු විශේෂයෙන් හා, සුවඳ තෙලින් දිලියෙන රන් වැට ප්‍රදීප ඒකප්‍රසන්න වූ, රාජභවන ශ්‍රී මඬනා වූ දිව්‍යභවන ශ්‍රී කැඳවන්නා වූ බ්‍රහ්මා'මරනාග නයන රසායන වූ මෙසේ වූ අලංකෘත ධම්සභාමණ්ඩලයට සුවිනීත වූ ඇත්මුළක් ළඟට වදනා ගන්ධ හස්ති රාජයක්හු සේ වැඩ. අලංකෘත වූ රත්න මණ්ඩප මධ්‍යයෙහි පනවන ලද බුද්ධාසනයට පැන නැගී, සුපිෂ්පිත වූ ශාලද්‍රැමරාජයක්හු සේ දිලිහි දිලිහී වැඩහිඳ.

ගංගාරෝහණ පූජා කථා - පූජාවලිය

## 21. වාක්‍ය රීති

**නිපුණතාව** : **6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : **6.5** සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** : 5යි.

**ඉගෙනුම් පල :**

- ලිංග භේදය, වචන භේදය හා පුරුෂ භේදය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.
- උක්ත නාම පදයේ ප්‍රාණවාචී හා අප්‍රාණවාචී බව කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියා පදය යොදයි.
- උක්ත අනුක්ත භේදය හඳුනා ගනිමින් වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- උක්තය, කර්මය හා ක්‍රියා පදය යනුවෙන් වාක්‍යයක ප්‍රධාන අංග තුනකි.
- කර්තෘ කාරක වාක්‍යයක ක්‍රියාව කරන්නා හෙවත් කර්තෘ උක්ත රූපයෙන් සිටී. උක්ත කර්තෘ හැමවිට ම ප්‍රථමා විභක්ති රූපය ගනී.
  උක්ත පදයයෙහි ලිංග භේදය හා වචන භේදය අනුව ක්‍රියා පදය ද වෙනස් වේ.
- වාක්‍ය ලිවීමේ දී උක්තය, කර්මය හා ක්‍රියාව කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- වාක්‍යයක උක්ත පදය හා ක්‍රියා පදය අතර සම්බන්ධයක් ඇති බව පෙන්වා දෙන්න.
- උක්ත නාම පදයේ ලිංග භේදය අනුව ක්‍රියා පදය වෙනස් වන අයුරු පැහැදිලි කරන්න. ඇමුණුම 1සහ 2හි වගු යොදා ගන්න.
- උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
- අභ්‍යාසවල යොදවමින් වාක්‍ය රීති පිළිබඳ දැනුම තහවුරු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල ලේඛන ව්‍යවහාරයඃ උපදේශ සංග්‍රහය (2014) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සර්ව නාම පුරුෂත්‍රයෙහි යෙදෙන ආකාරය ඉදිරිපත් කරයි.
- උක්ත පදයට අනුව ක්‍රියා පදය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- සර්ව නාම පදවලට අදාළ ව ආඛ්‍යාතය යොදා වාක්‍ය ලියයි.
- ලිංග භේදය හා උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව වාක්‍ය ලියයි.

ඇමුණුම - 01

නාම පද ලිංග භේදය අනුව

| පුරුෂ ලිංග උක්ත නාම පද | | ස්ත්‍රී ලිංග උක්ත නාම පද | | නපුංසක ලිංග උක්ත නාම පද | |
|---|---|---|---|---|---|
| ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| මිනිසා | මිනිස්සු | ගැහැනිය | ගැහැනු | ගස | ගස් |
| ගොවියා | ගොවියෝ | ගෙවිලිය | ගෙවිලියෝ | මල | මල් |
| ශිෂ්‍යයා | ශිෂ්‍යයෝ | ශිෂ්‍යාව | ශිෂ්‍යාවෝ | නිවස | නිවෙස් |
| දරුවා | දරුවෝ | දැරිය | දැරියෝ | පොත | පොත් |
| ගුරුවරයා | ගුරුවරු | ගුරුවරිය | ගුරුවරියෝ | පෑන | පෑන් |
| ගායකයා | ගායකයෝ | ගායිකාව | ගායිකාවෝ | ගෙඩිය | ගෙඩි |
| ගොනා | ගොන්නු | එළදෙන | එළදෙන්නු | පුටුව | පුටු |
| කුරුල්ලා | කුරුල්ලෝ | කිරිල්ලිය | කිරිල්ලියෝ | හැඹිලිය | හැඹිලි |
| බළලා | බළල්ලු | බැළලිය | බැළලියෝ | වළඳ | වළං |
| කවුඩා | කවුඩෝ | කැවිඩිය | කැවිඩියෝ | කුඹුර | කුඹුරු |
| ඌරා | ඌරෝ | ඊරිය | ඊරියෝ | ළිඳ | ළිං |

ඇමුණුම 2

**සර්ව නාම හා ක්‍රියා රූප පුරුෂත්‍රයෙහි යෙදීම**

| පුරුෂ භේදය | සර්ව නාම | ඒක වචන ක්‍රියා රූපය | සර්වනාම | බහු වචන ක්‍රියා රූපය |
|---|---|---|---|---|
| උත්තම පුරුෂ | මම | කරමි | අපි | කරමු |
| මධ්‍යම පුරුෂ | ඔබ<br>නුඹ | කරහි | ඔබ/ඔබලා<br>නුඹලා | කරහු |
| ප්‍රථම පුරුෂ | ඔහු, හේ, හෙතෙම<br>ඇය, ඇ | කරයි | ඔවුහු | කරති |

- සර්වනාම පද උත්තම, මධ්‍යම, හා ප්‍රථම පුරුෂ යන පුරුෂත්‍රයෙහි යෙදෙන අයුරුත්
- ක්‍රියා රූපය පුරුෂත්‍රයෙහි යෙදෙන අයුරුත් විමසා බලන්න.

**උත්තම පුරුෂ**

**උදාහරණ :**

**මම** සේවයට වාර්තා **කරමි.** (ඒක වචන)
**මම** පාසලට **යමි.** (ඒක වචන)
**අපි** විනෝද චාරිකාවක **යෙදුණෙමු.** (බහු වචන)
**අපි** ගිලනුන්ට උපස්ථාන **කරමු.** (බහු වචන)

**මධ්‍යම පුරුෂ**

**උදාහරණ :**

නුඹ පාසල් යන්නෙහි (ඒක වචන)
ඔබ පොත කියවහි (ඒක වචන)

නුඹලා පාසල් යන්නෙහු (බහු වචන)
ඔබලා පොත් කියවහු (බහු වචන)

**උදාහරණ :** **ප්‍රථම පුරුෂ**

ඔහු විනෝදයෙන් ජීවත් වෙයි. (ඒක වචන)
ඔවුහු වීදි සංචාරයෙහි යෙදෙති. (බහු වචන)
හේ ගොවිතැන් කරයි. (ඒක වචන)
ඕ පුතු නළවන්නී ය/නළවයි. (ඒක වචන)
ඇ ගොයම් නෙළන්නී ය. /නෙළයි. (ඒක වචන)
ඇය නිවස පිරිසිදු කරන්නීය./කරයි. (ඒක වචන)
ඔවුහු පැදුරු වියති. (බහු වචන)

## 22. කතරගම පුදබිම

**නිපුණතාව** : **9.0** **සංස්කෘතික සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම** : **9.4** විවිධ ජන වර්ගවලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- ජන වර්ගවලට අයත් සිරිත් විරිත් හඳුනා ගෙන විස්තර කරයි.
- විවිධ පුද සිරිත් අගය කරමින් කතා කරයි.
- විවිධ පුදපූජා පිළිබඳ සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි.
- විවිධ ජන වර්ගවලට අයත් සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විවිධ පුද සිරිත් පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එවැනි ප්‍රධාන පූජා උත්සව කීපයක් ගැන තොරතුරු විමසන්න.
- ඇසළ උත්සවය උත්කර්ෂවත් ලෙස පැවැත්වෙන මහනුවර ඇසළ මහ පෙරහැර හා කතරගම ඇසළ මහ පෙරහැර පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- කතරගම ඇසළ පෙරහැර සඳහා ආගම් භේදයකින් හා වර්ග භේදයකින් තොර ව විවිධ ජන වර්ග සහයෝගය දක්වන බව පෙන්වා දෙන්න.
- කතරගම ඇසළ පෙරහැර සඳහා ද සිංහල, දෙමළ, මුස්ලිම් හා ආදිවාසීන් ඇතුළු ජන කණ්ඩායම් සහභාගි වන බව පැහැදිලි කරන්න.
- කතරගම පුදබිම හා පුදපූජා පිළිබඳ තොරතුරු ශිෂ්‍යයන්ට ඉදිරිපත් කරන්න. ඒ සඳහා ඇමුණුම 1හි ඇතුළත් තොරතුරු යොදා ගන්න.
- කතරගම දේවාලය ඇසුරු කර ගෙන පුද පූජා පැවැත්වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- කතරගම පුදබිම හා පුද පූජා - අලුත්වැවේ සෝරත නාහිමි
- කතරගම හා එහි උත්සව - අසෝක මාලිමගේ (පරිවර්තන)

**යෝජිත පැවරුම් :**

- කතරගම ඇසළ පෙරහැර පිළිබඳ ව තොරතුරු ඇතුළත් කරමින් පොත් පිංචක් සකස් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කතරගම පුදබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- විවිධ පුදපූජා පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.
- විවිධ ජාතීන්ගේ සිරිත් විරිත් හා පුදපූජා විධි අගය කරමින් කතා කරයි.
- විවිධ ජාතීන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

ඇමුණුම 1

කතරගම දී පුදනු ලැබූ ස්කන්ධ කුමාර දෙවි පසු කලක කතරගම දෙවියන් නමින් ප්‍රසිද්ධියට පත් වූ අතර, රුහුණු පුරවරයේ ආරක්ෂකයා මෙන් ම බුදු දහමේ ආරක්ෂකයා වශයෙන් කටයුතු කරන්නේ ද කතරගම දෙවියන් යැයි විශ්වාස කෙරේ. එබැවින් කතරගම දෙවියෝ ද්‍රවිඩ ජනයා විසින් ද බෞද්ධ ජනයා විසින් ද පුදනු ලබති.

බෞද්ධ සාහිත්‍යයට අනුව බෞද්ධ දේව ගණයට කතරගම දෙවියෝ ද ඇතුළත් වූහ. පසු කාලීන ව ලංකාවේ ආරක්ෂකයා බවට පත් ව ඇතැයි ද විශ්වාසයක් පවතී.

**කතරගම දේවාලය**

ජන ප්‍රවාදය හා මහාවංසය අනුව මේ දේවාලය සාදවා ඇත්තේ දුටුගැමුණු රජතුමා ය. දේවාලය කොටස් හෙවත් ගබඩා දෙකකින් යුක්ත ය. වන්දනාමාන සඳහා පැමිණෙන බැතිමතුන්ට ඇතුළු විය හැක්කේ පිට ගබඩාවට පමණි. එය ඉහළින් කොළ අතු එල්ලා මැස්සක ස්වරූපයෙන් පන්දලමක් සකස් කර ඇත. ප්‍රධාන දොරටුවට ප්‍රවේශ විය යුත්තේ එම පන්දලමට යටිනි. දේවාලයේ ප්‍රධාන දොරටුව පිත්තල කැටයමින් අලංකාර කරන ලද විශාල උළුවස්ස සහිත ය. ඉන් ඇතුළු වන කොටස හඳුන්වන්නේ පිට ගබඩාව යනුවෙනි. පිටත ගබඩාව හින්දු සහ ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ගොඩ නගා ඇත. ලී කණු, කුලුනු හිස් සහිත ව නිමවා ඇත.

දේවාලයෙහි ඇතුළු ගබඩාවට පිවිසෙන දොරටුවෙහි බිත්ති දෙකකින් වට වූ ස්ථානයක් වෙයි. වට්ටාරම නමින් හඳුන් වන එම ස්ථාන 'ආලත්ති අම්මලා' යනුවෙන් හඳුන් වන කාන්තාවන් විසින් ආලත්ති පූජාව පවත්වනු ලැබේ. ගබඩාවට ඇතුළු වන ස්ථානයේ පැරණි ගෘහ නිර්මාණ අංගයක් වන කොරවක්ගල දක්නට ලැබේ. කතරගම දෙවියන්ගේ රූපය සිතුවම් කරන ලද තිරයකින් දේවාලයේ දොරටුව ආවරණය වෙයි.

**කතරගම දේවාලයේ සේවා මඬුල්ල**

මෙම දේවාලයෙහි ලොකු කුඩා සියලු කටයුතු කිරීම සඳහා පත් කරන ලද සේවා මඬුල්ලක් සිටින අතර ඈත අතීතයේ සිට ම මෙම සේවා මඬුල්ල එදිනෙදා සේවාවෙහි නිරත වෙයි.

දේවාලයේ දිවා රෑ ආරක්ෂාව සඳහා සේවාකාරයෝ 18 දෙනෙක් ද කපුරාලලා 12 දෙනෙක් ද ආලත්ත්ති පූජා සඳහා කාන්තාවෝ 24 දෙනෙක් ද දේවාලයට ඇත් ගොව්වෝ 4 දෙනෙක් ද අය බදු ගැනීම සඳහා මොහොට්ටි ලේකම් කෙනෙක් ද දෙවියන්ට යාඥා කිරිම සඳහා හා වියවුල් බේරීමට එක් කෙනෙක් ද පෙරහැර සංචාරයේ දී අවුල් වළක්වා ගැනීමට නිලමේවරු එක් කෙනෙක් ද දෙවියන් වැඩමවීම සඳහා බස්නායක නිලමේ කෙනෙක් ද ආදි වශයෙන් සේවා කරුවෝ සේවයේ යෙදී සිටිති. මෙම සේවා කරුවන්ට නියමිත දේවකාරි කටයුතු තල්පතක ලියා දේවාලයේ ලේකම් (ලේඛන) සාදවා ඇත.

**ඇමුණුම 2**

**කතරගම දේවාලයේ පුද සිරිත්**

**ගෙවදීම**

මෙහි 'ගෙවදීම' යනු දේවාලයේ කටයුතු සඳහා පත් කිරීමයි. මේ සඳහා බස්නායක, බෙත්මේවරුන්, අදිකාරම්, ලේකම් කපුරාලලා යන අයගෙන් සැදුම්ලත් නිලධාරි මඬුල්ලක් වෙයි. මහා සංඝරත්නයේ සෙත් පිරිත් මධ්‍යයේ ගෙවදීම සිදු කෙරේ.

තෝරා පත් කර ගන්නා නවක සේවාකරු සිය රාජකාරිය අරඹන්නේ දේවාලයේ නැකත් කරු විසින් නියම කරනු ලබන නැකතකට අනුව ය. ගෙවදීමට සූදානම් වූ සේවාකරු පළමුවෙන් ම තැම්බූ දෙහි හිසේ තවරා ශරීරයේ කහ පැන් වත් කොට මැණික් ගඟෙහි ජලයෙන් ස්නානය කෙරේ. අනතුරු ව රන් කෙන්දෙන් කන් විද තෝඩු පලඳයි. ඉන් අනතුරු ව නව වැඳුම කළ යුතු වෙයි.

**නව වැඳුම**

දේවාලයට ඇතුළු වන දොරටුව අබියස ද දේවාලය මැද දී ද තිරය සමීපයේ දී කෙරෙන මෙම වැඳුම කෙරෙන්නේ එක්තරා පිළිවෙළකට ය. දකුණු කකුල පෙරට තබා තෙවරක් ද දෙකකුල් එකට තබා ගෙන තෙවරක් ද, උක්කුටියෙන් හිඳ ගෙන තෙවරක් ද වශයෙන් වැඳීම නව වැඳුම නම් වේ.

**මුළුතැන් බෑම**

දෙවියන් සඳහා ආහාර සැපයීම මුළුතැන් බෑම (මුරුතැන්) යනුවෙන් අදහස් කෙරේ. දිනකට තුන්වරක් දෙවියන් උදෙසා ආහාර පූජා කිරීම දක්නට ලැබේ. මෙම කාර්යය සඳහා මුළුතැන් ගෙය නමින් ගෙයක් ද වෙයි. මුළුතැන් ගෙන ඒම සඳහා මණ්ඩය යනුවෙන් හඳුන්වන කදකි. අඩි පහක් පමණ දිගැති ලීයක දෙකොණෙහි රෙදිවලින් සකසන ලද ඔලගු දෙකක් ගැට ගැසීමෙන් 'මණ්ඩය' සකසා ඇත. මෙම මණ්ඩය මුළුතැන් ගෙහි සිට දේවාලය වෙත ගෙන එනු ලබන්නේ කදකිනි. එය ගෙන ඒම තේවාව කරන කපුරාලට පැවරෙන කාර්යයකි.

මුළුතැන් සකස් කරන්නේ එදින ම කාන්තාවන් විසින් වී ලාස් 5ක් කොටා සකස් කරනු ලබන සහල් උපයෝගි කර ගෙන ය. එක් වේලක් සඳහා හාල් සේරු තුනක් යොදා ගැනේ. සෙනසුරාදා උදෑසන මුළුතැන් පූජාව සිදු නො කෙරේ. එදින උදේ නානු මුරය පවත්වනු ලැබේ. නානුමුර චාරිත්‍රය ඉටු කිරීම (දිය නෑම) සඳහා සෙනසුරාදා උදය යොදා ගනියි.

මේ (ආහාර) පිසන්නා විසින් සුදු මුඛ වාඩමකින් සැරසී ආහාරය පිසිනු ලබයි. මෙම ආහාරය බෙදනු ලබන්නේ එක්තරා පිළිවෙළකට ය. බුද්ධ පූජාව සඳහා රන් පාත්‍රය ද දේවා පූජා සඳහා මණ්ඩය ද මේ පිසින්නාගේ බඳුන ද ආහාර බෙදන මේසය මත පිළිවෙළින් තබනු ලැබේ. අනතුරුව බුද්ධ පාත්‍රයට එක් හැන්දක් ද දේව මණ්ඩයට හැඳි තුනක් ද තමන්ගේ පිඟානට එක් හැන්දක් ද වශයෙන් තෙවරක් ආහාර බෙදනු ලැබේ. දේවාල භූමියෙහි පිහිටි කිරි වෙහෙරට බුද්ධ පූජාව පිළිගැන්වීමෙන් අනතුරු ව කපුරාල දේව පූජාව රැගෙන යයි.

මුළුතැන් කදෙහි එක් මණ්ඩයක බත් ද අනෙක් මණ්ඩයෙහි ව්‍යඤ්ජන ද තබා සකස් කෙරෙන මුළුතැන් අඩුක්කුව උඩු වියන් පාවඩ හා හේවිසි සහිත ව දේවාලය තුළට ගෙන යනු ලැබේ. මේ අවස්ථාවේ සියලු ම තේවාකරුවන් දේවාලයෙහි සිටීම අනිවාර්ය වේ.

**නානුමුර මංගල්‍යය**

බුදුන් උදෙසා පවත්වන පූජා විධියකි. නානුමුරය හෙවත් නෑවීම කෙරෙන්නේ බෝධියයි. රජවරුන්ගේ නියමය මත දෙවියන් සතුටු කිරීම සඳහා බෝධියට දක්වන උපහාරයකි. මේ සඳහා අවශ්‍ය ජලය ගෙන එනු ලබන්නේ ආලත්ති අම්මලා විසිනි. මැණික් ගඟින් ගෙන එනු ලබන ජලයට සුවඳ ද්‍රව්‍ය මුහුකොට හේවිසි නාද මධ්‍යයේ මුඛ වාඩමින් සැරසුණු කපුරාල බෝධිය කරා ගෙන ගොස් බෝධිය නාවයි.

**කාවාඩි පූජාව**
**කාවාඩි පූජා වර්ග 5කි.**

1. පරවි කාවාඩි
2. භක්ති කාවාඩි
3. ගිනි කාවාඩි
4. කිරි කාවාඩි
5. මත්ස්‍ය කාවාඩි

කාවාඩි පූජාව හා සම්බන්ධ කාවාඩියෙහි උපත පිළිබඳ ජනප්‍රවාදයක් පවතී. සුර අසුර යුද්ධයේ දී දෙවියනට ප්‍රතිවිරුද්ධ වූ සූරපද්ම නම් අසුරයා සමග කළ සටනින් පැරදුණු හිඩම්බේශ්වර, අගස්ති ඍෂිවරයා වෙත ගොස් සැඟවී තමාට ජීවිත දානය ලබා දෙන මෙන් කඳ කුමරුගෙන් ඉල්ලා සිටියේ ය. ශිවගිරි හා සප්තගිරි නමැති කඳු දෙක ඔසවා ගෙන ධ්‍යාන ක්‍රීඩාවෙහි යෙදෙන්නේ නම් එය කර දෙන බව අගස්ති ඍෂිගේ පිළිතුර වූයෙන් යථෝක්ත කඳු දෙක දණ්ඩක දෙකළවර බැඳගත් හිඩම්බේශ්වර, ධ්‍යාන ක්‍රීඩාවෙහි යෙදෙන්නට විය. එක් අවස්ථාවක දී ශරීර කෘත්‍ය සඳහා එය බිම තැබූ පසු යළි එය ඔසවන්නට නො හැකිවීම නිසා විමසිලිමත් වූ හිඩම්බේශ්වරට දකින්නට ලැබුණේ කුඩා කොලුවකුගේ වේශයෙන් ස්කන්ධ කුමාර සැඟවී සිටින බව ය. සටන නැවතත් ඇරඹිණ. හිඩම්බේශ්වර මරුමුවට පත් විය. එහෙත් අගස්ති ඍෂිවරයාගේ ඉල්ලීම නිසා ස්කන්ධ කුමාර හිඩම්බේශ්වරට පුනර්ජීවය ලබා දී තමාගේ සෙන්පති ධූරයට පත් කර ගත්තේ ය. කාවාඩි පූජාව ඇරඹුණේ මේ සිද්ධිය සිහිපත් කිරීමට යැයි විශ්වාස කෙරේ.

## 23. පුවත්පත් ලිපි හා සඟරා ලිපි

**නිපුණතාව** : 8.0 **භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි නිර්මාණාත්මක ව අදහස් ඉදිරිපත් කරමින් ලියයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- සඟරාවක හා බිත්ති පුවත්පතක මූලික ලක්ෂණ වෙන් වෙන් ව විස්තර කරයි.
- මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කරයි.
- ආකර්ෂණීය ලෙස කරුණු ඉදිරිපත් කරයි.
- බිත්ති පුවත්පත් හා සඟරා සඳහා ලිපි ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- එදිනෙදා පුවත්පත් හා ප්‍රකාශන හඳුන්වා දෙන්න.
  මෙම පුවත්පත් හා ප්‍රකාශන අතර දිනපතා ප්‍රවෘත්ති පත්‍ර, අධ්‍යාපනික පුවත්පත්, වාර සඟරා, වාර ප්‍රකාශන, පත්‍රිකා ආදිය දක්නට ලැබෙන බව පැහැදිලි කරන්න.
- විශේෂ ලේඛනයක් ලෙස බිත්ති පුවත්පත හඳුන්වා දෙන්න.
- එවැනි ලේඛන සඳහා ලිපි ලිවීමේ දී පාඨක ආකර්ෂණය ලබාගත හැකි වන පරිදි ලිවිය යුතු බව පෙන්වා දෙන්න.
- උචිත මාතෘකා හඳුනා ගැනීමේ හැකියාව තිබිය යුතු බව දන්වන්න.
- ලිපි ලිවීමේ දී ආකර්ෂණීය රචනා ශෛලියක් මෙන් ම වාංමාලාවක් ද භාවිත කළ යුතු බව පහදන්න.
- ඒ සඳහා සාම්ප්‍රදායික යෙදුම් සහිත වාක් සම්ප්‍රදාය භාවිත කළ හැකි බව පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්:**

- සති, මාසික, ත්‍රෛමාසික, වාර්ෂික ආදි වශයෙන් පළ වන සඟරා
- විශේෂාංග ලිපි (පුවත් පත්)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ විශේෂාංග ලිපි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ක්ෂේත්‍ර යටතේ ලියවුණු ලිපි ලේඛන අගයමින් කතා කරයි.
- ආකර්ෂණීය ලෙස භාෂාව භාවිත කරයි.
- පාඨක අවධානය දිනා ගත හැකි වන අයුරින් ලිපි ලේඛන සකස් කරයි.

# 24. තේරවිලි කවි

**නිපුණතාව** : **1.0** **සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : **1.3** විවිධ සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- තේරවිලි, ටීකා සීපද වෙන් වෙන් ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තේරවිලි කවිවලට සවන් දී පිළිතුරු ප්‍රකාශ කරයි.
- තමන් දන්නා තේරවිලි කවි හා පිළිතුරු කවි ප්‍රකාශ කරයි.
- තේරවිලි කවි  හා ටීකා සීපදවලට සවන් දී රස විඳියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ''**කටු වානෙන් කෙටුවා වැනි මලේ සැටි**'' තේරවිලි කවිය ගායනය කොට එම කවියෙන් ප්‍රකාශ වන ව්‍යංග්‍යාර්ථය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඇමුණුම 1 යොදා ගන්න.
- එවැනි සාහිත්‍ය නිර්මාණවලින් ගැමියන්ගේ නිර්මාණ ශක්තිය හා බුද්ධිමත් භාවය ඉස්මතු වන අයුරු පෙන්වා දෙන්න.
- ටීකා සීපදය තුළ සිව්පද කවියක් ඇතුළත් වන බවත් සීපදයේ එක් පදයකට අනතුරු ව දිගු විස්තරයක් ඉදිරිපත් කෙරෙන බවත් පැහැදිලි කරන්න. එම විස්තරය ටීකාව ලෙස හඳුන්වන බවත් පෙන්වා දෙන්න.
- ඇමුණුම 2හි ඇතුළත් ටීකා සීපදය ඒ සඳහා උපයෝගි කර ගන්න.
- ටිකා සීපදවලින් ගැමියන්ගේ නිර්මාණශීලී බවත්, හාස්‍යය රසයත් ඉස්මතු වන බවත් පැහැදිලි කරන්න.
- තේරවිලි කවි හා පිළිතුරු කවි එකතු කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න. මෙම ක්‍රියාකාරකම ක්‍රීඩාවක ස්වරූපයෙන් පැවැත්වීමට සැලසුම් කරන්න.
- තේරවිලි කවි සහිත පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- අප්‍රකට ජන කවි සංග්‍රහය - පී. ඇම්. සේනාරත්න

**ඇගයීම හා තක්සේරුකරණය** :

- ටීකා හා තේරවිලි කවිවල ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තේරවිලි කවිවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- ටීකා සීපදවලින් ඉස්මතු වන රසය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විනෝදය සඳහා ටීකා හා තේරවිලි කවි ඉදිරිපත් කරයි.

ඇමුණුම 1

| | | |
|---|---|---|
| කටුවානෙන් කෙටුවා වැනි කොළේ | සැටී | (අන්නාසි) |
| රතු නූලෙන් ගෙතුවා වැනි මලේ | සැටී | |
| තුන් මස පිරෙන කොට කුකුළෙක් විතර | සිටී | |
| මෙතුන් පදේ තේරූ අය රටක් | වටී | |
| ඉඟටිය කපා දැම්මත් පැළ වෙනවා | මේ | |
| පහටිය කපා දැම්මත් පැළ වෙනවා | මේ | |
| මැද කෑල්ල කන තැනකට යනවා | මේ | |
| අන්නක්කා ගෙඩියට කීව ද මා | මේ | |

| | | |
|---|---|---|
| ඇදල | ගත්තා | (ගිනි කූර) |
| දමලා | ගැහුවා | |
| මලක් | පිපුණා | |
| මල | පරවුණා | |

| | | |
|---|---|---|
| දික් දිගට කොළ | ඇති | (උක් ගස) |
| ඒ මැදට ගැට | ඇති | |
| කන්නන්ට රස | ඇති | |
| දෙන්නන්ට ලොබ | ඇති | |

අත්තක් උඩ බුම්මාගෙන
කටු රෙද්දක් පොරවාගෙන
නාකි වෙලා කඳුළු සලන
ලියක් සිටී තෝරනු මැන

අත්තක එල්ලිලා ඉන්න
කටු පිපිලා පැසී ඉඳුණ
කොස් හෙරලිය නම් වහරන
වැල ගෙඩියකි සුවඳ හමන

ගසට නමකි ගස මළ කල වෙන නම කී
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නම කී
මදයට නමකි මද කන විට වෙන නම කී
මෙතුන් පදේ තෝරාලා කියන් ස කී

ගසට ගොයම වෙයි මළ විට පිදුරු වෙ ති
සුඹුලට දහයියා ඇටයට වී කිය ති
මදයට හාල් කියමින් එය බතට ක ති
මෙතුන් පදේ තේරුම මේ විලස වෙ ති

ඇමුණුම 2

**ටීකා සීප ද**

බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා - ඉද්දවැල්
තිබෙන්නා පොහොට වැල් තිබෙන්නා නොයෙක් වැල්
තිබෙන්නා එයින් එකක් ගෙනල්ලා වෙළුවා සේ ම -

වෙළි වෙළි වෙළී ඉස සිට දෙපතුළට වෙළී
කන්දේ ගියා මලක් සොයා ගන්නට කියා නාමල්
තිබෙන්නා සපුමල් තිබෙන්නා පිච්චමල් තිබෙන්නා
එයින් එකක් ගෙනල්ලා පැලැන්දා සේ ම
මලි මලි මලී නුඹෙ කොණ්ඩේ තිබෙන මලී

වතුරේ ගියා රැලක් බලා ගන්ට කියා - මුහුදු රැල
තිබෙන්නා ගංගා රැල තිබෙන්නා වැව් රැල තිබෙන්නා
එයින් එකක් රිස්සෙන් බැලුවා සේ ම
රැලි රැලි රැලී නුඹෙ නරුපටෙ තිබෙන රැලී

වෙන රටේ ගැනු කොල්ලෝ හතර - පස් දෙනා
නාවා කවා පොවා ගෙන බලා ගෙන ඉන්නවා
මේ නැම්බිට අතකොළුවක් විතර නැති කොලුවා
බලා ගැනීමට බෑ කියන්නා සේ ම -
ලොලි ලොලි ලොලී බාලොලි ලොලි බාල ලොලී

## 25. පරාස්ස නාට්‍ය

**නිපුණතාව** : 11.0 **රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.**

**නිපුණතා මට්ටම** : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට නාට්‍යයට පාදක වූ කතා පුවත හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට නාට්‍යයේ පෙළ කියවා රස විඳියි.
- නාට්‍යයේ ඇතුළත් ප්‍රාදේශීය ව්‍යවහාර හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය කොටසේ ඇතුළත් චරිත වෙන් වෙන් ව හඳුනා ගෙන චරිත ලක්ෂණ ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පරාස්ස' නාට්‍යයට පාදක වූ ජන කතාව පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මෙම නාට්‍යය රචනා කර ඇත්තේ ඒ. පී. ගුණරත්න මහතාගේ 'රන් කැකිර හා තවත් කතා' පොතෙහි එන ගමරාල සහ යකා නම් වූ කතාව ඇසුරෙන් බව පැහැදිලි කරන්න.
- ඇමුණුම 1හි ඇතුළත් ගමරාල සහ යකා ජන කතාව ඇසුරෙන් එම නාට්‍යය සඳහා පාදක වූ අත්දැකීම් ක්ෂේත්‍රය ගැන සාකච්ඡා කරන්න.
- එම ජන කතාවේ අත්දැකීම් ක්ෂේත්‍රය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මෙහි දැක්වෙන්නේ අදාළ නාට්‍යයේ ආදර්ශ කොටසක් බැවින් සම්පූර්ණ නාට්‍ය පිළිබඳ අවබෝධය ලබා දීමට පියවර ගන්න.

**ගුණාත්මක යෙදවුම්:**

- පරාස්ස - රෝහණ දන්දෙණිය
- රන් කැකිර සහ තවත් කතා - ඒ. පී. ගුණරත්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාට්‍ය පෙළ කියවා අදහස් ප්‍රකාශ කරයි.
- නාට්‍යයෙන් හඳුනා ගත් අත්දැකීම් ඉදිරිපත් කරයි.
- නාට්‍ය කියවා රස විඳියි.
- රසාස්වාදය සඳහා විවිධ නාට්‍ය පෙළ ඇසුරු කරයි.

**ඇමුණුම 1**

## ගමරාල සහ යකා

එකමත් එක ගමක එක ගමරාල කෙනෙක් හිටියා. මේ ගමරාල එක දවසක් අලුතෙන් හේනක් කොටන්ට හොඳ තැනක් බල බලා මූකළානේ තනියම ඇවිද ගෙන ඇවිද ගෙන ගිහින් එක මහ කෝන් ගහක් මුල නතර උණා. නතර වෙලා වට පිට බලා ''යකෝ හේනකට නම් මීට වඩා හොඳ තැනක් ආයෙ හොයන්ට බෑ'' කියලා ''අද හොඳ දවස, අද ම වැඩ අල්ලා ගියොත් හොඳා'' කියල කැත්ත අතට ඇරගෙන ඒ ළඟ ම තිබුණ දෙමට පඳුරු දෙක තුනක් කපා පෙරළුවා.

මෙතන තිබුණ මේ කෝන් ගහේ බොහෝ ම කාලෙක ඉඳලා එක යකෙක් වාසය කළා. මේ වෙලෙ මේ ගමරාල කී කතාව අහගෙන හිටිය යකා බය ගත්තා. මොක ද? හේන කෙටුවොත් මේ කොන් ගහත් එක්ක කපා දානවා නැත්නම් ගිනි ලනවා. එතකොට යකාගෙ වාස ඉවර යි. ඉතින් ඒ ගමන මේ යකා ගහෙන් බැහැලා ඇවිත් ගමරාලට පිං සෙණ්ඩු වෙලා කීවා, ''අනේ ගමරාලහාමි, මෙතන හේනක් කෙටුවොත් මේ මගෙ විමානෙ විනාස වෙනවා. ඒක නිසා මෙතන හේන කොටන්නෙ නැති ව ඉතිරි කරනවා නම් මම ගමරාලහාමිට දෙපෝයකට වරක් හාල් මාලු තුනපහේ ගෝනියක් ගෙනත් දෙන්ට බාර ගන්නවා'' කියා.

ඒ ගමන ගමරාල ඇහුවා ''උඹ කවු ද යකෝ? කියලා. මේ ගමරාල කොයියම් ම කෙනෙකුට උණත් කතා කරන්නෙ ''යකෝ'' කියලා තමයි. ඉතින් ගමරාල මෙහෙම ඇහුවා ම කෝන් ගහේ යකා බොහො ම යටත් විදියට කිවුවා ''ගමරාලහාමි මම තමයි මේ කෝන් විමානෙ ඉන්න යකා'' කියලා.

ඉතින් ගමරාල කිවුවා ''හොඳයි එහෙනං ඒ කතාව උඩ මම මෙතන හේනක් නො කොටා ඉන්නම්, හැබැයි, කතාව ඒ හැටියට ම ඉස්ට කරන්නට ඕනැ''

ඉතින් කෝන් ගහේ යකාත් එදා පටන් හැම දෙපෝයකට ම වරක් හාල් මාලු තුනපහේ ගෝනියක් ගිහින් ගමරාලගෙ ගෙදර දමලා එනවා. ඔහොම කලක් යනකොට මේ ගමරාල අඩුපාඩුවක් නැති පොහොසතෙක් උණා. යකා ගෙනත් දෙන කළමනා හින්දා.

ඔන්න එක දවසක් මේ කෝන් ගහේ යකා ගමරාලගෙ ගෙදරට දෙන හාල් මාලු තුනපහේ ගෝනියක් කරේ තියාගෙන කැලේ මැදින් එනකොට මගදි තව යකෙක් හම්බ උණා. ඒ ගමන අර අනිත් යකා ඇහුවා ''මේ කළමනා ගෝනියක් කරේ තියාගෙන කොහෙ ද මේ යන්නෙ?'' කියලා.

එතකොට අර කෝන් ගහේ යකා කීවා ''අනේ යකෝ, මං මේ වචනයක් ඉස්ට කරන්නට යනවා. එක දවසක් ගමරාල ඇවිත් මයෙ විමානෙ තියන තැන හේනක් එළිකරන්නට තැනුවා. එවෙලෙ ම කියා හිටියා එතැන හේන එළි නො කර අරිතොත් දෙපෝයකට වරක් හාල් මාලු තුන පහේ ගෝනියක් ගෙනැත් දෙනව කියා. අන්න ඒ කළමනා ගෝනිය යි මා මේ ගෙන යන්නෙ'' යි කියලා.

එතෙන්දි අර අනික් යකා කීවා, උඹ හරි මෝඩ යකෙක් නේ. මේ කොහෙවත් නැති ගමයකුට අල්ලස් දෙන්නෙ මම නං ඔය ගමයාව මරා දානවා කියලා ඉතින් මේ කෝන් ගහේ යකා කිව්වා ''පුළුවන් නම් මාත් කැමතිය බැරිවා මිසක්'' කියලා.

''හොඳයි එහෙනං උඹ අද විතරක් ඔය කළමනා ගෙනිහින් දීපන්. මම හෙට ගිහින් ඔය ගමයා මරනවා'' කියලා.

''අන්න හොඳයි, එක හොඳ වැඩේ. ඒ උණත් දැන් මේක මම ගිහින් දීලා එන්නම්'' කියලා කොන් ගහේ යකා ඒ කළමනා ගෝනිය ගමරාලගෙ ගෙදරට ගිහින් දුන්නා.

ඔන්න පහුව දා අර හපන්කම් කියාපු හපන් යකා ගියා ගමරාලගෙ ගෙදරට යන කොට ගමරාල ගෙදර නෑ. හේනට ගිහින්. ඉතින් මේ යකා කළේ මොක ද ''ගෙදර එන්නෙ නැතෑ''කියලා ගෙයි ඇඳ යට හැංගිලා හිටියා.

ඔහොම හුඟක් වෙලා ඉන්න කොට ඉර මුදුනේ මද්දහනේ ගමරාල ගෙදර ආවා. ගමරාලත් කරේ තිබුණ උදැල්ල ඇරගෙන සද්ද හිටින්ට මිදුලෙ හප්පලා එතැන තියලා කටේ තිබුණ බුලත් හපේත් අතට ඇරගෙන දුරට විසි කරලා ගෙට ගොඩ උණේ. ''අද නං යකෙක් කන්ඩ බඩගිනි යි'' කියාගෙන යි.

ගම මායියා තව ම පොල් ගානවා ඉතින් ගමරාලට බොහොම බඩගිනි යි කීවා ම ගම මායියාට සිහි උණා ඇඳ යට තිබුණ වැවර ගෙඩිය. සිහිවෙලා කුස්සියෙ ඉඳගෙන ම කීවා ''ඕං එහෙනං ඇඳ යට ඇති. කැත්ත ඔය දොර මුල්ලෙ'' කියලා.

ගමරාල තේරුම් ගත්තා මේ කීවෙ වැවර ගෙඩිය ගැන විත්තිය. තේරුම් අරගෙන දොර මුල්ලට අත පොවලා කැත්ත අතට ඇර ගෙන ඇඳ යටට කර බාලා කැත්ත ඇඳ යටට දික් කළා කැත්තෙන් කොටලා වැවර ගෙඩිය මැත් කර ගන්ට.

එතකොට අර ඇඳ යට හිටිය හපන් යකා පණ බයේ ගැහෙන්ට උණා. මොක ද? ගමරාල ''යකෙක් කන්ඩ බඩගිනි යි'' කීවා ම ගම මායියා කීවා. ''ඕං එහෙනං'' ඇඳ යට කියලා. යකා හිතුවා දෙන්නා දෙමාල්ලෝ එකතු වෙලා යකා මරා ගෙන කයි කියලා. ඉතිං ගමරාල ඇඳ යටට කරබාන කොට ම ඇඳ යට හිටිය යකා බයෙන් ගැහි ගැහී කීවා. ''අනේ, හාමුදුරුවනේ මා මරන්ට එපා. මමත් මාසෙකට වරක්, කියන දෙයක් ගෙනත් දෙන්නම්'' කියා.

එතකොට ගමරාල ඇහුවා ''තෝ කොහේ ඉඳලා ආපු එකෙක් ද යකෝ?'' කියලා.

ඒ ගමන ඒ යකා කීවා ''මම කෝන් විමානෙ ඉන්න යකාගෙ යාළුවෙක් ගමරාලහාමිට තව මොනවා ද ඕනැ කියා අහ ගෙන යන්ට යි ආවෙ. ඕනැ දෙයක් කීවා ම ගෙනත් දෙන්නම්'' කියා.

එතකොට ගමරාල කීවා ''හොඳයි එහෙනං අර ලොකු බිස්ස පිරෙන්ට වී ගෙනත් දාපන්, බිස්සෙ වී අඩු වෙන ගානෙ ආයෙ ආයෙ ගෙනත් පුරවාපන්. හැබැයි, මේ කාරිය නොවරදා ම ඉස්ට කරන්ට ඕනා'' කියලා.

ඒ ගමන හපන් යකාත් ''හොඳමයි ගමරාලහාමි වරද්දන්නේ නෑ. මම දැන් ගිහින් එන්නම්'' කියලා යම්තම් පණ බේරා ගෙන ගියා.

රන් කැකිර හා තවත් කතා - ඒ. පී. ගුණරත්න

## 26. නාට්‍ය පිටපත් රචනය

**නිපුණතාව** : **12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- නාට්‍ය සඳහා උචිත අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නාට්‍යෝචිත අවස්ථා උචිත පරිදි පෙළ ගස්වයි.
- සරල නාට්‍ය පිටපත් රචනා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නාට්‍ය යන සාහිත්‍යාංගය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- විවිධ නාට්‍ය ඇසුරෙන් ඒ සඳහා පාදක කර ගෙන ඇති අත්දැකීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නරි බෑනා, පරාස්ස වැනි නාට්‍ය සඳහා ජනකතා පාදක කර ගෙන ඇති ආකාරය පෙන්වා දෙන්න.
- නාට්‍ය රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න. ඒ සඳහා ඇමුණුම යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නරි බෑනා - දයානන්ද ගුණවර්ධන
- පරාස්ස - රෝහණ දන්දෙණිය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාට්‍ය පෙළ රචනය සඳහා උචිත කතා වස්තු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- උචිත පරිදි භාෂාව හසුරුවයි.
- නාට්‍ය පිටපත් රචනය කරයි.

**ඇමුණුම :**

**නාට්‍ය පිටපත් රචනය සඳහා උපදෙස් :**

- නාට්‍ය පිටපත් රචනයේ දී ප්‍රස්තුත චරිත වම් පස කෙළවර දැක්විය යුතු ය.
- චරිත නාමයට පසුව තිත් දෙකක් යෙදිය යුතු ය. ඉන් අනතුරු ව සංවාදය ආරම්භ විය යුතු ය.
- නාට්‍ය රචකයාගේ මනසෙහි ඇති වන නිර්මාණාත්මක අදහස් වේදිකාව තුළින් ප්‍රදර්ශනය විය යුතු හෙයින් ඊට යෝග්‍ය පරිදි අවශ්‍ය උපදෙස් නාට්‍ය නිෂ්පාදකයාට ලබා දිය යුතු ය.
- ඒ සඳහා රංග විධාන නාට්‍ය පිටපතේ ඇතුළත් කළ යුතු බව.
- සම්පූර්ණ කතාව ම නාට්‍යයකින් ඉදිරිපත් කිරීම අපහසු බව.
- එම කතාවෙහි නාට්‍යමය අවස්ථා පමණක් තෝරා ගත යුතු බව.
- ප්‍රාණවත් දෙබස් නාට්‍ය සඳහා යොදා ගත යුතු බව.
- දෙබස් උචිත පරිදි කෙටි වීම නාට්‍යයේ ප්‍රාණවත් බව ආරක්ෂා වීමට හේතු වන බව.
- නාට්‍යයේ භාෂාව නළු නිළියන්ගේ අංග චලන ඇඳුම් පැලඳුම් හා වේදිකා සැරසිලි යෝග්‍ය පරිදි යොදා ගත හැකි බව.

# 27. ප්‍රවෘත්ති

**නිපුණතාව** : 1.0 **සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- ප්‍රවෘත්ති ප්‍රකාශයක ස්වරූපය හඳුනා ගෙන විස්තර කරයි.
- ප්‍රවෘත්ති ප්‍රකාශයට සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.
- මතකයේ තබා ගත් කරුණු අවස්ථාවට උචිත පරිදි භාවිත කරයි.
- ආදර්ශ ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ප්‍රවෘත්තිවලට සවන් දීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- ඒ අනුව ප්‍රවෘත්තියට හොඳින් සවන් දීමට හුරු වීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- ප්‍රවෘත්ති ප්‍රකාශයට සවන් දීමේ දී එක් වරක් පමණක් සවන් දීමට ලැබෙන හෙයින් ප්‍රවෘත්ති නිවැරදි ව ග්‍රහණය කර ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- ප්‍රවෘත්ති ප්‍රචාරයකට සවන් දීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පැහැදිලි කරන්න.
- ඒ සඳහා ඇමුණුම භාවිත කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක්

**යෝජිත පැවරුම් :**

- දිනපතා ප්‍රචාරය වන ප්‍රධාන ගුවන් විදුලි ප්‍රවෘත්ති නිවේදනය කෙරෙන එක් වේලාවක් තෝරා ගෙන (පෙ.ව. 6.00, ප. ව. 12.45 සවස 6.00 ට, රාත්‍රී 9.00) ප්‍රවෘත්තිවලට සවන් දී එම ප්‍රවෘත්ති මතකයෙන් පොතක ලියා ගෙන පැමිණීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ගුවන් විදුලි ප්‍රවෘත්තිවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ ප්‍රවෘත්ති මතකයෙන් ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කරයි.

ඇමුණුම

- ගුවන් විදුලියෙන් ප්‍රවෘත්ති විකාශය වන කාල සටහන පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය.
- කිසිවෙකුටත් බාධාවක් හිරිහැරයක් නො වන පරිදි ප්‍රවෘත්තිවලට සවන් දීමට යොමු විය යුතු ය.
- ප්‍රවෘත්තිවල සිරස්තල හා අදාළ විස්තර කෙරෙහි අවධානයෙන් සවන් දිය යුතු ය.
- ප්‍රවෘත්ති ඉදිරිපත් කරන විලාස අනුව එහි ආකර්ෂණීයත්වයත් තීව්‍රත්වයත් හඳුනා ගත යුතු ය.

## 28. විරාම ලකුණු

**නිපුණතාව** : **4.0** **ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : **4.1** විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- විරාම ලකුණු නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- විරාම ලකුණු උචිත පරිදි යොදමින් ලේඛනයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විරාම ලකුණු යන්න හඳුන්වා දෙන්න.
- විරාම ලකුණු පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය පිරික්සන්න. තිත, කොමාව ආදි විරාම ලකුණු යෙදෙන අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කරමින් තිත් තුන, තිත් හතර, වරහන්, කාක පාදය ආදි ලකුණු යෙදෙන අවස්ථා නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. ඒ සඳහා ඇමුණුම යොදා ගන්න.
- සුදුසු අභ්‍යාස භාවිත කරමින් නිවැරදි ව විරාම ලක්ෂණ යොදා ලිවීමට යොමු කිරීම සඳහා සුදුසු අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල ලේඛන ව්‍යවහාරයඃ උපදේශ සංග්‍රහය(2014) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විරාම ලකුණු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී විරාම ලකුණු භාවිත කිරීම අගය කරයි.
- නිවැරදි ව හා නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීමේ දී විරාම ලකුණු යෙදීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- විරාම ලකුණු උචිත පරිදි භාවිත කරමින් ලේඛන නිවැරදි කරයි.

ඇමුණුම

විරාම ලකුණු යනු ලේඛනයේ දී අර්ථවත් ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගැනෙන සංකේතයි.

**තිත් පෙළ**
**තිත් තුන** (. . .)

- උද්ධෘත පාඨයක මුලින් හෝ මැදින් හෝ කොටසක් අත් හළ බව දැක්වීම සඳහා තිත් තුන යෙදේ.

උදාහරණ

– . . . කතා කරන්නට දනගත් අවධියේ සිට ව්‍යාප්ත වූ එක්තරා ජනශ්‍රැති විශේෂයකි.
**ජනකතා 1 ජාතික අධ්‍යාපන ආයතනය**
– මානව භාෂාවෙහි දක්නට ලැබෙන ... නාම පද යන නමින් හැඳින්වෙයි.
**නාම පද නිර්මාණය - ජේ. බී. දිසානායක**
– යම් අදහසක් අවධාරණය කිරීම සඳහා තිත් තුන යෙදේ.
අනතුරුව මහා නිහඬ බවක් . . . ගුප්ත බවක් . . . අවිනිශ්චිතතාවක් . . . ඇති විය.

- තිත් හතර . . . .
ලේඛනයක අග කොටසක් අත්හල බව දැක්වීම සඳහා තිත් හතර ( . . . . ) යෙදේ.

උදාහරණ ඃ

- භාෂාව යනු කිසියම් අර්ථයක් අන්‍යයන් සමග හුවමාරු කර ගත හැකි වන පරිදි ඒකරාශී වූ . . . .
**සන්නිධි - හඳමාමා ස්වර්ණ ජයන්ති ලිපි සරණිය**

- කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ තෝනිගල සෙල්ලිපිය පිළිබඳ ව කවුරුත් අසා ඇත. එයින් දැක්වෙන කෙටි අදහස නම් . . . .
**සිංහල ශිලාලේඛන -ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න**

**වරහන්**
විකල්ප ව්‍යවහාරය දැක්වීමේ දී යෙදේ.

**සරල වරහන් (          )**

උදාහරණ
එතුමා උත්තර භාරතීය රාගධාරී සංගීතය පිළිබඳ (දක්ෂිණ භාරතීය සංගීතයෙන් ද නිදසුන් පාමින්) අගනා දෙසුමක් කළේ ය.
**සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය**

අක්ෂර, අංක ආදිය ආශ්‍රයෙන් අනුපිළිවෙළ, කොටස් ආදිය දැක්වීම සඳහා යෙදේ.

**උදාහරණ**

ඉංග්‍රීසි භාෂාවේ සම්මතය අනුව ලොකු අකුරු යෙදිය යුතු අවස්ථා හතරක් ඇත.

(අ) වාක්‍යයක ආරම්භයේ දී

(ආ) පද්‍ය රචනාවක පේළියක් ආරම්භයේ දී

(ඇ) සංඥා නාමයක් ආරම්භයේ දී

(ඈ) මාස හා දින නාම ආරම්භයේ දී

**සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය - ජේ. බී. දිසානායක**

මේ සඳහා යොදා ගත හැකි මාධ්‍ය තුනකි

(1) පුවත් පත්

(2) ගුවන් විදුලි

(3) රූපවාහිනී

**සඟල වරහන්**

වරහන් තුළට ඇතුළු විය යුතු ප්‍රකාශනයක ම සරල වරහන් සහිත පාඨයක් පවතින කල්හි මුළු ප්‍රකාශනමය ඇතුළු කොට යෙදේ.

**උදාහරණ**

{විද්‍යාඥයාගේ අදහස් වූයේ වැග්න(ර්) Wagner විසින් ඉදිරිපත් කරන ලද මහාද්වීප ප්ලාවිත කල්පිතය Theory of continental Drift) තවදුරටත් තහවුරු කිරීම ය.}

**සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය**

## 29. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | **9.0** | **සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.** |
| **නිපුණතා මට්ටම** | : | **9.5** | විවිධ නායකයන්ගේ චරිත කථා පරිශීලනය කරයි. |
| **කාලච්ඡේද** | : | 4යි. | |

**ඉගෙනුම් පල :**

- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ගුණානන්ද හිමියන්ගේ චරිත ලක්ෂණ ප්‍රකාශ කරයි.
- උන් වහන්සේගේ උදාර අදහස් හා ජාතික හා ආගමික මෙහෙවර අගය කරමින් කතා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- මෙරට ආගම් හා ජනවර්ගවලට අයත් වූ ජාතික වීරවරයන් පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් විශේෂයෙන් ම ආගම රැක ගැනීම වෙනුවෙන් ඉදිරිපත් වූ යතිවරයෙක් වශයෙන් හඳුනා ගැනීමට සලස්වන්න.
- උන් වහන්සේගේ චරිතය පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න. ඒ සඳහා ඇමුණුම සහ පෙළපොතේ පාඩම යොදා ගන්න.
- ස්වකීය ආගම වෙනුවෙන් උන්වහන්සේ කැප වී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ චරිත කතාව කියවීමට යොමු කරන්න.
- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ පහත සඳහන් ජීවන තොරතුරු ඉදිරිපත් කරන්න.
  මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ජන්ම ලාභය ලැබූ ප්‍රදේශය
  - මව
  - පියා
  - ගිහි කල නම
  - පැවිදි වීම
  - අධ්‍යාපනය
  - ආගමික හා සමාජ මෙහෙවර (විවාද, වෙහෙර විහාර ගොඩනැංවීම, බෝධිරාජ සමිතිය මගින් බෝධීන් වහන්සේලා ආරක්ෂා කිරීම, බෞද්ධ පාඨශාලා ආරම්භ කිරීම.)
  - උන්වහන්සේගේ අපවත්වීම.
    (ඇමුණුම ඇසුරු කර ගන්න.)
- මොහොට්ටිවත්තේ ගුණානන්ද චරිතාපදානය ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- මොහොට්ටිවත්තේ ගුණානන්ද අපදානය - විමල් අභයසුන්දර (1994)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.
- ගුණානන්ද හිමියන්ගේ ආගමික සේවාව අගය කරමින් කතා කරයි.
- වීරවරයකු වශයෙන් හඳුනා ගෙන තොරතුරු රැස් කරයි.
- මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ අගය ප්‍රකාශ කරයි.

ඇමුණුම

## මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි

තමන් ඉදිරියට පැමිණි හැම කටයුත්තක දී ම පසුබට නො වී ක්‍රියා කිරීමෙන් විජය ප්‍රතිලාභය හිමි කර ගන්නා පුද්ගලයා වීරයා ලෙස සලකනු ලැබේ. උත්සාහය ස්වකීය ජන්ම දායාදය කොට ගත් ප්‍රශංසනීය උදාර ගුණ සමුදායයෙන් ජීවිතය පරිපූර්ණත්වය පත් කර ගත් වීර පුද්ගලයකුගෙන් ලෝකයාට සිදු වන මෙහෙය මෙතෙකැ යි පමණ කළ නො හැකි ය.

ධර්ම වීර, යුද්ධ වීර, දාන වීර යනුවෙන් වීරයෝ තිදෙනෙක් වෙති. ස්වකීය ධර්මයෙන් සමස්ත ලෝකයා අභිෂේක කිරීමෙහි ලා ජීවිතය කැප කොට ධෛර්ය සම්පන්න ව ක්‍රියා කරන්නා ධර්ම වීරයා ය. මහා බෝධිසත්ව චරිත ධර්ම වීර ලක්ෂණයන්ගෙන් යුක්ත ය. යුද බිමට පැමිණි සතුරු හමුදාවන් අභිමුඛයෙහි අභීත ව නැගී සිට විජය ශ්‍රී ලාභය තෙක් සටන් කරන්නේ යුද්ධ වීරයා වේ. ස්වකීය ශරීරයෙහි ලෙහෙ මස් පවා අන්‍යයන් වෙනුවෙන් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වන්නා දාන වීරයා ලෙස සලකනු ලැබේ. අපේ ජාතික ඉතිහාසය විමසා බලත් ම කලින් කල පහළ වූ වීරෝදාර පුද්ගලයන්ගේ ශ්‍රී නාමයන් රන් අකුරින් සටහන් වී ඇති බව පෙනේ. සිංහල ජාතියත් සම්බුද්ධ ශාසනයත් පරිහානි ප්‍රපාතයට වැටී ඝනාන්ධකාරයෙන් වැසී පැවැති කාලපරිච්ඡේදයන්හි පුනරාලෝකය ඇති කිරීමෙහි පුරෝගාමී වූ ගිහි පැවිදි ශ්‍රේෂ්ඨ පුරුෂයන් හඳුනා ගැනීමත් උපහාර දැක්වීමත් උසස් ගුණයක් ලෙස අගය කළ හැකි ය. ඔවුන්ගේ චරිත කතා අනාගත ලෝකයාට මඟ පෙන්වීමකි.

1815 මාර්තු 2 දා, වසර දහස් ගණනක් නිදහස් රාජ්‍යයක් ව පැවති ලංකාව සිංහල කොඩිය වෙනුවට බ්‍රිතාන්‍ය කතිර කොඩිය නැංවීමෙන් පරාධීනත්වයට පත් විය. ජාතික වහල් බවට පත් වීමත් සමග ම ජාතික භාෂාව වෙනුවට ඉංගිරිසියට මුල්තැන ලැබිණ. බෞද්ධාගමට ලැබිය යුතු තැන ක්‍රිස්තියානි ආගමට හිමි විය. ජාතික සංස්කෘතිය යටපත් වී සංකර සංස්කෘතිය ව්‍යාප්ත වන්නට පටන් ගත්තේ ය. සිංහල ජාතියත් මාතෘ භාෂාවත් සම්බුද්ධ ශාසනයත් අධිරාජ්‍යවාදී සතුරන්ගෙන් මුදා ගැනීම පිණිස ගිහි - පැවිදි වීරෝදාර නායකයෝ පෙරමුණ ගෙන ක්‍රියා කළහ. එසේ ක්‍රියා කළ නායකයන් අතර වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන්ගේ ශ්‍රී නාමය ද ඉතිහාසයට එක් වී ඇත.

ශ්‍රී බුද්ධ වර්ෂ 2377 හෙවත් ක්‍රි. ව. 1823 දක්ෂිණ ලංකාවේ බලපිටියේ මොහොට්ටිවත්ත නම් ගම් පියසෙහි උපත ලැබුවේ ය. ගුණානන්ද හිමි ළමා කාලයේ ම හුරුබුහුටි පෙනුමෙන් නැණ නුවණින් චතුර කථිකත්වයෙන් ළමා සමාජයෙහි කැපී පෙනුණ පුද්ගලයෙක් විය. ස්වකීය ජන්මභූමියට ආසන්නයෙහි පිහිටි අන්‍යාගමික දේවස්ථානයක රෝමානු කතෝලික පූජකවරයකුගේ ඇසුරෙන් බයිබලය හා ක්‍රිස්තියානි ධර්මය මැනැවින් උගත් මොහු පසු ව ප්‍රදේශයේ එවක සම්භාවනීයත්වයට පාත්‍ර ව සිටි ධර්මවිනයධර භික්ෂූන්වහන්සේගේ ආශ්‍රයට පත් විය. එ මගින් බුද්ධ ධර්මය පිළිබඳ ව මනා දැනුමක් ලබා ගත්තේ ය. ස්වකීය විෂය පථයට යොමු වූ ක්‍රිස්තියානි ධර්මයක් බුද්ධ ධර්මයත් විචාරාත්මක ව සංසන්දනය කර බැලූ මෙතුමාට සත්‍ය ධර්මය කුමක් දැයි අවබෝධ විය.

උපතින් විසි වයසට පැමිණි මේ පුණ්‍යවන්ත පුද්ගලයා දොඩන්දූවේ කුමාර මහා විහාරස්ථානයෙහි පැවති මහා පුණ්‍යෝත්සවයකට සහභාගි වී දින ගණනක් එහි නතර ව සිටින අවස්ථාවෙහි ඉමහත් ශ්‍රද්ධාධ්‍යාශයෙන් මෙහෙයවන ලද කුසල චිත්තයෙන් සම්බුද්ධ ශාසනයෙහි පැවිදි බව ලබන්නට අදහස් පහළ විය.

තෙලිකඩ හාමුදුරුවෝ යන නමින් ප්‍රසිද්ධ ධර්මධර විනයධර මහා ස්ථවිරයන් වහන්සේ වෙතින් පැවිදි බව ලබා ගත් ගුණානන්ද තරුණ ස්ථවිරයන් වහන්සේ පැවිදි වූ දිනයේ තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහි අගනා ධර්ම දේශනාවක් පැවැත් වූහ. ධර්ම ශ්‍රවණය සඳහා පැමිණි දහස් ගණන් බෞද්ධ ජනතාව ඉමහත් ප්‍රසාදයට පත් වූ හ. ගුණානන්ද ස්වාමීන් වහන්සේ පිළිබඳ අනාගත බලාපොරොත්තු ඇති කර ගත් ඔවුහු උන්වහන්සේගේ කැපකරු දායකයන් බවට පැමිණියහ.

කලක් ගත වූ උන්වහන්සේ කුමාර මහා විහාරයෙන් අස්ව කොළඹ කොටහේනේ දීපදුත්තමාරාමයේ නේවාසිකත්වයට පැමිණියහ. ජීවිත පූජාවෙන් ශ්‍රී සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරගත යුතු ය යන උදාර අධ්‍යාශයෙන් යුක්ත ව බුද්ධ ධර්මය පිළිබඳ ව්‍යක්ත සාරගර්භ දේශනා පවත්වමින් ජනතාවට පරම සත්‍ය ධර්මය කුමක් දැ යි කියා දීමෙහි උත්සුක වූ හ. දිගු කලක පටන් බුදු දහමට විරුද්ධ ව පොත පත පළ කළ, දේශනා පැවැත් වූ ක්‍රිස්තු භක්තිකයන්ගේ මිථ්‍යා මතවල නිස්සාරත්වය පැහැදිලි කර දෙමින් ගුණානන්ද හිමියන් පැවැත් වූ දේශනා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමෙහි සමත් විය.

මෙම වකවානුවෙහි කොළඹ නගරයේ බෞද්ධ ජනතාවටත් භික්ෂූන් වහන්සේටත් ක්‍රිස්තු භක්තිකයන්ගෙන් මහත් හිරිහැර ගැහැට විඳින්නට සිදු වී තිබිණ. බෞද්ධාගමික චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමේ නිදහස පවා අහිමි ව පැවතිණ. බුද්ධ ධර්මය හා බෞද්ධාගමික සිරිත් - විරිත් අන්‍යාගමිකයන්ගේ අපහාසයට හා උපහාසයට ලක් විය.

සත්‍ය මාර්ගය, සත්‍ය ප්‍රකාශනය, ලක්මිණි කිරුළ, ක්‍රිස්තියානි වාද විඝාතනිය, රිවිරැස යන ප්‍රසිද්ධ පත්‍ර මාර්ගයෙන් හා දහස් ගණන් ධර්ම පත්‍රිකා පළ කිරීමෙන් සිංහල ජාතියත් බුද්ධාගමත් පිළිබඳ විරුද්ධවාදීන්ගේ මිථ්‍යා මත බිඳ හෙළමින් අනල්ප සේවාවක් කළ ගුණානන්ද හිමියෝ ප්‍රසිද්ධ වාද කිහිපයක ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළහ.

බද්දේගම වාදය

1865 වර්ෂයේ පෙබරවාරි මාසයේ බෞද්ධ ක්‍රිස්තියානි දෙපක්ෂය අතර ලියකියවිලි මගින් මෙම වාදය කළ බව සඳහන් වේ. බද්දේගම විහාරස්ථානයෙක වැඩ විසූ සුමංගල නම් කුඩා භික්ෂූන් වහන්සේ නමක් හා ක්‍රිස්තියානි පූජකවරයකු අතර ඇති වූ වාද කථාවක් මෙම වාදයට මුල් විය.

උදන්විට වාදය

සතර කෝරලයේ උදන්විට විහාරස්ථානයෙහි දී කළ වාදයකි. 1866 පෙබරවාරි මාසයේ ඇති වූ මෙම වාදයට බෞද්ධ පක්ෂය වෙනුවෙන් මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා තිස් නමක් පමණ ද ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් ජෝන් ඇඩ්වඩ් හුනුපොළ නිලමේ ප්‍රමුඛ පිරිසක් ද සහභාගි වූහ. මැවුම්කාරයා, ගැලවුම්කාරයා හා සදාකාලීන ස්වර්ගය යන ප්‍රධාන කාරණා තුනක් මෙම වාදයට අරමුණු විය.

ගම්පොළ වාදය

1871 ජූනි මාසයේ ගම්පොළ පාසලක දී ඇති වූ මෙම වාදයේ බෞද්ධ පක්ෂයට ගුණානන්ද හිමියෝ සහ බටුවන්තුඩාවේ පඬිතුමා ප්‍රමුඛ පිරිස ද ක්‍රිස්තියානි පක්ෂයට කාර්ටර් පූජකතුමා ප්‍රමුඛ පිරිස ද සහභාගි වූහ.

**පානදුර වාදය**

වර්ෂ 1873 අගෝස්තු 26, 28 දෙදින පානදුරේ දී පැවැත්වුණ මෙම වාදයේ බෞද්ධයන්ගේ පක්ෂයෙන් වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන් වහන්සේත් ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් දාවිත් ද සිල්වා පූජකතුමාත් ක්‍රියා කළහ. මෙය ඉතා වැදගත් ඓතිහාසික වාදයක් ලෙස සලකනු ලැබේ. පානදුර වාදයේ දෙපක්ෂයෙන් ඉදිරිපත් කළ කරුණු සාරාංශය ඉංගිරිසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කරවා මහජනයා අතර බෙදා හරින ලදි. ඉන් පිටපතක් ඇමෙරිකානු ජාතික පීබල් මහතාට ගාල්ලේ දී කියවන්නට ලැබී එය ඇමෙරිකාවට ගෙන ගොස් පිටපත් දහස් ගණනක් මුද්‍රණය කොට ඇමෙරිකාවේ ප්‍රචාරය කරන ලදි.

සෙන්පති හෙන්රි ඕල්කට් මැතිතුමන්ට මෙයින් පිටපතක් ලැබී කියවා බලා ඉතාමත් ප්‍රසාදයට පත් ව බෞද්ධයනට විජයග්‍රහණය ලබා දුන් මෙම ජයභූමිය බැලීම විශේෂ කාරණයක් ලෙස සලකා 1880 දී ලංකාවට සම්ප්‍රාප්ත විය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ ආරම්භයත් ලක්දිව නොයෙක් පළාත්වල බෞද්ධ පාඨශාලා පිහිටුවීමත් නිසා බෞද්ධ ජනතාව අතර නව ප්‍රබෝධයක් ඇති කිරීමට ඕල්කට්තුමන්ගේ සේවාව මහත් පිටිවහලක් විය.

විදේශයන්හි පවා බුදු දහම ව්‍යාප්තවීමට මෙම පානදුරා වාදය හේතු වූ බව මෙයින් පැහැදිලි වේ. පානදුරා වාදයේ දී මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන් වහන්සේට උපදෙස් දීම් ආදියෙන් උපකාර කළ පිරිස අතර අතිගරු හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, වැලිගම ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ පානදුරේ ගුණරත්න තිස්ස මහා ස්ථවිරපාදයන් වහන්සේ ද දායක පිරිස අතර කොර්නේලිස් පෙරේරා, කරුණාරත්න අප්පුහාමි සහ පී. ජෙරමියෙස් දියෙස් මහත්මා ද විශේෂයෙන් සිහිපත් කළ යුතු ය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු වරින් වර මිථ්‍යාලබ්ධිකයන්ගෙන් බුදුසසුන පරිහානියට පත් කිරීම පිණිස ප්‍රබල විරුද්ධ ව්‍යාපාර පැවැති බව ශාසන ඉතිහාසයෙන් පෙනේ. ඒ එක් එක් අවස්ථාවන්හි පහළ වූ මොග්ගලී පුත්ත තිස්ස, නාගසේන ආදි පැවිදි උත්තමයන් මිථ්‍යාදෘෂ්ටි වාද මර්ථනය කොට සම්බුද්ධ ශාසන චිරස්ථිතිය සඳහා උපස්ථම්භක වූ අයුරු ප්‍රකට ය. ඉංගිරිසි අධිරාජ්‍යවාදීන්ගේ බලය ද උපයෝගි කොට ගෙන ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීමෙන් බෞද්ධ බලය බිඳ හෙළීමට ක්‍රියා කළ ද දහනව වන සියවසේ වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන්ගේ පහළ වීම නිසා බුදුසසුනේ ආරක්ෂාවත් අභිවෘද්ධියත් සඳහා ඉටු වුණු මෙහෙය සකල බෞද්ධ ජනතාවගේ ම ගෞරවයට පාත්‍ර විය යුතු ය. අනුස්මරණය කළ යුතු ය.

1890 සැප්තැම්බර් 21 දින සැට සත් වසක් ආයු වළඳා මේ ශ්‍රේෂ්ඨ බුද්ධපුත්‍රයන් වහන්සේ ලංකාවාසී සකල බෞද්ධ ජනතාව ම සංවේගයට පත් කරමින් අපවත් වී වදාළ සේක.

- පූජ්‍ය හොරණ වජිරඥාන හිමි

පූජිත ජීවිත
පළමු වෙළුම (1989) - අධ්‍යාපන සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

# 30. පද බෙදා ලිවීම

**නිපුණතාව** : 4.0 **ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- පද බෙදා ලිවිය යුතු බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සංඛ්‍යා අක්ෂර මගින් ලියා දැක්වීමේ දී ස්ථානීය අගය දැක්වෙන පද වෙන් කොට ලියයි.
- සංඛ්‍යාවක් ඉලක්කමින් දක්වන විට ඊට සම්බන්ධ වන අක්ෂරය ඉලක්කම හා එකතු කර ලියයි.

.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- යම් සංඛ්‍යාවක් ලිවීමේ දී ක්‍රම දෙකක් අනුගමනය කළ හැකි බව පෙන්වා දෙන්න.
  - සංඛ්‍යා ඉලක්කමෙන් දැක්වීම
  - සංඛ්‍යාව අක්ෂරවලින් ලියා දැක්වීම
- සංඛ්‍යාවක් ඉලක්කමෙන් දැක්වීමේ දී එම සංඛ්‍යාව හා සම්බන්ධ වන අක්ෂර ඉලක්කම හා එකතු කර ලිවිය යුතු බව පැහැදිලි කර දෙන්න.

යම් සංඛ්‍යාවක් අකුරෙන් ලියා දක්වන විට

| | | |
|---|---|---|
| 25 | - | විසි පහ |
| 150 | - | එකසිය පනහ |
| 2751 | - | දෙදහස් හත්සිය පනස් එක |
| 45426 | - | හතළිස් පන්දහස් හාරසිය විසි හය |

| | | |
|---|---|---|
| 2ක් | - | මට රුපියල් 2ක් දෙන්න. |
| 10ක් | - | අපට රුපියල් 10ක කඩල දෙන්න. |
| 100කට | - | මට පොත රුපියල් 100කට ගත හැකියි. |
| 3න් | - | ඔය දොඩම් ගෙඩි 3න් එකක් මට දෙන්න. |

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015 ) - ජාතික අධ්‍යාපන ආයතනය
- පද බෙදීම (සිංහල රීතිය - 9) - ජේ. බී. දිසානායක

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- සංඛ්‍යාවාචී පද ලිවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු ඉදිරිපත් කරයි.
- ඉලක්කමින් සංඛ්‍යා දැක්වීමේ දී එම සංඛ්‍යා හා සම්බන්ධ වන අක්ෂර ඉලක්කම හා එක් කොට ලියයි.
- සංඛ්‍යා අකුරෙන් ලිවීමේ දී ස්ථානීය පද වෙන් කොට ලියයි.
- සංඛ්‍යා ලිවීමේ දී නිවැරදි ක්‍රම අවබෝධ කර ගෙන ලේඛනයේ යෙදෙයි.

## 31. ලෝවැඩ සඟරාව

**නිපුණතාව** : **9.0** **සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.**

**නිපුණතා මට්ටම** : **9.2** පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- උපදේශ සාහිත්‍යය යන්න පැහැදිලි කරයි.
- ලෝවැඩ සඟරාව හා උපදේශ කාව්‍ය පිළිබඳ ව තොරතුරු ප්‍රකාශ කරයි.
- ලෝවැඩ සඟරාවෙන් ඉදිරිපත් වන සාරධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සාරධර්මවලට අනුව ජීවිතය සකස් කර ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- උපදේශ කාව්‍ය පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් තොරතුරු විමසන්න.
- උපදේශ කාව්‍ය සාහිත්‍යය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- කෝට්ටේ යුගය හා එම යුගයේ ලියවුණු උපදේශ කාව්‍ය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පද්‍ය පන්ති ගායනය කිරීම සඳහා යොමු කරන්න.
- පද්‍යවල අදහස් ඉදිරිපත් කරන්න.
- පද්‍ය මතක තබා ගැනීමට උනන්දු කරවන්න.
- පෙළපොතේ පාඩම ඇසුරෙන් පද්‍යවල අර්ථ පැහැදිලි කරන්න.
- එම පද්‍යවලින් ප්‍රකාශිත ආදර්ශ පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රේය හිමි
- සිරිත් මල්දම - ගුරු මුහන්දිරම් ඇම්. ඇල්. සිල්වා

**ඇගයීම හා තක්සේරුකරණය :**

- උපදේශ කාව්‍ය සාහිත්‍ය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සාරධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- යහපත් සිරිත් අගය කරමින් කතා කරයි.
- එදිනෙදා ජීවිතයේ දී යහපත් පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

## 32. මුහුදු පතුල ගවේෂණය

**නිපුණතාව** : **10.0** **සාහිත්‍යයික, දාර්ශනික විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : **10.2** විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබා ගත් දැනුම භාෂා කාර්යය සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- මුහුදු පතුල ගැන ලියැවුණු ලේඛන කියවා එහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කරයි.
- ලිපිය සඳහා යොදා ගත් භාෂා ලක්ෂණ අගය කරයි.
- මුහුදු පතුළ පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත කියවයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- මුහුදු  පතුල පිළිබඳ ශිෂ්‍යයන්ගේ අත්දැකීම් හුවමාරු කර ගන්න.
- මුහුදු පතුල ද ගොඩබිම මෙන් ම ජෛව විවිධත්වයෙන් යුක්ත බව පෙන්වා දෙන්න.
- ඇතැම් ප්‍රදේශ විචිත්‍රවත් ස්වභාව සෞන්දර්යෙන් යුක්ත වන බව පෙන්වා දෙන්න.
- ඒ සඳහා ඡායාරූප, වීඩියෝ දර්ශන යොදා ගන්න.
- පෙළපොතේ පාඩම ඇසුරෙන් මුහුදු පතුල ගවේෂණය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- මුහුදු පතුල ගවේෂණ මගින් ලෝකය පිළිබඳ විවිධ තොරතුරු අනාවරණය කර ගැනීමට විද්‍යාඥයන් සමත් වී ඇති බව පෙන්වා දෙන්න.
- භාෂාත්මක යෙදුම් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- වචනවල අර්ථ දැන ගැනීමට සලස්වන්න.
- එම වචන අර්ථවත් ව වාක්‍යවල යොදවන්න.
- මෙවැනි ලේඛන කියවීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- මුහුදු පතුල පිළිබඳ ව ලියවුණු ගවේෂණාත්මක ලිපි
- මුහුදු පතුල හා සම්බන්ධ ඡායාරූප, වීඩියෝ දර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාගර ගවේෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සාගර පතුලේ හු විෂමතා පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- විශේෂිත වචන හඳුනා ගෙන පැහැදිලි කරයි.
- සාගර ගවේෂණය පිළිබඳ ව ලිපි ලේඛන සකස් කරයි.

## 33.. රචනා ලිවීම

**නිපුණතාව** : 8.0 **භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- රචනා ලිවීම සඳහා මාතෘකා තෝරා ගනියි.
- රචනා ලිවීමට උචිත කරුණු සංවිධානය කරයි.
- රචනා මාතෘකාවට අදාළ දළ සැලැස්මක් සකස් කරයි.
- රචනා ලිවීමේ දී හරවත් තොරතුරු උපයෝග කර ගනියි.
- රචනයේ ආරම්භය, මධ්‍යය හා අවසානය ගැන සැලකිලිමත් ව ලියයි.
- රචනා ලිවීමේ දී භාෂාව නිවැරදි ව භාවිත කරයි.
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් විවිධ මාතෘකා ඔස්සේ රචනා ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- වාක්‍ය රචනාවක් ලිවීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- රචනාවක් ලිවීමට අවශ්‍ය තොරතුරු සාකච්ඡා කරන්න.
- රචනා ලිවීම සඳහා සුදුසු මාතෘකා ඉදිරිපත් කරන්න.
  මාතෘකා ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරන්න.
  - අධ්‍යාපනය
  - සෞඛ්‍යය
  - සංවර්ධනය
  - සංස්කෘතිය
  - විද්‍යාව හා තොරතුරු තාක්ෂණය
  - ස්වභාව සෞන්දර්ය ආදි තේමා ඔස්සේ සකස් කරගත් රචනා මාතෘකා යොදා ගන්න.

**වාක්‍ය රචනය සඳහා උපදෙස් :**

වාක්‍ය රචනයක් ලිවීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු :

- ලේඛකයාගේ අදහස පැහැදිලි ව නිරවුල් ව ප්‍රකාශ කිරීම
- ඒවා පාඨකයාට ඉදිරිපත් කිරීම
- පාඨක අවධානය/ආකර්ෂණය ලබා ගැනීම
  - රචනයේ සෑම අදහසක් ම තර්කානුකූල විය යුතු ය.
  - නිරවුල් ව හා පැහැදිලි ව ඉදිරිපත් කළ යුතු ය.
  - සරල ව ඉදිරිපත් කළ යුතු ය.
  - රසවත් මෙන් ම ප්‍රාණවත් බවින් ද යුක්ත විය යුතු ය.
  - විචිත්‍රත්වයක් තිබිය යුතු ය.
  - රචනයෙහි රසයත් මිහිරත් ගැබ් විය යුතු ය.

- රචනය ලිවීමේ දී සරල වාක්‍ය භාවිත කිරීම
- වඩාත් දිග නොවූ වාක්‍ය භාවිත කිරීම
- ව්‍යාකරණානුකූල වීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිලිමත් වීම
- සාම්ප්‍රදායික යෙදුම්, භාෂා ප්‍රයෝග උචිත පරිදි භාවිත කිරීම
- වැදගත් ප්‍රකාශන හා උද්ධෘත උචිත පරිදි යොදා ගැනීම
- විරාම ලක්ෂණ යෝග්‍ය පරිදි භාවිත කිරීම
- උචිත පරිදි ඡේද වෙන් කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල රචනය හා සාහිත්‍යය රසාස්වාදය - පී. තේනබදු
- ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය :**

- උචිත රචනා මාතෘකා තෝරා ගනියි.
- නිර්මාණාත්මක ව රචනා ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- රචනා ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියයි.

# 34. විද්වත් දේශන

**නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : 1.5 දේශන සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- දේශනයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- දේශනයෙහි අන්තර්ගත කරුණු පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- විද්වත් දේශනවලට විචාරශීලී ව සවන් දී අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සජීව දේශන පැවැත්වෙන අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. නිදසුන් :
  - ප්‍රජා සෞඛ්‍ය වැඩ සටහන් සඳහා වූ දේශන
  - සාහිත්‍ය උත්සව පදනම් කරගත් දේශන
  - සාමය පවත්වා ගෙන යාම සඳහා වූ දේශන
- මත් ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ දේශන ආදී විවිධ දේශනවලට සවන් දීමේ අවස්ථා ඇති බව.
- එම දේශනවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා හොඳින් සවන් දීමට අවශ්‍ය බව. ඒ සඳහා පෙර සූදානමක් අවශ්‍ය බව පෙන්වා දෙන්න.

- දේශනයට සවන් දීමට නම්
  - ඒ සඳහා තමාගේ සූදානම අත්‍යවශ්‍ය වේ
  - එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ තම දැනුම
  - දැනුමට එකතු කරගත හැකි නව දැනුම
  - තොරතුරු, සංඛ්‍යා ලේඛන ආදිය ඉදිරිපත් කරන විට අවශ්‍ය දේ සටහන් කර ගැනීම.
  - අපැහැදිලි දේ නිරවුල් කර ගැනීමට ප්‍රශ්න කිරීම ආදි වශයෙන් තමා සූදානම් විය යුතු ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

- ශිෂ්‍යයන්ට ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ දේශනයකට සවන් දීමට සලස්වන්න. ඒ සඳහා සුවිශේෂ පුද්ගලයකු පාසලට ගෙන්වා ගෙන දේශනයක් පැවැත්වීම හෝ පවත්වන ලද දේශනයක හඬ පටයක්/සංයුක්ත තැටියක් හෝ යොදා ගෙන දේශනයකට සවන් දීමට සලස්වන්න. එසේ නැතහොත් පාසලේ සෞඛ්‍ය විෂය උගන්වන ගුරු භවතාගේ සේවය ලබා ගැනීම ආදි සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් දේශනයකට සවන් දීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේශනයකට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- වැදගත් තොරතුරු සටහන් කර ගැනීම අගය කරයි.
- අවශ්‍ය පැහැදිලි කර ගැනීම් සඳහා ප්‍රශ්න කරයි.
- තොරතුරු දැන ගැනීම සඳහා දේශනවලට සහභාගි වෙයි.

## 35. මාතෘකානුකූල කථා

**නිපුණතාව** : 1.0 **සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.**

**නිපුණතා මට්ටම** : 1.6 නිරවුල් ව සහ නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- මාතෘකාවට අනුව කථා කරයි.
- උචිත පරිදි හඬ පාලනය කරමින් කථා කරයි.
- කථිකත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් කතා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- මාතෘකානුකූල ව කතා කිරීමට සිදු වන අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් කරන්න.
- මාතෘකානුකූල ව කථා කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු බව පෙන්වා දෙන්න.
  - ආරම්භය
  - මාතෘකාවට අනුකූල බව
  - උචිත පරිදි හැඟීම් ප්‍රකාශනය
  - නිවැරදි උච්චාරණය
  - හඬ පාලනය
  - කාල කළමනාකරණය
  - ක්‍රමානුකූල ව අවසන් කිරීම

- මාතෘකාවට අනුව කථා කිරීමේ දී පහත සඳහන් තේමා යොදා ගත හැකි ය.
  - පරිසරය
  - ජාතික සම්පත් සුරැකීම
  - ජාතික වීරවරයෝ
  - සාරධර්ම සුරැකීම
  - මත් උවදුර පිටු දැකීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- මාතෘකාවට අදාළ ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- කාලය කළමනාකරණය කර ගනිමින් කතා කරයි.
- හැඟීම් ප්‍රකාශ කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- අවස්ථෝචිත ව මාතෘකානුකූල ව කතා කරයි.

## 36. රාජකාරි ලිපි

**නිපුණතාව** : **7.0** **භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම** : 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි.

**කාලච්ඡේද** : 4යි.

**ඉගෙනුම් පල :**

- රාජකාරි ලිපියක මූලිකාංග නම් කරයි.
- රාජකාරි ලිපි හා පෞද්ගලික ලිපි අතර ඇති වෙනස පැහැදිලි කරයි.
- යෝග්‍ය ආකෘති හඳුනා ගෙන රාජකාරි ලිපි ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- රාජකාරි ලිපි පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසා බලන්න.
- රාජකාරි ලිපි කුමක් ද යන්න නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- රාජකාරි කටයුතු සඳහා හුවමාරු වන ලිපි කිහිපයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න. එහි ආකෘතිය පැහැදිලි කරන්න.
- රාජකාරි ලිපියක ආකෘතියක් පුවරුවක ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා ඇමුණුම 1හි ආකෘතිය යොදා ගන්න.
- ලිපි ලිවීමේ දී ආකෘති දෙකක් භාවිත කළ හැකි බව ඇමුණුම 1හි ඇති ආකාරය සාම්ප්‍රදායික ක්‍රමය අනුගමනය කරමින් දකුණු පස ඉහළ කොටසින් ආරම්භ කරන ලිපිය එක් වර්ගයකට අයත් වන බව පෙන්වා දෙන්න.
- එම ආකෘතිය ශිෂ්‍යයන්ට බලා ගැනීමට පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- පරිගණක ඇසුරෙන් ලිපි ලියන විට රාජකාරි ලිපියේ ආකෘතිමය වශයෙන් වෙනසක් දැකිය හැකි බව නිදසුන් මගින් පෙන්වා දෙන්න.
  ඇමුණුම 2 ආකෘතිය යොදා ගන්න.
- එම ආකෘති පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- එවැනි ලිපි සියල්ලක් ම ආරම්භ කරන්නේ වම් පසින් බව පෙන්වා දෙන්න. ඒ අනුව සකස් වී ඇති ලිපි කිහිපයක් අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පරිගණක ආශ්‍රිත ව සකස් කරනු ලබන ලිපියේ විශේෂත්වය සාකච්ඡා කරන්න.

  – ලිපිය වම් පසින් ආරම්භ කිරීම
  – විරාම ලක්ෂණ නො යෙදීම
  – ඡේද වෙන් කිරීමේ දී ඡේදය වම් පස කෙළවරින් ආරම්භ කිරීම අත්සන වම්පසින් යෙදීම
  – මෙම ලක්ෂණ ඇතුළත් රාජකාරි ලිපි කිහිපයක් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
  – එහි අකෘතිය ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  – රාජකාරි ලිපියක් ලිවීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු බව පෙන්වා දෙන්න.
  – පැහැදිලි ව කරුණු ඉදිරිපත් කිරීම
  – එක් කරුණක් එක් ඡේදයකට ගොනු කිරීම

- විවිධ කරුණු ඉදිරිපත් කරන්නේ නම් අංක යටතේ කරුණු ඉදිරිපත් කිරීම සුදුසු බව.
- ගැටලුවකට විසඳුමක් ලබා ගැනීමට ලිපියක් ලියන්නේ නම් එම ගැටලුවේ ඉතිහාසය, ගැටලුව විසඳා ගැනීමට ගෙන ඇති පියවර එහි වර්තමාන තත්ත්වය විසඳුම  සඳහා ගත යුතු පියවර යන කරුණු ඇතුළත් විය යුතු බව පෙන්වා දෙන්න.

**ඇමුණුම**

ආකෘතිය 1

| |
|---|
| යවන්නාගේ ලිපිනය<br>දිනය<br><br>ලබන්නාගේ තනතුර හා<br>ලිපිනය<br><br>මාතෘකාව<br><br>අන්තර්ගතය (ලිපියේ)<br><br>අත්සන<br>තනතුරක් තිබේ නම් තනතුර<br>නම |

**අකෘතිය 2**

යවන්නාගේ නම හා ලිපිනය
ලිපිනය ඃ
දිනය ඃ

ලබන්නාගේ තනතුර හා ලිපිනය

මාතෘකාව

අන්තර්ගතය (ලිපියේ)

අත්සන
තනතුරක් තිබේ නම් තනතුර
නම

ඇගයීම් හා තක්සේරුකරණය ඃ

- රාජකාරි ලිපියක මූලික අංග නම් කරයි.
- රාජකාරි ලිපියක සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- උචිත ආකෘති භාවිත කරමින් රාජකාරි ලිපි ලියයි.